# ප්‍රගති වාර්තාව
# 2022



**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

# පටුන



| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| **01** | **සමාජ හා ආර්ථික පුනර්ජීවනය තහවුරු කිරීම .......** ගරු කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පණිවිඩය | **v** |
| **02** | රාජ්‍ය අමාත්‍යවරුන්ගේ පණිවිඩ | |
| **2.1** | **නව මුහුණුවරකින් හා දැක්මකින් යුතු කාන්තා හා ළමා පරපුරක්......** ගරු කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගීතා සමන්මලී කුමාරසිංහ මැතිණියගේ පණිවිඩය | **vii** |
| **2.2** | **දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් කරා පිය නගමු ......** ගරු සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍ය අනූප පස්කුවල් මැතිතුමාගේ පණිවිඩය | **ix** |
| **03** | **ළමා, කාන්තා හා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් නව්‍යකරණයට.....** කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතාගේ පණිවිඩය | **xi** |
| **04** | **හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්** | **1-2** |
| **05** | **අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය** | **3** |
| **06** | **සමාජ සවිබලගැන්වීම් අංශය** | |
| **6.1** | **දැක්ම, මෙහෙවර හා ක්‍රියාත්මක ක්‍රමවේදය** | **7** |
| **6.2** | **සංවර්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය** | **8** |
| **6.3** | **සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා ඒවායේ ක්‍රියාකාරිත්වය** | **9** |
| **6.3.1** | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) | 10 – 17 |
| **6.3.2** | සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS) | 18 – 27 |
| **6.3.3** | සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB) | 28 - 31 |
| **6.3.4.** | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD) | 32 - 37 |
| **6.3.5** | ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය (NSE) | 38 - 41 |
| **6.3.6** | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB) | 42 - 45 |
| **6.3.7** | ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) | 46 – 50 |
| **6.3.8** | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) | 51 – 53 |
| **6.3.9** | උපදේශන අංශය | 54 – 57 |
| **6.3.10** | විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති | 58 |
| **6.4** | **පාලන හා මෙහෙයුම් අංශ** | **59 – 61** |
| **07** | **කාන්තා හා ළමා කටයුතු අංශය** | |
| **7.1** | **හැඳින්වීම** | **64** |
| **7.2** | **ආයතන අනුව සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය** | |
| **7.2.1** | සංවර්ධන අංශය | 65 - 72 |
| **7.2.2** | සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය | 73 – 76 |
| **7.2.3** | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | 77 – 84 |
| **7.2.4** | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකු අරමුදල) | 85 – 91 |
| **7.2.5** | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 92 – 105 |
| **7.2.6** | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 106 – 116 |
| **7.2.7** | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | 117 – 127 |
| **7.2.8** | කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව | 128 - 136 |



## සමාජ හා ආර්ථික පුනර්ජීවනය තහවුරු කිරීම .......

සමාජ, ආර්ථික පුනර්ජීවනය තහවුරු කිරීම සඳහා රජය සතු වගකීම ඉටුකිරීම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙහි වගකීම වන අතර, ඒ සඳහා විවිධ කාර්යයන් හා කර්තව්‍යයන් පෙරදැරිකරගත් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ ගණනාවක් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සමාජයේ ආන්තිකරණයට ලක් වූ කණ්ඩායම් එනම් ආබාධ සහිත පුද්ගලයන්, වැඩිහිටි තැනැත්තන්, අඩු ආදායම්ලාභී පවුල්, කාන්තාවන්, ළමයින් හා මානසික ව්‍යාකූලතාවයන්ට පත්වූ පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණය සැලසීම අමාත්‍යාංශයේ එක් කාර්යභාරයකි.

නවීන ලෝකයේ අවශ්‍යතාවයන්ට හා ඉදිරි ගමනට ගැළපෙන අයුරින් 33%ක් පමණ වන අවු. 18ට අඩු ළමුන්ගෙන් ඵලදායී ළමා පරපුරක් ගොඩනැගීම සඳහා වැඩසටහන් දියත් කිරීම තවත් වගකීමකි.

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 52%ක් පමණ වන කාන්තාවන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කරමින් ඔවුන්ගේ වත්මන් සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම මෙන්ම කාන්තා හිංසනය වැළැක්වීම හා වින්දිත කාන්තාවන්ගේ සුබසාධනය හා සංවර්ධනය තහවුරු කිරීමේ කාර්යභාරයත් පැවරී ඇත්තේ මෙම අමාත්‍යාංශයටය.

මෙම අමාත්‍යාංශයේ ඉලක්කගත ප්‍රජාව වෙනුවෙන් සේවා සැපයීම සඳහා සක්‍රීය ලෙස මා හට සහයෝගය ලබා දෙන කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමියටත්, සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමාටත් අමාත්‍යාංශ ලේකම්තුමා හා සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කරනු කැමැත්තෙමි.

**රනිල් වික්‍රමසිංහ**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය

## නව මුහුණුවරකින් හා දැක්මකින් යුතු කාන්තා හා ළමා පරපුරක්......



ලංකාවේ සමස්ත ජනගහනයෙන් 52% පමණ වන කාන්තා පරපුරට සහ 33% වන අවුරුදු 18 ට අඩු ළමුන්ගේ උන්නතිය උදෙසා ආරක්ෂාව, අයිතිවාසිකම්, සංවර්ධනය හා සුභසාධනය තහවුරු කිරීම කේන්ද්‍ර කොට ගෙන කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ කාන්තා හා ළමා කටයුතු අංශය සුවිශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් පුළුල් ක්ෂේත්‍රයක් පුරා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ළමුන්ගේ හා කාන්තාවන්ගේ කෙටි හා දිගුකාලීන අවශ්‍යතා මෙන්ම නොවිසඳුණු ගැටලුවලට විසඳුම් ලබා දීම අපගේ ප්‍රමුඛ ප්‍රයත්නයයි. ළමා ආරක්ෂාව සඳහා 1929 දුරකථන සේවාව ක්‍රියාත්මක කිරීම, නිවාසගත දරුවන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම, මුල් ළමාවිය දරුවන් සඳහා පෝෂණ වැඩසටහන්, මනෝ සමාජයීය වැඩසටහන්, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා මුල් ළමාවිය භෞතික සම්පත් සංවර්ධනය ඇතුළු වැඩසටහන් රාශියක් මීට ඇතුළත් ය.

විශේෂයෙන්ම නව මුහුණුවරකින් හා දැක්මකින් යුතු “අත්වැල” වැනි අනුග්‍රාහක කැපකරු මාපිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළු ග්‍රාමීය මට්ටමේ දරුවන්ගේ ගැටලුවලට ඍජුව සහන සැපයීම අපෙන් ඉටුවන සුවිශේෂී කාර්යයන් ය. එතුලින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ළමුන්ගේ ඉදිරි අනාගතය සුරක්ෂිත කිරීම සඳහා සවිමත් ස්ථාවර අඩිතාලමක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් සැපයේ.

කාන්තාවන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කර ගනිමින් ඔවුන්ගේ වත්මන් සමාජ ආර්ථික තත්ත්වය සවිමත් කර ඔවුන් ඉහළ සමාජ තලයකට ඔසවා තැබීම අමාත්‍යාංශයේ කාන්තා සවිබලගැන්වීම් ක්‍රියාවලිය තුළින් සිදුවේ. ඊට අමතරව, නීති රීති හා ප්‍රතිපත්ති සම්පාදනයට අමතරව, පුහුණුව, දැනුවත් කිරීම හා කුසලතා සංවර්ධනයත්, ණය හා තාක්ෂණික සේවා සැපයීමත් නොකඩවා සිදු කෙරේ.

එමෙන්ම, කාන්තා හිංසනය වැලැක්වීම හා වින්දිත කාන්තාවන්ගේ සුබසාධනය හා සංවර්ධනය තහවුරු කිරීමටත් කාන්තාවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ අවශ්‍යතාවයන් සපුරාලීමටත්, ආයතනික රාමුව ශක්තිමත් කිරීමටත් විශේෂ පියවර ගනිමින් සිටී. ගරු ජනාධිපතිතුමන්ගේ හා රජයේ අනුග්‍රාහකත්වය යටතේ කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම, කාන්තාවන් සඳහා සුවිශේෂී පනතක් පිළියෙල කිරීම හා කාන්තා කොමිෂන් සභාවක් පිහිටුවීම කිරීම ඇතුළු ආයතනික යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයන් රැසක් ඉටු වෙමින් පවතී.

සමස්තයක් වශයෙන් තමන්ගේ අයිතිවාසිකම් හා අනාගත අපේක්ෂාවන් වෙනුවෙන් ශක්තිමත් හඬක් නැගීමට නොහැකිව ලතවෙන ආදරණීය දරු පරපුර වෙනුවෙන් හා අනේකවිධ අසාධාරණයන්ට ගොදුරු වෙමින් දුක් පීඩා කම්කටොළු මැද සිටින උත්තරීතර කාන්තා පරපුර වෙනුවෙන් ඕනෑම අභියෝගයන් මැද පෙනී සිටීම මාගේ එකම අධිෂ්ඨානයයි.

**ගීතා සමන්මලී කුමාරසිංහ**
කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය

## දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් කරා පිය නගමු...



ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් තුළින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම සඳහා ප්‍රජාව සවිබලගැන්වීම මෙන්ම ආන්තීකරණයට ලක් වූ හා අවාසි සහගත තත්ත්වයන්හි සිටින ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම අමාත්‍යාංශය හරහා සංවර්ධන වැඩසටහන් රැසක් 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත්වෙමි.

අඩු ආදායම්ලාභීන්, ආබාධ සහිත පුද්ගලයින් මෙන්ම විශේෂ සහන අවැසි ප්‍රජාව ආර්ථික හා සාමාජීය ලෙස සවිබලගැන්වීම උදෙසා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයට 2022 වර්ෂය සඳහා රු. මිලියන 108,713.70 ප්‍රතිපාදන ලැබී ඇත. එයින් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා මාසික දීමනාව ගෙවීමට රු. මිලියන 55,500ක් ද, ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික දීමනාව ගෙවීමට රු. මිලියන 4,860 ක් ද, හඳුනා නොගත් වකුගඩු රෝගීන් සඳහා රු. මිලියන 2,646.62 ක් ද, අවුරුදු 70ට වැඩි වැඩිහිටි පුද්ගලයින් සඳහා රු. මිලියන 13,550ක් ද, අවුරුදු 100ට වැඩි වැඩිහිටි පුද්ගලයින් සඳහා රු. මිලියන 33.59ක් ද වෙන්කර ඇත. එමෙන්ම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ගෘහ ආර්ථික නිෂ්පාදන ප්‍රවර්ධනය කරමින් ග්‍රාමීය ආර්ථිකය ගොඩනැගීමට දායකවීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරනු ලබයි.

තවද ආබාධ සහිත තැනැත්තන්ගේ හා වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය, පුද්ගල පෞරුෂ සංවර්ධනය තුළින් ආර්ථිකය සවිබලගැන්වීම උදෙසා ප්‍රජාව මානසික ලෙස සවිමත් කිරීම අපගේ ප්‍රධාන අරමුණු වේ.

දැනට විශ්‍රාම වැටුපක් නොලබන ජනතාව සඳහා නව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම ප්‍රවර්ධනය හා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාජ වැඩ හා සමාජ සංවර්ධනය හා සුභසාධනයට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම, ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපායන් පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා වූ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද අප අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

මේ ආකාරයට ආර්ථික අර්බුදය හමුවේ දැඩි බලපෑමකට ලක් වි ඇති ජන ජීවිතය යථාවත් කිරීම, ජාතික ආර්ථිකය ඉහල නැංවීමත් උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිසි මඟ පෙන්වීම ලබා දෙන අතිගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් ඒ සඳහා ඇප කැපවී කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කර සිටිමි.

**අනුප පස්කුවල්**

සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍ය

## ළමා, කාන්තා හා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් නව්‍යකරණයට.....



ආබාධ සහිත, වැඩිහිටි, දිළිඳු, ළමා හා කාන්තා යන ප්‍රධාන ඉලක්ක ගත කණ්ඩායම් මූලික කරගනිමින් මෙම අමාත්‍යාංශය සුවිසල් සමාජ මෙහෙවරක් ඉටු කරනු ලබන අතර 2023 වර්ෂය සඳහා අයවැය පිළිබඳ ව සාකච්ඡා කරනු ලබන මෙවන් මොහොතක මාගේ අමාත්‍යාංශය මඟින් 2022 සැප්තැම්බර් 30 දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටට පත් වෙමි. ආර්ථික ස්ථායිතාව අරමුණු කරගෙන සමාජ සවිබල ගැන්වීම උදෙසා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය ඇරඹී ඇති අවස්ථාවක දුගී බව තුරන් කර ජාතියට සමෘද්ධිය ලඟාකර දීම එම සැලසුම් ඔස්සේ ලඟාකර ගත යුතුව ඇති සුවිශේෂී අභියෝගයකි. එමෙන්ම නවීන ලෝකයේ අවශ්‍යතාවයන්ට හා ඉදිරි ගමනට ගැලපෙන අයුරින් ඵලදායි ළමා පරපුරක් ගොඩනැගීම හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය සිදුකිරීම ද එවැනිම වැදගත් කර්තව්‍යයක්ව පවතී. මෙවැනි සන්දර්භයක් තුළ ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් වලට අනුකූල වන ආකාරයෙන් අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අනෙකුත් රාජ්‍ය ආයතන වල කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රමෝපායන් සැලසුම් කොට වසර 2030 වන විට ජාතික වශයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර දීමේ වැඩපිළිවෙලක් මාගේ සක්‍රීය දායකත්වය සහිතව ගරු කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ ආරම්භ වී ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කරනුයේ ඉමහත් සතුටිනි.

මෙවන් වූ මාර්ග සිතියමක් ඔස්සේ සියලු ආයතනික කටයුතු ඉදිරියට පවත්වාගෙන යමින් මේ වන විට වාර්තා වන 14.3 ක් වූ ජනගහන දරිද්‍රතා දර්ශකය අවම කිරීමට ද, අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉහළ ආදායම් ලබන තත්ත්වයට පත් කිරීම ද ආබාධ සහිත හා වකුගඩු රෝගීන් වැනි අනෙකුත් ආන්තීකරණයට ලක් වූ ප්‍රජාව සඳහා වැඩි වැඩියෙන් සුභසාධනය හා ආරක්ෂාව සැලසීම ද, විශ්‍රාම වැටුප් නොලබන ප්‍රජාව වෙත දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම ප්‍රවර්ධනය, ළමා හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, තහවුරු කිරීම හා සුබසාධනය සිදු කිරීම අප අමාත්‍යාංශයට පැවරී ඇති රාජකාරී වපසරිය තුළ ළඟා කර ගත යුතු සුවිශේෂී අපේක්ෂිත ප්‍රතිඵල වේ. මේ සඳහා ජීවනෝපාය ව්‍යාපෘති, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ මූල්‍ය ණය සම්පාදන ව්‍යාපෘති හා ඉලක්කගත ප්‍රජාව සහභාගී කරගන්නා ව්‍යාපෘති ගණනාවක් සැලසුම්කොට මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, 2023 වර්ෂයේ ද මේ ආකාරයෙන් ඉලක්ක ගත කණ්ඩායම් වල පවතින ආර්ථික සමාජීය ගැටළු අවම කර ගනිමින් මෙම සේවාවන් ප්‍රජාව වෙත වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ලබා දීමට බලාපොරොත්තු වෙමි. මේ සඳහා ඇප කැපවී කටයුතු කරන මාගේ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, ආයතන හා අංශවල සියලුම කාර්ය මණ්ඩලයටත් නිසි මඟ පෙන්වනු ලබන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය තුමාටත් කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමියටත් සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා හා භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතාටත් මාගේ හදපිරි ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි.

**නීල් බණ්ඩාර හපුහින්න**
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# 04. හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය. මෙම අමාත්‍යාංශය සමාජ සවිලබගැන්වීම් අංශය හා කාන්තා හා ළමා කටයුතු අංශය යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක වේ. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ආයතන, අංශ හා ව්‍යාපෘති පිළිබඳවත් 2022 වර්ෂයට අදාව අනුමත වී ඇති ප්‍රතිපාදන පිළිබඳවත් 2022.09.30 දක්වා ලබාගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ඇතුලත් වේ.

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය කටයුතුවලදි තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතටපත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්විම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම

- ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම
- අනාරක්ෂිත තත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
- ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූලාධාර සැපයීම
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම
- මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම

# 05. අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

මෙම අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂයට 171 යටතේද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂ 331 යටතේද සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේද පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂ 217 යටතේද ප්‍රතිපාදන වෙන් වී ඇත.

ඒ අනුව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා අනුමත වූ මුළු ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| වියදම් වර්ගය | 2022 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය -** වැය ශීර්ෂ 171 | | | |
| ප්‍රාග්ධන | 3,664.78 | 2,639.95 | 1,024.83 |
| පුනරාවර්තන | 28,058.83 | 16,155.92 | 11,902.91 |
| **උප එකතුව** | **31,723.61** | **18,795.92** | **12,927.69** |
| **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -** වැය ශීර්ෂ 331 | | | |
| ප්‍රාග්ධන | 164.70 | 48.62 | 116.08 |
| පුනරාවර්තන | 83,203.50 | 49,472.59 | 33,730.91 |
| **උප එකතුව** | **83,368.20** | **49,521.21** | **33,846.99** |
| **සමාජ සේවා දෙපාර්තමේන්තුව** - වැය ශීර්ෂ 216 | | | |
| ප්‍රාග්ධන | 39.00 | 11.60 | 27.40 |
| පුනරාවර්තන | 786.50 | 520.64 | 265.86 |
| **උප එකතුව** | **825.50** | **532.24** | **293.26** |
| **පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව -** වැය ශීර්ෂ 217 | | | |
| ප්‍රාග්ධන | 61.15 | 42.11 | 19.04 |
| පුනරාවර්තන | 370.74 | 272.62 | 98.12 |
| **උප එකතුව** | **431.89** | **314.73** | **117.16** |
| **මුළු එකතුව** | **116,349.20** | **69,164.10** | **47,185.10** |

# 06. සමාජ සවිබලගැන්වීම් අංශය



# 6.1 දැක්ම, මෙහෙවර හා ක්‍රියාත්මක ක්‍රමවේදය

## දැක්ම (සමාජ සවිබලගැන්වීම් අංශය)

**වසර 2030 වන විට දිළිඳුකමින් හා කුසගින්නෙන් තොර ශ්‍රී ලංකාවක්**

## මෙහෙවර (සමාජ සවිබලගැන්වීම් අංශය)

**වැඩි දියුණු කළ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග, ජීවනෝපාය ආධාර, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්, රැකියා අවස්ථා, රැකියා අභිමුඛ දැනුම සහ වෘත්තීය පුහුණුව සැපයීම මගින් අවදානමට ලක් වූ ප්‍රජාව සවිබලගැන්වීම**

## ක්‍රියාත්මක ක්‍රමවේදය

සමාජයේ ජීවත්වන අවාසි සහගත තත්ත්වයන්හි සිටින පුද්ගලයින් සඳහා හිතකාමී පරිසරයක් හා අවස්ථා උදාකර දීමෙන් ඔවුන්ද සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත්කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දරිද්‍රතාවය අවම කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය සිදු කරයි. සමාජ සවිබලගැන්වීම් අංශයට අදාලව පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ ක්‍රියාත්මක වේ.

I. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
II. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
III. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
IV. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
V. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය (NSE)
VI. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
VII. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
VIII. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)
IX. උපදේශන අංශය

තවද ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහය ලබාදීමට ආයතන අංශය, ගිණුම් අංශය, සංවර්ධන අංශය, අභ්‍යන්තර විගණන අංශය, සැලසුම් සහ මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වේ.


# 6.2 සංවර්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

සමාජ සවිබලගැන්වීම් අංශයේ එක් එක් ආයතනයන්හි, සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

| ආයතනය | වැඩසටහන/ ව්‍යාපෘතිය | ප්‍රාග්ධන | | පුනරාවර්තන | |
|---|---|---|---|---|---|
| | | අනුමත වාර්ෂික ප්‍රතිපාදන (රු. මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | අනුමත වාර්ෂික ප්‍රතිපාදන (රු. මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | සවිබලගැන්වීමේ වැඩසටහන | 150.00 | 45.14 | - | - |
| | සමෘද්ධි සහනාධාර වැඩසටහන | - | - | 55,500.00 | 36,889.08 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන | 10.50 | 4.01 | - | - |
| | විවිධ හැකියාවන් සහිත පුද්ගලයන් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | - | - | 30.00 | 13.17 |
| | මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන | - | - | 1.50 | - |
| | අශක්‍යාබාධිත අරමුදල | - | - | 9.00 | 4.15 |
| | විවිධ ආබාධ සහිත දරුවන්ගේ විනෝදාත්මක කටයුතු සඳහා පහසුකම් සැලසීම | - | - | 10.00 | 3.11 |
| | විවිධ ආබාධිත සහිත සිසුන් සඳහා දෛනික දීමනාව | - | - | 25.00 | 13.22 |
| සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශය | ගම්මාන සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන | 1,350.00 | 1,185.08 | - | - |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන | 32.00 | 24.10 | - | - |
| | ආබාධ සහිත තැනැත්තන් සඳහා රු. 5,000 ජීවනාධාර ලබා දීම | - | - | 4,860.00 | 2,610.52 |
| | වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම | - | - | 8.00 | 6.00 |
| | වකුගඩු රෝගීන් සඳහා රු. 5,000/- ජීවනාධාර ලබා දීම | - | - | 2,642.62 | 1,443.78 |
| | ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා අවස්ථා ලබා දීම | - | - | 10.00 | 2.58 |
| ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය | වයස අවුරුදු 70ට වඩා වැඩි වැඩිහිටියන් සඳහා රු. 2,000/- මාසික ජීවනාධාර ලබා දීම | - | - | 13,550.01 | 7,000.20 |
| | වයස අවුරුදු 100ට වඩා වැඩි වැඩිහිටියන් සඳහා රු. 5,000/- මාසික ජීවනාධාර ලබා දීම | - | - | 33.59 | 16.37 |
| | වැඩිහිටියන් සඳහා ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහන | - | - | 50.00 | 13.89 |
| ජාතික සමාජ සංවර්ධන ආයතනය | ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදුව ප්‍රදේශයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 60.00 | 48.30 | - | - |
| | නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 20.00 | - | - | - |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | සංවර්ධන වැඩසටහන් සඳහා | 40.10 | 29.49 | - | - |
| උපදේශන අංශය | උපදේශන වැඩසටහන | 10.00 | 4.06 | - | - |
| එකතුව | | **1,672.60** | **1,340.18** | **76,729.72** | **48,016.07** |

## 6.3 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා එහි ක්‍රියාකාරිත්වය

2030 වන විට දිළිඳුකම තුරන් කිරීමේ මූලික අරමුණ ළඟාකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන පහත සඳහන් පරිදි වෙනත් රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය හා සිවිල් සමාජය සමඟ අනුබද්ධව ක්‍රියාත්මක වෙමින් පවතී.



# 6.3.1 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

### හැඳින්වීම

2017 අංක 2 දරන සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක1 දරන දිවිනැගුම පනත මගින් ස්ථාපිත මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ දිළිඳු පවුල් ලක්ෂ 18 ට සමෘද්ධි සුබසාධනය සලසමින් සමාජ ආරක්ෂණ අරමුදල මගින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1073ක් මගින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍යකරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම වේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වා ගෙනයාමත්, එම ජනතාව සමාජයීය වශයෙන් සවිබලගැන්වීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

### අරමුණු

- දිළිඳු පවුල් මිලියන 1.76 කගේ දෛනික පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා සමෘද්ධි සහනාධාර ලබා දීම.
- උපතේ සිට මරණය දක්වා වූ විශේෂ අවස්ථාවලදී ලබා දීමට නියමිතව ඇති මූල්‍ය ප්‍රතිලාභ ලබාදෙමින්, පවුල් මිලියන 1.76කගේ සමාජ ආරක්ෂණය සැලසීම.
- සමෘද්ධි සහනාධාර ලබන පවුල්වල උසස් පෙළ හදාරන දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
- සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම තුලින් එම පවුල් සවිබල ගැන්වීමට කලටයුතු කිරීම
- ප්‍රජාමූල සංවිධාන හරහා දිළිඳු පවුල් සංවිධානගත කර ඔවුන් ආර්ථික හා සාමාජීය වශයෙන් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම
- අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය මාර්ග නගාසිටුවීම හා සමෘද්ධි ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.
- දිළිඳු පවුල්වල සමාජ සංවර්ධනය ඇති කිරීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් හා සමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## උපාය මාර්ග

- දිළිඳුපවුල් මිලියන 1.7 කගේ දෛනික පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා මාසිකව ප්‍රධාන කාණ්ඩ 4ක් යටතේ (රු.4,500.00, රු.3,200.00, රු.1,900.00 හා රු.420.00 ආදී වශයෙන්) සමෘද්ධි සහනාධාර ලබාදීම.
- ඉහත දිළිඳු පවුල්වල, දරු උපත්, විවාහ, මරණ හා ළමයින්ගේ අධ්‍යාපනය යන අවස්ථාවන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම.
- සමෘද්ධි සහනාධාර ලබන පවුල්වල උසස් පෙළ හදාරන දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා එක් ශිෂ්‍යයෙකුට මසකට රු.1,500 බැගින් මාස 24 ක කාලයක් සඳහා ශිෂ්‍යත්ව ආධාර මුදලක් ලබාදීම.
- සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැළපෙන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාමූල සංවිධාන 30,211ක්, ප්‍රාදේශීය සංවිධාන 331ක් සහ දිස්ත්‍රික් සංවිධාන 25ක් පිහිටුවීම තුලින් දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කරගත් ආර්ථික හා සමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල්වල ක්ෂුද්‍ර මූල්‍ය ණය අවශ්‍යතාවයන් හඳුනාගෙන, ඔවුන් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1073 හා ප්‍රජාමූල බැංකු සමිති 331 හරහා අඩු පොලී ක්ෂුද්‍ර මූල්‍ය ණය සේවාවන් ක්‍රියාත්මක කිරීම සහ නිලධාරීන්ට ඉලක්ක ලබා දීම.
- නිවාස නොමැති දිළිඳු පවුල්වල නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා එක් පවුලකට රු. 200,000/= සිට රු. 600,000/= දක්වා මූල්‍ය ආධාරයක් ලබා දීම.
- දිළිඳු පවුල් මත් උවදුරින් බේරා ගැනීම සඳහා මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමෘද්ධි පවුල්වල දරුවන්ගේ සාක්ෂරතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම, දුප්පත් ප්‍රජාවගේ මානසික ආතතිය වැළැක්වීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි වැඩසටහන් තුලින් දිළිඳු පවුල්වල සමාජ සංවර්ධනය ඇති කිරිමට ක්‍රියා කිරීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| වියදම් වර්ගය | 2022 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු. මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 164.70 | 48.62 | 116.08 |
| පුනරාවර්තන | 83,203.50 | 49,472.59 | 33,730.91 |
| **එකතුව** | **83,368.20** | **49,521.21** | **33,846.99** |

අනෙකුත් අරමුදල්

| අරමුදල් වර්ගය | 2022 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු. මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|
| සමාජ ආරක්ෂණ අරමුදල | 3,086.26 | 1,246.40 | 1,839.86 |
| නිවාස ලොතරැයි අරමුදල | 1,633.00 | 676.63 | 956.37 |
| ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල | 40,000.00 | 20,776.77 | 19,223.23 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

**ප්‍රාග්ධන ප්‍රතිපාදන :-** සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහන

| ව්‍යාපෘති අංක 01 | ජීවනෝපාය සංවර්ධන වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 44.00ක් වෙන් කර ඇති අතර රු. මි. 3.06ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. ගෙවතු වගාව, තවාන් සහ කාබනික පොහොර නිෂ්පාදනයට සම්බන්ධ ප්‍රතිලාභීන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ අනෙකුත් සම්බන්ධීකරණ සේවා පැවැත්වීම සඳහා වැඩසටහන් 1,074ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
2. සමෘද්ධි ගෙවතු හිමියන් 140,021ක් සඳහා එළවළු බීජ ලබාදීමට සැලසුම් කර ඇත.
3. අතිරේක භෝග වගාව දිරිමත් කිරීමේ අරමුණින් සමෘද්ධි වගාකරුවන් 800ක් සඳහා යෙදවුම් ලබා දීමට සැලසුම් කර ඇත.

| ව්‍යාපෘති අංක 02 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 30.00ක් වෙන් කර ඇති අතර රු. මි. 9.03ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. පවතින සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන 4ක් වැඩිදියුණු කිරීම.
2. කාබනික ආහාර නිෂ්පාදනය පිළිබඳව පුහුණු වැඩසටහන් 7ක් පැවැත්වීම.
3. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275ක් පැවැත්වීම.
4. විශේෂ අලෙවිකරණ වැඩසටහන් 3ක් පැවැත්වීම.
5. සෞභාග්‍යා වෙළඳ ප්‍රදර්ශණය පැවැත්වීමට අදාලව වැඩසටහන් 230ක් පැවැත්වීම

| ව්‍යාපෘති අංක 03 | සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 13.00ක් වෙන් කර ඇති අතර රු. මි. 1.7ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් 6ක් පැවැත්වීම.
2. ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 19ක් පැවැත්වීම.

| ව්‍යාපෘති අංක 04 | ප්‍රජාමූල සංවිධාන වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 5.00ක් වෙන් කර ඇති අතර රු. මි. 2.50ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. ප්‍රජාමූල නායකයින් පුහුණු කිරීම හා ප්‍රජාමූල නායකයින් මගින් ප්‍රජාමූල සාමාජිකයින් පුහුණු කිරීම සඳහා වැඩසටහන් 4ක් පැවැත්වීම
2. දිස්ත්‍රික් කමිටු රැස්වීම් 25ක් පැවැත්වීම.

| වැඩපෘති අංක 05 | තොරතුරු තාක්ෂණ වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 13.00ක් වෙන් කර ඇති අතර රු. මි. 8.23ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) හරහා ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීම.
2. මානව සම්පත් කළමනාකරණ (HRM) පද්ධතිය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.
3. තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් 80ක් ක්‍රියාත්මක කරීම.
4. සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල 335ක තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
5. සියලුම සමෘද්ධි ප්‍රජා මූලික බැංකු සහ බැංකු සමිති පරිගණකගත කිරීම සිදුකරමින් පවතී.

| වැඩපෘති අංක 06 | නීති වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 0.40ක් වෙන් කර ඇති අතර රු. මි. 0.36ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. සමෘද්ධි නිලධාරීන් සඳහා නීතිමය සවිබල ගැන්වීමේ වැඩසටහන් 4ක් පැවැත්වීම.
2. ප්‍රජා මූලික බැංකු සමිති සාමාජිකයින් සඳහා නීතිමය සවිබල ගැන්වීමේ වැඩසටහන් 4ක් පැවැත්වීම.

| වැඩපෘති අංක 07 | මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 16.00ක් වෙන් කර ඇති අතර රු. මි. 13.39ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. "සමෘද්ධි උදානය" රූපවාහිනී වැඩසටහන මඟින් සමෘද්ධි බැංකු තුලින් ණය පහසුකම් ලබා ජීවිතය සාර්ථක කරගත් ප්‍රතිලාභි ප්‍රජාවගේ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වැඩසටහන් 38ක් පවත්වා ඇත.
2. සමෘද්ධි "E" පුවත්පත් 18ක් සෑම මසකම පලමු හා දෙවන සතිවල බදාදා දිනයේ දී සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අන්තර් ජාලයේ පල කර ඇත.

| වැඩපෘති අංක 08 | සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 6.00ක් වෙන් කර ඇති අතර රු. මි. 2.24ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, දිස්ත්‍රික්, ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 130ක් පැවැත්වීම හා 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යය සාධනය ඇතුලත් වාර්තාව සකස් කිරීම සිදුකර ඇත.

| වැඩපෘති අංක 09 | මානව සම්පත් සංවර්ධන වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 11.00ක් වෙන් කර ඇති අතර රු. මි. 0.75ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 3ක් පවත්වා ඇත.

| *වැඩපෘති අංක 10* | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 7.00ක් වෙන් කර ඇති අතර රු. මි. 2.00ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී ප්‍රජාවට සපයන සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් නව සමෘද්ධි ප්‍රජා මූල බැංකු 14ක් ස්ථාපිත කර ඇත.

| වැඩපෘති අංක 11 | සමාජ සුබසාධන වැඩසටහන |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 0.60ක් වෙන් කර ඇති අතර රු. මි. 0.55ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ සමෘද්ධි වැඩසටහන් තුලින් ඉහළ ආදායම් මට්ටමක් අත්කරගෙන ඇති පවුල්

ඇගයීම සඳහා රන් සහතික පරිත්‍යාග කරීමේ වැඩසටහනක් පවත්වා ඇත.

| *ව්‍යාපෘති අංක 12* | **විගණන සහ කළමනාකරණ වැඩසටහන** |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 4.00ක් වෙන් කර ඇති අතර රු. මි. 1.33ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. විගණන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පවත්වා ඇත.

**ප්‍රාග්ධන ප්‍රතිපාදන**

| **ව්‍යාපෘති අංක 01** | **සමෘද්ධිලාභී පවුල් 200,000ක් කේන්ද්‍ර කරගත් ගෘහ නේවාසික ආර්ථිකයක් හා ආශ්‍රිත ගම්මාන බල සම්පන්න කිරීමේ වැඩසටහන (අයවැය යෝජනා 2021)** |
|---|---|

2022 වර්ෂය වෙනුවෙන් රු. මි. 993ක් වෙන් වී ඇති අතර 2021 වර්ෂයේ අතැති බිල්පත් ගෙවීම සඳහා රු. මි. 353.76 වැයකර ඇත.

**පුනරාවර්තන ප්‍රතිපාදන**

| **ව්‍යාපෘති අංක 01** | **සමෘද්ධි සහනාධාර වැඩසටහන** |
|---|---|

2022.01.01 දින සිට 2022. 04.30 දින දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි සුදුසුකම්ලත් අඩු ආදායම්ලාභී පවුල් වෙත අනුමත වූ රු. මි. 55,500.00ක අයවැය ප්‍රතිපාදන මඟින් මාසිකව දීමනාව ලබා දීම සිදු කරන ලදී. ඒ අනුව ප්‍රතිලාභී පවුල් 1,760,700ක් වෙත රු. මි. 36,889.08 ක් ලබා දී ඇත.

- පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් බලපෑමට ලක් වූ අවදානම් සහිත කණ්ඩායම්වලට සහන සැලසීම සඳහා ලෝක බැංකු මූල්‍ය පහසුකම් යටතේ ඇති ආයෝජන ව්‍යාපෘතිවල අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචක වැඩසටහන (Contingent Emergency Response Components – CERC) යටතේ 2022 මැයි මස සිට ජූලි මස දක්වා අඩු ආදායම්ලාභී පවුල් හා අවදානම් සහගත පවුල් සඳහා මූල්‍යාධාර වැඩසටහනක් (Cash Transfer Program) ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, නිත්‍ය දීමනා ලබන සමෘද්ධි ප්‍රතිලාභීන්, ආබාධ සහිත පුද්ගලයන්, නිදන්ගත වකුගඩු රෝගීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අමතර දීමනාවක්ද සහිතව මාස තුනක කාලය සඳහා රු. 3,000/= සිට රු. 5,000/= දක්වා මාසික දීමනාවක් ලබාදෙන ලදී. තවද පොරොත්තු ලේඛනගතව සිටින පවුල් සඳහා ද රුපියල් 5,000 ක මාසික දීමනාවක් මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදෙන ලද අතර, ඉලක්කගත දීමනා සහ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

| මුදල් හුවමාරු කාණ්ඩය | නිත්‍ය ප්‍රතිලාභීන් සඳහා දීමනා | | | CERC ව්‍යාපෘතිය යටතේ රුපියල් 5,000 දීමනාව සඳහා අනුමත පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | එක් අයෙකුට නිත්‍ය මාසික දීමනාව (රු.) | අමතර දීමනාව (top up) සමඟ CERC ව්‍යාපෘතිය යටතේ එක් අයෙකුට මාසික දීමනාව (රු.) | නිත්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
| සමෘද්ධි දීමනාව | 1,900.00 | 5,000.00 | 1,702,603.00 | 731,975 |
| | 3,200.00 | 6,300.00 | | |
| | 4,500.00 | 7,500.00 | | |
| ආබාධ සහිත පුද්ගල ජීවනාධාරය | 5,000.00 | 7,500.00 | 72,000.00 | 62,457 |
| නිදන්ගත වකුගඩු රෝගී ජීවනාධාරය | 5,000.00 | 7,500.00 | 39,150.00 | 5,798 |
| වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව | 2,000.00 | 5,000.00 | 416,667 | 238,640 |
| සියවස් සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව | 5,000.00 | 7,500.00 | 478 | - |
| **එකතුව** | | | **2,230,898** | **1,038,870** |

මැයි මස සිට 2022.08.30 දක්වා ප්‍රතිපාදන ගෙවීම් ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හදිසි ප්‍රතිචාර සංරචක (CERC) වැඩසටහන යටතේ සිදුකර ඇත. මෙම වැඩසටහන යටතේ පොරොත්තු ලේඛණගතව සිටින සමෘද්ධි ප්‍රතිලාභී පවුල්, ආබාධ සහිත පුද්ගලයින්, වකුගඩු රෝගීන් හා වයස අවුරුදු 70 වඩා වැඩි පුද්ගලයින් සඳහාද මාසික දීමනාව ලබා දී ඇත. එම ගෙවීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| මුදල් හුවමාරු කාණ්ඩය | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| සමෘද්ධි ප්‍රතිලාභි පවුල් සඳහා මාසික සහනාධාර ලබාදීම | 10,778.30 | 1,689,461 |
| සමෘද්ධි ප්‍රතිලාභි පවුල් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 155,44.30 | 1,689,461 |
| පොරොත්තු ලේඛනගත සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 10,896.73 | 726,449 |
| **උප එකතුව** | **37,219.33** | **2,415,910** |
| ආබාධ සහිත පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 1,974.02 | 131,152 |
| වකුගඩු රෝගී පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 377.36 | 25,072 |
| වයස අවුරුදු 70 වඩා වැඩි පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 48.60 | 3,232 |
| **උප එකතුව** | **2,399.98** | **159,456** |
| **මුළු එකතුව** | **39,619.31** | **2,575,366** |

ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කරන ලද ඉහත වැඩසටහන 2022.09.01 දින සිට ප්‍රතිපාදන ගෙවීම් ආසියානු සංවර්ධන බැංකුව විසින් සිදු කිරීමට කටයුතු යොදා ඇත. එම ගෙවීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| මුදල් හුවමාරු කාණ්ඩය | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| සමෘද්ධි ප්‍රතිලාභි පවුල් සඳහා මාසික සහනාධාර ලබාදීම | - | - |
| සමෘද්ධි ප්‍රතිලාභි පවුල් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 5,148.24 | 1,682,009 |
| සමෘද්ධි ප්‍රතිලාභි පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවන | 3,623.11 | 724,622 |
| **උප එකතුව** | **8,771.35** | **2,406,631** |
| ආබාධ සහිත ප්‍රතිලාභීන් සඳහා මාසික සහනාධාර ලබාදීම | 292.13 | 58,427 |
| ආබාධ සහිත ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 52.08 | 20,830 |
| ආබාධ සහිත පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 105.94 | 21,188 |
| **උප එකතුව** | **450.15** | **79,615** |
| වකුගඩු රෝගීන් මාසික සහනාධාර ලබාදීම | 175.62 | 35,124 |
| වකුගඩු රෝගීන් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 46.90 | 18,759 |
| වකුගඩු රෝගී පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීම | 20.01 | 4,001 |
| **උප එකතුව** | **242.53** | **39,125** |
| වයස අවුරුදු 70 වඩා වැඩි වැඩිහිටියන් සඳහා මාසික සහනාධාර ලබාදීම | 661.35 | 348,081 |
| වයස අවුරුදු 70 වඩා වැඩි වැඩිහිටියන් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 618.29 | 206,098 |
| වයස අවුරුදු 70 වඩා වැඩි පොරොත්තු ලේඛනගත වැඩිහිටියන් සඳහා ගෙවීම | 558.79 | 111,578 |
| **උප එකතුව** | **1,838.43** | **665,757** |
| වයස අවුරුදු 100 වඩා වැඩි වැඩිහිටියන් සඳහා මාසික සහනාධාර ලබාදීම | 1.91 | 381 |
| වයස අවුරුදු 100 වඩා වැඩි වැඩිහිටියන් සඳහා ප්‍රතිපාදන මුදල වැඩිකිරීමෙන් පසු සහනාධාර ලබාදීම | 0.41 | 165 |
| **උප එකතුව** | **2.00** | **546** |
| **මුළු එකතුව** | **11,304.78** | **2,985,411** |

## ක්‍රියාත්මක කරන ලද වෙනත් සංවර්ධන වැඩසටහන්

- සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සමාජ ආරක්ෂණය වැඩි කිරීම සඳහා, එම පවුල්වල උපත් 9,094 ක් සඳහාත්, විවාහ 22,740 ක් සඳහාත්, රෝහල් ගතවීම් 59,925 ක් සඳහාත්, මරණ 28,997 ක් සඳහාත් සහ ශිෂ්‍යත්වලාභීන් 104,690 ක් සඳහාත් වශයෙන් මුළු පවුල් 225,446 ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම. මේ දක්වා ලබා දී ඇති සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 1,246.40ක් වේ.

- නිවාස ලොතරැයි වැඩසටහන යටතේ, රු 200,000 සිට රු. 600,000/= දක්වා වූ නිවාස ආධාර සමෘද්ධි ප්‍රතිලාභීන් 3,377 දෙනෙකු සඳහා ලබාදීම. මූල්‍ය වියදම රු.මි. 676.63ක් වේ.
- ප්‍රජාමූල බැංකු 1,073 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 331ක් මඟින් ප්‍රතිලාභීන් 240,113 ක් සඳහා රු.මි. 20,776.77 ක ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම
- තිරසර සංවර්ධන අරමුණ 08 - සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.

## ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ අභියෝග

- අස්ථාවර වෙළඳපල තත්ත්වය හේතුවෙන් නිතර නිතර භාණ්ඩ හා සේවා වල මිල අධික ලෙස ඉහළ යාම.
- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ලෝක වසංගත තත්වයන්, ආර්ථික අර්බුදයන් හා කාලගුණික හා දේශගුණික බලපෑම් ඇතිවීම
- ඉහත තත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.

# 6.3.2 සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)

## හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර ආරම්භයේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වූයේ අප රට තුළ ජීවත්වන වතු කම්කරුවන්, දිළිඳු පවුල් හා එම පවුල්වල සාමාජිකයින් විවිධ රෝගාබාධයන්ට ගොදුරු වන හා ආපදාවන්ට ලක්වන අවස්ථාවල දී මූල්‍යමය ආධාර සැපයීමයි.

ප්‍රාථමික අවස්ථාවේ පැවැති මෙම වැඩසටහන්, කාලීන අවශ්‍යතා මත යාවත්කාලීන කරමින් දෙන ලද සහනය යැපුම් මානසිකත්වයට සීමා නොකොට පුද්ගලයාගේ හෝ පවුලේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය ඇති කිරීම සඳහා පරිවර්තනය කරමින් වර්තමානයේ සමාජ සේවා විෂයභාර කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.
ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. ඒ අනුව විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා සිදු කරනු ලබයි.

විශේෂයෙන්ම ආබාධ සහිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික යහ පැවැත්ම සුරක්ෂිත කරමින් ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම උදෙසා වැඩසටහන් රාශියක් සිදු කරන අතර, ඒ අතුරින් ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (CBR), ළමා මාර්ගෝපදේශන හා කුසලතා සංවර්ධන වැඩසටහන, දෘෂ්‍යාබාධිත පුනරුත්ථාපනය හා ආබාධ සහිත පුද්ගලයන් සඳහා රැකවරණය ලබා දීම යන වැඩසටහන් ප්‍රධාන වේ.

ඊට අමතරව මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, කාලීන සමාජ ගැටළු හා ප්‍රශ්න ආමන්ත්‍රණය කරමින් විවිධ සමාජ පර්යේෂණ සිදු කිරීම යනාදී වැඩසටහන් ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර මෙකී සෑම වැඩසටහනක්,ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම තුළින්ම අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාව තුළ අවාසි සහගත තත්ත්වයන්ට පත් ජන කොටස් ස්වෝත්සාහයෙන් නගාසිටුවමින්, ජාතික සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් කිරීමයි.

## අරමුණු

- වයස අවුරුදු 16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබලගැන්වීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.
- වයස අවුරුදු 0 -16 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන්ගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.
- ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් සවිබලගැන්වීම.
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන සවිබල ගැන්වීම.
- මතට ඇබ්බැහිවූවන් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.
- විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## උපාය මාර්ග

- ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත වෙළඳපොල රැකියා වෙත යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොල හඳුනාගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීම හා පර්යේෂණ කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා ජීවිත කාලය පුරා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම
- වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රීඩා ,අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම, ඔවුන්ගේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.
    - ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා සැපයීම.

- ප්‍රාදේශිය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| වියදම් වර්ගය | 2022 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 39.00 | 11.60 | 27.40 |
| පුනරාවර්තන | 786.50 | 520.64 | 265.86 |
| **එකතුව** | **825.50** | **532.24** | **293.26** |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

**ප්‍රාග්ධන ප්‍රතිපාදන**

| ව්‍යාපෘති අංක 01 | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන |
|---|---|

ආබාධ සහිත පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් අතරත්, ඔවුන් හා ඔවුන් ජීවත් වන ප්‍රජාවේ සමාජ සංවිධාන අතරත්, සබඳතා තර කිරීම මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බලගැන්වීම හා ස්වාධීනව කටයුතු කිරීමට හැකිවන පරිදි ඔවුන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 10.50ක් වෙන්කර ඇති අතර මේ වන විට රු. මි. 4.01ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මුළු දිවයිනම ආවරණය වන පරිදි පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

1. ආබාධ සහිත පුද්ගලයින් 82 කට ආධාරක උපකරණ ලබාදීම සඳහා රු. මි. 1.53ක් වැයකර ඇත.
2. බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ස්වශක්ති සංවිධාන ඇගයීම ("ස්වාභිමානී" ජාතික සම්මාන ප්‍රදාන උත්සවයට අදාළව දිස්ත්‍රික් 24 තරඟ කටයුතු අවසන් කර ඇති අතර මේ සඳහා රු. මි. 0.35ක් වැයකර ඇත.)
3. ආබාධ සහිත පුද්ගලයින්ගේ නිෂ්පාදන සඳහා ලාංඡනයක් හඳුන්වා දී ඇති අතර එය කුඩා ව්‍යාපාර අංශයේ ලියාපදිංචිය ලබාගෙන ඇති අතර ඒ හරහා නිෂ්පාදන අලෙවි ප්‍රදර්ශනයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී.
4. ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා මේ වන විට රු. මි. 1.27ක් වැය කර රැස්වීම් 977ක් පවත්වා ඇත.
5. ආබාධ සහිත පුද්ගලයින් සඳහා විශේෂ ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා රු. මි. 0.85ක් වියදම් වී ඇත.

| ව්‍යාපෘති අංක 02 | ධාරිතා සංවර්ධනය |
|---|---|

දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනවලට අනුයුක්ත නිලධාරීන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායීතාව හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය සඳහා රු. මි. 2.00ක් වෙන් කර ඇත. මේ වන විට රු. මි

0.19ක් වැයකර වැඩසටහන් 17ක් පවත්වා ඇත.

**පුනරාවර්තන ප්‍රතිපාදන**

| ව්‍යාපෘති අංක 01 | විවිධ හැකියාවන් සහිත පුද්ගලයන් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන |
|---|---|

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන 09ක් හරහා ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම සිදු කරනු ලබන අතර, මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 55.00ක් වෙන්කර ඇත. මේ වන විට රු. මි. 26.39ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර, මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

1. ආබාධ සහිත පුද්ගලයින් 451ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම වෙනුවෙන් රු. මි. 9.50ක් වැය කර ඇත.
2. පුහුණුලාභීන්ගේ විනෝදාස්වාදය සඳහා අළුත් අවුරුද්ද හා පොසොන් පොහොය නිමිත්තෙන් වැඩසටහන් 2ක් පැවැත්වීම වෙනුවෙන් රු. මි. 0.01ක් වැය කර ඇත.
3. කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සහ ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වන විශේෂ අධ්‍යාපන ඒකක නඩත්තුව සඳහා සහාය වීම යටතේ රු. මි. 0.11ක් වැය කර එක් මධ්‍යස්ථානයකට අවශ්‍ය ආධාර ලබා දීම.
4. ආබාධ සහිත දරුවන් සඳහා ස්වේච්ඡා පදනමින් ඉගැන්වීමේ යෙදී සිටින පෙර පාසල් ගුරුවරුන් 43ක් සඳහා මූල්‍යාධාර ලබා දීම යටතේ රු. මි. 3.55ක් වැය කර ඇත.
5. වෘත්තීය පුහුණු ආයතනයන්හි පුහුණුව ලබන අභ්‍යාසලාභීන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ස්වේච්ඡා සංවිධානවල අභ්‍යාසලාභීන් හා ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානවල ආබාධ සහිත දරුවන් සඳහා දෛනික දීමනාවක් ලබාදීමේ වැඩසටහන යටතේ පුහුණුලාභීන් 726ක් සඳහා මේ වන විට රු. මි. 13.22ක් වියදම් කර ඇත.

| ව්‍යාපෘති අංක 02 | මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම |
|---|---|

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීමට අදාලව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 1.50ක් වෙන් වී ඇත. මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

1. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම
2. ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනයේ පුනරුත්ථාපනය වූවන් පිළිබඳ සමීක්ෂණය.
3. පුනරුත්ථාපනයවන්නන් සඳහා විනෝදාස්වාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| ව්‍යාපෘති අංක 03 | දෘශ්‍යාබාධිත අරමුදල |
|---|---|

මුළු දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම සඳහා රු. මි. 9.00ක් වෙන්කර ඇති අතර මේ වන විට රු. මි. 4.15ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත. මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

1. දෘශ්‍යාබාධිත දරුවන් හා දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ සාමාන්‍ය දරුවන් ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩසටහන යටතේ 1ශ්‍රේණියේ සිට අ.පො.ස. (ස/පෙ) දක්වා , අ.පො.ස. (උ/පෙ) හා උපාධිධාරී සිසුන් 381කට මාසික දීමනාව ලබා දීම සඳහා රු. මි. 3.38ක වියදමක් දරා ඇත.
2. උපදේශකවරුන් 5 දෙනෙක් සඳහා මාසික දීමනාවක් ලබා දීම සඳහා රු. මි 0.17ක් වැය කර ඇත.
3. රු. මි. 0.02ක් වියදමක් දරා එක් පුද්ගලයෙකුට අක්ෂි කාච ලබාදීම.
4. ජීවිතයේ පසු කාලීනව දෘශ්‍යාබාධිත වූ පුද්ගලයින් 29 දෙනෙකුට පුනරුත්ථාපනය සඳහා ආධාර සැපයීම වෙනුවෙන් රු. මි. 0.23ක් වැය කර ඇත. .
5. දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ක්‍රීඩා ආධාර ලබා දීම යටතේ විශේෂ පාසැල් සඳහා චෙස් පුවරු 12ක්

ලබාදීම වෙනුවෙන් රු. මි. 0.03ක් වැය කර ඇත.

6. පිටු 11,983ක කථන පොත් සඳහා රු. මි. 0.32ක් වැය කර ඇත.
7. ඔක්තෝබර් 15 වන දිනට යෙදී ඇති ජාත්‍යන්තර සුදු සැරයටි දිනය සැමරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

| ව්‍යාපෘති අංක 04 | විවිධ ආබාධ සහිත දරුවන්ගේ විනෝදාත්මක කටයුතු සඳහා පහසුකම් සැලසීම |
|---|---|

ආබාධ සහිත දරු දැරියන්ගේ සෞන්දර්යාත්මක හා ක්‍රීඩා කුසලතාවයන් ඔප්නංවා සෞඛ්‍ය සම්පන්න ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස සමාජගත කිරීම සඳහා දිවයිනේ සියලුම ආබාධිත තරුණ තරුණියන් නියෝජනය වන පරිදි ඔවුන්ගේ ක්‍රීඩා හා කලා කුසලතාවන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගෙන සෑම වසරකම ජාතික ක්‍රීඩා හා කලා ප්‍රසංග පැවැත්වීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා රු. මි. 10.00ක් වෙන්කර ඇති අතර මේ වන විට රු. මි. 3.11ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

1. ආබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික මලල ක්‍රීඩා උළෙල
   ආබාධ සහිත පුද්ගලයන්ගේ ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන ජාතික මලල ක්‍රීඩා උළෙලට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් තරඟ පවත්වා අවසන් කර ඇති අතර, තරඟ වලින් ජයග්‍රහණය කළ පුද්ගලයින් ජාතික පැරා ඔලිම්පික් තරඟය සඳහා යොමු කරමින් ජාතික මට්ටමේ ජයග්‍රහණ 08ක් ලබා ඇත.
2. ආබාධ සහිත දරු දැරියන්ගේ ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය - "සිත් රූ"
   ආබාධ සහිත පුද්ගලයන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වන "සිත් රූ" කලා ප්‍රසංගය දෙසැම්බර් මාසයේ පැවැත්වීමට නියමිතව ඇත.

| ව්‍යාපෘති අංක 05 | විවිධ ආබාධ සහිත සිසුන් සඳහා දෛනික දීමනාව ලබාදීම |
|---|---|

දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනයන්හි පුහුණුව ලබන ආබාධි සහිත පුද්ගලයින් සඳහා රු. 150.00 බැගින් වූ දෛනික දීමනාවක් ලබාදීම සඳහා රු. මි. 25.00ක් වෙන් කර ඇති අතර මේ වන විට රු. මි. 13.22ක් වියදම් කර පුහුණුලාභීන් 726ක් සඳහා දීමනාව ලබාදී ඇත.

**වෙනත් ව්‍යාපෘති (ප්‍රාග්ධන ප්‍රතිපාදන)**

| ව්‍යාපෘති අංක 01 | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන නවීකරණය කිරීම,වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය |
|---|---|

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කිරීම,වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මි. 20.00ක් වෙන් කර ඇත. 2021 වර්ෂයේ අතැති බිල්පත් ගෙවීම සඳහා රු. මි. 4.73ක වියදමක් දරා ඇති අතර, කොට්ටාව පූර්ව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් රු. මි. 0.13ක වියදමක් දරා ඇත. 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතුවෙන් සැලසුම් කරන ලද වැඩසටහන් සිදු කිරීමට හැකියාව නොලැබිණි.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.

- තිරසර සංවර්ධන අරමුණ 08 – සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.
- තිරසර සංවර්ධන අරමුණ 10 – රටවල් ඇතුළත සහ රටවල් අතර අසමානතාවය අඩුකිරීම

## සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතන හා අරමුදල්

**වෘත්තීය පුහුණු ආයතන**

ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කොට ගනිමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සීදූව, වත්තේගම, කැටවල, තෙළඹුයාය, රාගම, අමුණුකුඹුර, කලවාන, මාදම්පේ, මඩකලපුව යන ප්‍රදේශ වල වෘත්තීය පුහුණු ආයතන 09ක් හා තෝලංගමුව අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය ක්‍රියාත්මක වේ.

මෙම වෘත්තීය පුහුණු ආයතන හරහා දිවයින පුරාම විසිරී සිටින ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම  හා කුසලතා සංවර්ධනය තුළින් ඔවුන් සංවර්ධනයට දායක කර ගැනීම අරමුණු කර ගනිමින් ආබාධ සහිත තරුණ තරුණියන්  සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා පෞරුෂ වර්ධනය කිරීම, ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධනය කිරීම, විධිමත් පරිදි  පුහුණුව නිම කළ  අභ්‍යාසලාභීන් සඳහා  සහතික පත් ලබා දීම හා සමාජ ගත කිරීම, ස්වයංරැකියා සඳහා  මෙවලම් කට්ටල ලබා දීම හා  විවෘත වෙළඳපොල අංශයේ රැකියා අවස්ථා හඳුන්වාදීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.

වයස අවු 16 – 35 ත්  අතර සුදුසුකම් ඇති  ආබාධ සහිත තරුණ තරුණියන් විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ සිදුකරනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසු ඔවුන්ගේ හැකියාවන්ට ගැලපෙන පුහුණු පාඨමාලාවන් සඳහා තෝරා ගැනේ. පාඨමාලාවේ ස්වභාවය අනුව පුහුණු කාලය වෙනස් වන අතර ඒ අනුව වසරක හෝ වසර දෙකක විධිමත් පුහුණුවක් තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා ලබාදේ. කාලය තුළ දෛනික දීමනාවක් හා නේවාසික පහසුකම්, ආහාරපාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයෙන අතර පාඨමාලා 26ක් යටතේ අභ්‍යාසලාභීන් 451ක් සඳහා මේ වන විට වෘත්තීය පුහුණුව ලබා දේ.

**ජයවිරු සෙවණ රැකවරණ නිවහන (ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන රැකවරණ මධ්‍යස්ථාන)**

දෙමාපිය රැකවරණය අහිමි මන්ද මානසික ආබාධ සහිත පිරිමි දරුවන් සඳහා රැකවරණය සැපයීම වෙනුවෙන් 2001 ජූලි මස 31 වන දින ආරම්භ කරන ලද ජයවිරු සෙවණ ආයතනය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත  ප්‍රදේශයේ පිහිටා ඇත.

බුද්ධිමය ඌණතාවක් සහිත ප්‍රජාවට සෙනෙහස හා ආදරය ලබා දීම තුළින් හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වර්ධනයට අවස්ථාවක් සලසා දීමෙන් හා ඔවුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරවීමෙන්

ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කරවීම මෙහෙවර කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ආයතනය හරහා මුළු ජීවිත කාලයම නේවාසිකව සිටින මෙම ළමුන් හුදකලා නොකොට ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා අතරම දෛනික ක්‍රියාකාරකම් සඳහා යොමු කෙරේ. රැකවරණය ලබන කාලසීමාව තුළ නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම ද සිදුකෙරේ.

**ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය (මත්ලෝලී පුනරුත්ථාපන ආයතනය)**

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වූ නවෝදය ව්‍යාපෘතියේ , අනුව්‍යාපෘතියක් ලෙස 2007.07.31 දින ආරම්භ කර ඇති මෙම ආයතනය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත ප්‍රදේශයේ පිහිටා ඇත.

පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස වසර ගණනාවක් ක්‍රියාත්මක වූ ජයවිරු සමාධි නිවහන පවත්වාගෙන යාමේ දී දැක් වූ ගුණාත්මක සේවය අගය කිරීමක් ලෙස, ඖෂධවලට අබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි කටයුතු නියාමනය සඳහා වන 2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනතේ 2වන වගන්තිය යටතේ නාමෝදිෂ්ඨ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙසට නම් කිරීමට අන්තරාකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිර්දේශ ලබා දී ඇත.

සැබෑ ජීවන දර්ශනය හා ජීවිතයේ සැබෑ සතුට කියා දීමත්, හැකියාවන් ඔප් නැංවීමත් තුළින් මතට ඇති නැම්යාව අවම කර, මතට බිලිවූ තරුණ පරපුර ජාතික සංවර්ධනයට දායක කර ගැනීමත් මෙහෙවර කර ගනිමින් විවිධ මත්ද්‍රව්‍ය වලට අබ්බැහි වූ මත්ලෝලීන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම මෙම ආයතනය මගින් සිදු කෙරේ.

අධිකරණ නියෝග මගින්, ස්වේච්ඡාවෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෝහල් මගින් යොමු කරනු ලබන සේවාලාභීන් වරකට 60කට ආසන්න ප්‍රමාණයක් පුනරුත්ථාපනයට යොමුකළ හැකි අතර, පුනරුත්ථාපන කාලය මාස 03, මාස 06 හා වසර 01 දක්වා වූ කාලයන් අනුව සිදු වේ. අධිකරණ නියෝග මත යොමු කෙරෙන සේවාලාභීන්ගේ පුනරුත්ථාපන කාලය තීරණය කෙරෙනුයේ අධිකරණ නියෝගය ප්‍රකාරවය.

මෙම ආයතනය මඟින් පහත සඳහන් කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරයි.

- මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.

- මත්ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට ගෙන ඒම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම.
- අවදානම් කණ්ඩායම් සඳහා මත් ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**

ළමයෙකුගේ උපතේ දී සිටම වර්ධනයේ කිසියම් අස්වාභාවික තත්ත්වයක් හෝ ප්‍රමාදයක් හෝ ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම අරමුණු කර ගනිමින් 2003 වර්ෂයේ දී බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නාවින්න, පතිරගොඩ ප්‍රදේශයේ මෙම ආයතනය ස්ථාපිත කර ඇත.

දෙමාපියන් හා පවුලේ සාමාජිකයන් අභියෝග වලට අභිමානවත්ව මුහුණදීම සඳහා සවිබලගන්වමින්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ උපරිම සංවර්ධනය සඳහා කල් ඇතිව මැදිහත්වෙමින්, දිරිගන්වමින් නිසි වේලාවට ළඟා කරන්නාවූ සේවා ජාලයක් ගොඩනැංවීමේ හා සම්බන්ධීකරණය කිරීමේ මැදිහත්කරුවකු වශයෙන් කටයුතු කිරීම මෙහෙවර කර ගනිමින් කටයුතු කරන මෙම ආයතනය හරහා ආබාධ සහිත දරුවන් 80 කට ආසන්න ප්‍රමාණයක් සඳහා සේවාවන් සපයනු ලැබේ.

**සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ආදර්ශ කොට ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල් ළමාවියේ පසුවන ආබාධ සහිත දරුවන් වෙනුවෙන් සේවා සැපයීම සඳහා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 ජනවාරි මස 25දින මෙම ආයතනය ආරම්භ කරන ලද අතර, මෙම මෙම ආයතනය හරහා ආබාධ සහිත දරුවන් 15 කට ආසන්න ප්‍රමාණයක් සඳහා සේවාවන් සපයනු ලැබේ.

ඉහත ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන මඟින් පහත සඳහන් කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරයි.

- ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.

**කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය**

වයස අවුරුදු 13-19ත් අතර සිටින යෞවන යෞවනියන් අනාගතයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කරවීමට අවශ්‍ය පූර්ව සූදානම් කිරීම අරමුණු කරගනිමින් කොට්ටාව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 01 දින ආරම්භ කරන ලදි. මෙම ආයතනය හරහා ආබාධ සහිත දරුවන් 40 ආසන්න ප්‍රමාණයක් සඳහා සේවාවන් සපයනු ලැබේ.

**දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල**

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙහෙවර කර ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇති අතර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් හරහා පාලනය වන මෙම අරමුදල සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබයි. මෙම අරමුදල මඟින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සහ දෘශ්‍යාබාධිත සංවිධාන සඳහා ක්‍රීඩා ආධාර ලබාදීම.
- දෘශ්‍යාබාධිත උපදේශකවරුන් මඟින් දෘශ්‍යාබාධිත අභ්‍යාසලාභීන් පුහුණු කිරීම.
- දෘශ්‍යාබාධිත සිසුන් සහ දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ දෘශ්‍යාබාධිත නොවන පාසල් දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම.
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම
- දෘශ්‍යාබාධිත පාඨකයන් සඳහා බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරන "කාලය" සඟරාව සඳහා ආධාර ලබාදීම.
- පසුකාලීනව දෘශ්‍යාබාධිත තත්ත්වයට පත් තැනැත්තන් මානසික වශයෙන් බලගැන්වීම හා සමාජගත කිරීමේ වැඩසටහන.
- දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ කියවීමේ අයිතිය තහවුරු කිරීම සඳහා සාමාන්‍ය අකුරින් මුද්‍රිත ග්‍රන්ථ කථන ග්‍රන්ථ බවට පරිවර්තනය කිරීම (කථන පුස්තක වැඩසටහන).
- කොවිඩ් වසංගතය හේතුවෙන්, පවත්වාගෙන යන ලද ස්වයංරැකියාව අතහැර දැමූ හෝ ස්වයංරැකියාව පවත්වාගෙන යාමට අපහසුතා ඇති වූ දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ස්වයංරැකියා ආධාර ලබා දීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිය හා පානීය ජලය ලබාගැනීම සඳහා ආධාර ලබාදීම.
- අවස්ථානුකූලව දෘශ්‍යාබාධිත පුද්ගලයින් හෝ අදෘශ්‍යාබාධ සහිත පුද්ගල සංවිධාන විසින් කරනු ලබන ඉල්ලීම්වලට අනුව ආධාර ලබාදීම.
- අක්ෂි කාච සහ අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබාදීම.
- ජාත්‍යන්තර සුදු සැරයටි සැමරුම් දින ජාතික වැඩසටහන පැවැත්වීම.

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන් හා ව්‍යාපෘති

**ජාත්‍යන්තර සංඥා භාෂා දිනයට සමගාමීව සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ සංචිතය එළිදැක්වීම හා සැමරුම් උත්සවය පැවැත්වීම**

ජාත්‍යන්තර සංඥා භාෂා දිනයට සමගාමීව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සංඥා භාෂා දින සැමරුම් උත්සවයක් සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍ය ගරු අනූප පැස්කුවල් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022 සැප්තැම්බර් මස 23 දින සෙත්සිරිපාය දෙවන අදියර පරිශ්‍රයේ දී පැවැත්වීය. සංඥා භාෂාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ සංචිතය එළිදැක්වීම ද මෙදින සිදු කෙරිණි.

**ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රැකියා ආධාර ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ESPD)**

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධතාවය මත ආබාධ සහිත ප්‍රජාව රැකියා ගතකිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රැකියා ආධාර ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ESPD) 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක කෙරෙන අතර, එහි මූලික අදියරේ කටයුතු 2022 වර්ෂයේ ආරම්භ කරන ලදි. මේ යටතේ විශේෂයෙන් වෘත්තීය පුහුණුව මගින් රැකියාගත කිරීම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණුකරුවන් මඟින් වඩා විධිමත්ව සිදු කිරීමට සැලසුම් කර ඇත.

## ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

- අස්ථාවර වෙළඳපල තත්ත්වය හේතුවෙන් නිතර නිතර භාණ්ඩ හා සේවා වල මිල අධික ලෙස ඉහළ යාම.
- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ඉහත තත්ත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- රියන්සි අලගියවන්න කාන්තා කුසලතා සංවර්ධන හා රැකවරණ ජාතික මධ්‍යස්ථානය ආරම්භ කිරීම.
- කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- නව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 03ක් ආරම්භ කිරීම

## 6.3.3 සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

### හැඳින්වීම

ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලදී. ඒ අනුව, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය ස්ථාපිත කරනු ලැබිනි.

එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින් , අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කරනු ලබයි.

ගම්මානයක් තෝරා ගැනීමේ නිර්ණායක පහත පරිදි වේ.

1. ඒ ඒ ප්‍රදේශ වලට සුවිශේෂ හෝ ආවේණික වූ නිෂ්පාදන සිදු කරන ගමක් වීම හෝ කිසියම් නිෂ්පාදනයක් කිරීමට දැනුම සහිත පිරිසක් සිටින ගමක් වීම හෝ ප්‍රදේශවල පවතින සම්පත් හෝ අමුද්‍රව්‍ය සුලභතාව
2. නිෂ්පාදන කාර්යයේ සෘජුව ම යෙදී සිටින පවුල් සංඛ්‍යාව 20 ක් හෝ ඊට වැඩි වීම
3. නිෂ්පාදන ගම්මානය තුළ සෘජු නිෂ්පාදකයින් සංඛ්‍යාව වැඩි කිරීම මගින් නිෂ්පාදන තවදුරටත් වැඩි කිරීමේ හැකියාව
4. නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නංවමින්, අඛණ්ඩව නිෂ්පාදනය කිරීමේ හැකියාව
5. හඳුනා ගන්නා ලද නිෂ්පාදන සඳහා ඇති වෙළඳපල විභවතාව
6. ප්‍රතිලාභියාට අඛණ්ඩ ආදායම් මාර්ගයක් පවත්වා ගැනීමට හැකි වීම
7. නිෂ්පාදන ගම්මානය ආරම්භ කර සාධාරණ කාල සීමාවකට පසුව නිෂ්පාදකයාට තම නිෂ්පාදන ස්වාධීනව කර ගෙන යාමේ හැකියාවක් පැවතීම
8. ප්‍රාදේශීය, භූගෝලීය, සමාජීය හා පාරිසරික යෝග්‍යතාවය අනුව නිෂ්පාදන ක්ෂේත්‍ර තෝරා ගැනීම
9. නව තාක්ෂණය යොදාගැනීමේ හැකියාව
10. පාරිසරික හිතකාමී බව

## අරමුණු

- දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම හා ප්‍රචලිත කිරීම
- පවතින සහ විශේෂිත නිෂ්පාදන දිරිමත් කිරීම
- රැකියා අවස්ථා උදා කිරීම මගින් විරැකියාව අඩු කිරීම
- ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා විකල්ප ආදායම් මාර්ග ඇති කිරීම
- ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

## උපාය මාර්ග

- එක් නිෂ්පාදනයක් සඳහා යෙදවුම් වන අමුද්‍රව්‍ය, ඇසුරුම් ආදිය වෙනත් ගම්මාන තුල නිෂ්පාදන කිරීමට දිරිගැන්වීම
- ප්‍රතිලාභීන් සඳහා සෘජුව ලබාදෙන ප්‍රතිලාභ සඳහා 50% හෝ ඊට වැඩියෙන් ප්‍රතිලාභී දායකත්වයක් දැරිය යුතු වීම
- ප්‍රතිලාභී දායකත්වය මුදලින් මෙන්ම ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් යෙදවුම් ලෙසද ලබාදිය හැකිවීම
- නිෂ්පාදන ගම්මානයේ සියළුම ප්‍රතිලාභීන් නිෂ්පාදන සමිතියේ සාමාජිකයින් වීම මගින් එක් නිෂ්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව
- නිෂ්පාදකයින්ට පොදුවේ පරිහරණය කල හැකි උපකරණ හා අනෙකුත් පහසුකම් නිෂ්පාදන සමිතියට ලබාදීම මගින් වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා ගැනීමට සැලසීම

## ක්‍රියාත්මක ක්‍රමවේදය

එක් එක් දිස්ත්‍රික්කය තුළ දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂගේ සම්බන්ධීකරණයෙන් යුතුව ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ දී, ප්‍රාදේශීය ලේකම්ගේ මඟ පෙන්වීම යටතේ සහකාර ක්‍රමසම්පාදන අධ්‍යක්ෂගේ සම්බන්ධීකරණයෙන් යුතුව ගම්මට්ටමෙන් සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී ඇතුලු ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහයෝගතාවයෙන් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

එමෙන්ම, ග්‍රාමීය සංවර්ධනය තුලින් ප්‍රාදේශීය විෂමතා අවම කරගනිමින් රට සංවර්ධනය කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීමේදී මනාව සංවර්ධනය කරන ලද යටිතල පහසුකම් පැවතීම මහගු පිටුබලයක් සපයනු ලබයි. ඒ අනුව මෙම වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමද සිදු කෙරේ.
මේ යටතේ ග්‍රාමීය මාර්ග ඉදිකිරීම හා අළුත්වැඩියාව, බෝක්කු සහ කුඩා පාලම් ඉදිකිරීම හා අළුත්වැඩියාව, කානු පද්ධති සැකසීම, කුඩා වාරිමාර්ග සැකසීම වැනි මූලික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවධානය යොමුකරනු ලැබේ.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු.මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 1,350.00 | 1,185.08 | 164.92 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

1. මෙම වසරේ නව නිෂ්පාදන ගම්මාන 16ක් හඳුනාගෙන ඇති අතර අතර නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි සීතාඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ට්‍රෝබෙරි නිෂ්පාදන ගම්මානයක් සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංචාරක සේවා ගම්මානයක් නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කර ඇත.

   2021 වර්ෂයේ නිෂ්පාදන ගම්මාන 574ක් ආරම්භ කර ඇති අතර ඉන් මහනුවර දිස්ත්‍රික්කයේ ගම්මාන 7ක්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගම්මාන 2ක්, අම්පාර දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක්, පුත්තලම දිස්ත්‍රික්කයේ ගම්මාන 3ක්, යාපනය දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක්, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගම්මාන 3ක්, රත්නපුර දිස්ත්‍රික්කයේ ගම්මාන 2ක්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක්, බදුල්ල දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක් සහ මොනරාගල දිස්ත්‍රික්කයේ එක් ගම්මානයක් ලෙස ගම්මාන 23ක වැඩිදියුණු කිරීම් සඳහා 2022 වර්ෂයේද ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. රු. මි. 20.04ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.
2. ප්‍රචාරණ කටයුතු සඳහා රු. මි. 0.35ක් වැයකර ඇති අතර ඒ යටතේ ගුවන් විදුලි වැඩසටහන් 2ක් පවත්වා ඇත.
3. 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු. මි. 1,111.25ක බිල්පත් පියවා ඇත.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

## ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

- අස්ථාවර වෙළඳපල තත්ත්වය හේතුවෙන් නිතර නතර භාණ්ඩ හා සේවා වල මිල අධික ලෙස ඉහළ යාම.

- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ඉහත තත්ත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා තරුණ දායකත්වය ලබා ගැනීම
- ප්‍රතිලාභීදායකත්වය ලබාදීමට මැලිවීම
- අගය එකතුකල නිෂ්පාදනයේ යෙදීමට වඩා අමුද්‍රව්‍ය ලෙස වෙළඳාම් කිරීමට ලැදි වීම (උදා- කිරි)
- දිගු කාලයක් මුළුල්ලේම සංවර්ධන සංකල්පයේදී ජනතාව මෙන්ම නිලධාරීන්ද සාම්ප්‍රදායික රාමුවක කොටු වී සිටීම

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- පවත්නා සමාජීය හා ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් 2023 වර්ෂයේදී නව නිෂ්පාදන ගම්මාන 145ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර දැනටමත් ස්ථාපිත කර ඇති ජාතික නිෂ්පාදන ගම්මාන අතරින් විභවතාවයක් සහිත ගම්මාන සඳහා වැඩි දියුණු කිරීම් සිදු කිරීමටද අපේක්ෂිතයි.

# 6.3.4 ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)

## හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති අතර, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අභිප්‍රායෙන් **ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව** මගින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

## අරමුණු

- ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.
- ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධව නිවැරදි සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම.
- ආබාධ සහිත පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම සහ ආධාර දීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම.
- ආබාධ සහිත පුද්ගලයින්ට භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබා දීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සහ තත්ත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම් වැඩි දියුණු කිරීම.

## උපාය මාර්ග

- අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම පහසු කරලීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තනිමාපිය පවුල්වල සුබසාධනය ඉහළ නැංවීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ 1996 අංක 28 දරණ පනත යාවත්කාලීන කරමින් ආබාධ සහිත තැනැත්තන් හට වැඩි වරප්‍රසාද ලබා ගැනීමට අවකාශය සැලසීම.

- ශ්‍රවණාබාධිත ප්‍රජාවගේ සන්නිවේදන අයිතිය තහවුරු කරලීම සඳහා සංඥා භාෂා පනත් කෙටුම්පත සකස් කිරීම.
- ආබාධ සහිත ප්‍රජාවගේ ප්‍රවේශ අයිතිය තහවුරු කිරීම සඳහා වන ප්‍රවේශ පහසුකම් රෙගුලාසි සංශෝධනය කිරීමට පියවර ගැනීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ සුබසාධනය උදෙසා පෞද්ගලික අංශය සමග එක්ව රැකියා ලබා දීමට පියවර ගැනීම.
- වික්ටෝරියා නිවාසයේ නේවාසික රෝගීන්ගේ සුබසාධනය වෙනුවෙන් මාසිකව නඩත්තු වියදම් දැරීම.
- වකුගඩු රෝගයට ගොදුරු වූවන් ආබාධ සහිත වීම වැළැක්වීම උදෙසා මාසික ජීවනාධාර ගෙවීමට කටයුතු කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම උදෙසා නව රැකවරණ නිවාස 04ක් ස්ථාපනයට කටයුතු ආරම්භ කිරීම.
- ස්වෝත්සාහයයෙන් නැගී සිටීමට වෙර දරන ආබාධ සහිත තැනැත්තන් සඳහා මූල්‍ය සහන මෙන්ම මූල්‍යකරණය, නිෂ්පාදන ඵලදායිතාව, අලෙවිකරණය යන සෑම අංශයක් කෙරෙහි මැදිහත් වෙමින් ඔවුන් සවිබලගැන්වීමට කටයුතු කිරීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු. මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 32.00 | 24.10 | 7.90 |
| පුනරාවර්තන | 7,520.62 | 4,062.88 | 3,457.74 |
| **එකතුව** | **7,552.62** | **4,086.98** | **3,465.64** |

අනෙකුත් අරමුදල්

| අරමුදල් වර්ගය | 2022 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු. මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|
| නිවාස අරමුදල (සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් 5%) | අපේක්ෂිත මුදල රු. මි. 12.00 | 7.20 | 4.80 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

**ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

1996 අංක 28 දරන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතෙහි උප වගන්ති කිහිපයක සංශෝධනයක් 2003 වර්ෂයේදී සිදු වී ඇති අතර එය, 2003 අංක33 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ලෙස නම් කර ඇත. එම පනත නැවත සංශෝධනය වන අතර නව පනත් කෙටුම්පත කැබිනට් අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

**සංඥා භාෂා පනත් කෙටුම්පත**

සංඥා භාෂා පනත් කෙටුම්පත් කමිටුවේ එකඟත්වය සහිතව සංශෝධනය කරන ලද පනත් කෙටුම්පත සඳහා 2021.01.18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලැබී ඇත. 2021.01.22 දින නීති කෙටුම්පත් සම්පාදක සමග පැවති සාකච්ඡාවේදී එළඹි තීරණ අනුව සංශෝධන සඳහා එකඟතාවයකට පැමිණ එම සංශෝධන සිදු කොට අවසන් අතර නැවත කෙටුම්පත අමාත්‍යාංශය වෙත ලැබීමට නියමිතය.

**ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය**

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කර ඇත. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව සකස් කරන ලද ගැසට් පත්‍රය කෙටුම්පත් කර සංශෝධනයන් අවසන් කර අනුකමිටුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

**ප්‍රාග්ධන ප්‍රතිපාදන**

ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන

| ව්‍යාපෘති අංක 01 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබා දීම |
|---|---|
| අඩු ආදායම් ලබන ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි ඇස් කණ්ණාඩි, රෝදපුටු, ශ්‍රවණ උපකරණ,ත්‍රෙසිකල්, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට, ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා වෛද්‍ය නිර්දේශ මත උපරිම රු. 20,000 දක්වා මුදල් ආධාර ලබා දේ. මෙම වැඩසටහන සඳහා රු. මි. 9.00ක් වෙන් කර ඇති අතර රු. මි. 6.45ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත. මෙහිදී ජංගම සේවා 16ක් පවත්වා ඇත. ඇස් කණ්ණාඩි 10,906ක් හා පුද්ගලයින් 5 දෙනෙකු සඳහා මූල්‍යාධාර ලබා දී ඇත. | |

| ව්‍යාපෘති අංක 02 | ආබාධ සහිත තැනැත්තන් සඳහා වෛද්‍ය ආධාර ලබා දීම |
|---|---|

ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් ආබාධ තත්ත්වයට පත්වීම වැළැක්වීම ද අරමුණු කර ගනිමින් මුළු දිවයිනම ආවරනය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. එහි දී රජයේ රෝහල් මගින් නොසපයන ඖෂධ ලබා ගැනීමට, සායනවලට සහභාගී වීම සඳහා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක , ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම් ලබන පවුල් සඳහා උපරිමය රු.20,000ක් දක්වා මේ යටතේ ආධාර ලබා දේ. මෙම වැඩසටහන සඳහා රු. මි. 6.00ක් වෙන් කර ඇති අතර රු. මි. 10.45ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත. පුද්ලගයින් 696ක් සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.

| ව්‍යාපෘති අංක 03 | ආබාධ සහිත පුද්ගලයින්ට සේවා සපයන ස්වේච්ඡා ආයතන සඳහා මූල්‍යාධාර ලබාදීම. |
|---|---|

ආබාධ සහිත පුද්ගලයින්ට සේවා සපයන එක් ස්වේච්ඡා ආයතනයකට රු. මි. 0.20ක් වන පරිදි මූල්‍යාධාර ලබාදීම සඳහා රු. මි. 1.00ක් වෙන්කර ඇති අතර මේ වන විට එක් ස්වේච්ඡා ආයතන 2කට මි. 0.40ක් ලබා දී ඇත.

| ව්‍යාපෘති අංක 04 | ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම |
|---|---|

මෙම වැඩසටහන යටතේ ජීවිත කාලයටම එක් වරක් පමණක් ලැබෙන උපරිමය රු.10,000ක් වන පරිදි ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත ආධාර ලබාදීම සඳහා රු. මි. 4.00ක් වෙන් කර ඇත. සිසුන් 364ක් සඳහා රු. මි. 3.74ක් වැයකර මූල්‍යාධාර ලබා දී ඇත.

| ව්‍යාපෘති අංක 05 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයංරැකියා ආධාර ලබා දීම |
|---|---|

ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.20,000ක් දක්වා ආධාර ලබා දෙන අතර ස්වයං රැකියා නියාමනය, නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි කිරීමට මඟ පෙන්වීම හා අලෙවිය සඳහා මැදිහත්වීම මෙහි දී සිදු කෙරේ. මෙම වැඩසටහන සඳහා රු. මි. 4.00ක් වෙන් කර ඇති අතර රු. මි. 3.59ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත. පුද්ලගයින් 136ක් සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.

**පුනරාවර්තන ප්‍රතිපාදන**

| ව්‍යාපෘති අංක 01 | ආබාධ සහිත තැනැත්තන් සඳහා මාසික දීමනාව ලබා දීම |
|---|---|

මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගෙන ඒ හරහා දීමනා ගෙවීමට කටයුතු කරයි. ජනවාරි සිට මැයි මස දක්වා රු.5,000/- බැගින්ද මැයි මස සිට සැප්තැම්බර් මස දක්වා රු.7,500/- බැගින්ද මාසික ජීවනාධාරය ලබා දී ඇත. එසේම පොරොත්තු ලේඛණගත ප්‍රතිලාභීන්ට රු.5,000/- බැගින් ගෙවීම් මැයි මස සිට සිදුකරනු ලබයි. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හදිසි ප්‍රතිචාර සංරචක (CERC) වැඩසටහන යටතේ මෙම ගෙවීම් ප්‍රතිපූරණය කරනු ලබයි. (එම තොරතුරු පිටු අංක. 14-16 ඇතුලත් වේ). ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 4,860.00ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභීන් 72,000කට රු. මි. 2,610.52ක ප්‍රතිපාදන ලබා දී ඇත.

| ව්‍යාපෘති අංක 02 | වකුගඩු රෝගීන් සඳහා රු. 5,000/- ජීවනාධාර ලබා දීම |
|---|---|

මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගෙන ඒ හරහා දීමනා ගෙවීමට කටයුතු කරයි. ජනවාරි සිට මැයි මස දක්වා රු.5,000/- බැගින්ද මැයි මස සිට සැප්තැම්බර් මස දක්වා රු.7,500/- බැගින්ද මාසික ජීවනාධාරය ලබා දී ඇත. එසේම පොරොත්තු ලේඛණගත ප්‍රතිලාභීන්ට රු.5,000/- බැගින් ගෙවීම් මැයි මස සිට සිදුකරනු ලබයි. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හදිසි ප්‍රතිචාර සංරචක (CERC) වැඩසටහන යටතේ මෙම ගෙවීම් ප්‍රතිපූරණය කරනු

ලබයි. (එම තොරතුරු පිටු අංක. 14-16 ඇතුලත් වේ). ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 2,642.62ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභීන් 39,001කට රු. මි. 1,443.78ක ප්‍රතිපාදන ලබා දී ඇත.

| **ව්‍යාපෘති අංක 03** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා අවස්ථා ලබා දීම** |
|---|---|

රැකියාවක නිරත විය හැකි මට්ටමේ සිටින ආබාධ සහිත තැනැත්තන් රු.15,000 උපරිමය වන පරිදි පෞද්ගලික සේවා යෝජකයා ගෙවනු ලබන වැටුපෙන් අඩක් වූ වැටුප් සහනාධාරයක් යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම මෙහිදී සිදුවේ. මෙම වැඩසටහන් සඳහා රු. මි. 10.00ක් වෙන් කර ඇත. මේ වන විට රු. මි. 2.58ක් වැයකර පුද්ගලයින් 105ක් සඳහා ආධාර ලබා දී ඇත.

| **ව්‍යාපෘති අංක 04** | **වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම** |
|---|---|

රාජගිරියේ වික්ටෝරියා නිවාසයේ සේවකයින්ගේ මාසික වැටුප් හා ජල,විදුලි බිල්පත් පියවීම සඳහා ආධාර ලබාදීම සඳහා රු. මි. 8.00ක් වෙන් කර ඇති අතර රු. මි. 6.00ක් වියදම් දරා ඇත.

**වෙනත් ප්‍රතිපාදන**

| **ව්‍යාපෘති අංක 01** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබා දීම** |
|---|---|

අඩු ආදායම්ලාභී, ඉඩමක් හිමි, ආබාධ සහිත තැනැත්තන් සඳහා නව නිවසක් ඉදි කිරීම වෙනුවෙන් රු.250,000ක් හා අළුත්වැඩියාවක් සඳහා රු.150,000 ද වශයෙන් ආධාර ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහන 2001 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් 5% ක ප්‍රමාණයක් නිවාස අරමුදල සඳහා යෙදවේ. මෙම වර්ෂය සඳහා රු. මි. 12.00ක ප්‍රතිපාදන අපේක්ෂා කරන අතර රු. මි. 7.20ක ප්‍රතිපාදන ප්‍රතිලාභීන් 82ක් සඳහා ලබා දී ඇත.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණ 03 - නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.
- තිරසර සංවර්ධන අරමුණ 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.
- තිරසර සංවර්ධන අරමුණ 08 - සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කරන ලද වෙනත් සංවර්ධන ව්‍යාපෘති

- **සංඥා භාෂාව අතිරේක විෂයයක් ලෙස ස්ථාපනය කිරීම**

  රජයේ නිලධාරීන් සඳහා සංඥා භාෂාව අතිරේක විෂයයක් ලෙස ස්ථාපනය කරමින් ආබාධ සහිත තැනැත්තන්ට රාජ්‍ය සේවයේ උපරිම ඵල නෙළා ගැනීමට හැකි වන පරිසරයක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වේ. මේ සම්බන්ධයෙන් මූලික අදියර වශයෙන් විෂය නිර්දේශ ආදිය සකස් කර අවසන් කර ඇති අතර සංඥා භාෂාව අතිරේක විෂයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා සුදුසු

නිලධාරීන් හඳුනාගෙන ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය පළාත් පාලන අමාත්‍යාංශය මඟින් දැනුම් දී ඇත. ඒ අනුව අදාළ ක්ෂේත්‍රයේ සුදුසු නිලධාරීන් තෝරා නාමලේඛනයක් ලබාගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ලිපියක් නිකුත් කර ඇත.

- **රැකවරණ මධ්‍යස්ථාන 04ක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම**

  දීප ව්‍යාප්තව රැකවරණ මධ්‍යස්ථාන 6ක් ඉදි කිරීම සඳහා අමප/18/0755/711/015 අංක දරණ පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. රැකවරණ මධ්‍යස්ථාන 04 ක් ආරම්භ කිරීමට අනුමැතිය ලැබුණි. නමුත් ප්‍රතිපාදන ලැබීමේ ගැටළු හේතුවෙන් දඹුල්ලේ හා අකුරැස්ස මධ්‍යස්ථාන දෙක පමණක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. දඹුල්ලේ රැකවරණ මධ්‍යස්ථානය සඳහා ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවසන් අදියරේ පවතී.

## ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ අභියෝග

- අස්ථාවර වෙළඳපල තත්ත්වය හේතුවෙන් නිතර නිතර භාණ්ඩ හා සේවා වල මිල අධික ලෙස ඉහළ යාම.
- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ඉහත තත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- දිවයිනම ආවරණය වන පරිදි ආබාධ සහිත දරුවන් 7500කට අධ්‍යාපන මධ්‍යස්ථාන සඳහා යාමට මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දීම.

# 6.3.5 ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය (NSE)

## හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවීම සිදු කර ඇත.

## අරමුණු

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුභසාධනය ලබා දීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මගින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සූදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

## උපාය මාර්ග

- ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් වැඩිහිටි සමිති පිහිටුවා එමඟින් වැඩිහිටියන් හුදෙකලාභාවයට පත්වීම අවම කිරීම.
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම.
- සියළු වැඩිහිටි නිවාස ප්‍රමිතියට අනුව සකස් කරවීමට කටයුතු කරවීම.
- වැඩිහිටියන් වෙනුවෙන් ජීවනෝපාය මාර්ග ඇති කිරීම.
- පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මගින් දැනුවත්භාවය වර්ධනය කිරීම.
- වැඩිහිටි අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස්කර ක්‍රියාත්මක කිරීම.
- වැඩිහිටියන්ට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම.
- දරුවන්ගේ නොසැලකීම්වලට ලක්වන දෙමාපියන් වෙනුවෙන් සාධාරණය ඉටු කරවීමට නඩත්තු මණ්ඩලය පවත්වාගෙන යාම.
- අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් මාසික දීමනා ලබා දීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| වියදම් වර්ගය | 2022 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 5.00 | 1.00 | 4.00 |
| පුනරාවර්තන | 13,766.09 | 7,123.03 | 6,643.06 |
| **එකතුව** | **13,771.09** | **7,124.03** | **6,647.06** |

අනෙකුත් අරමුදල්

| අරමුදල් වර්ගය | 2022 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු.මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| වැඩිහිටි ආරක්ෂණ අරමුදල | 763.35 | 314.77 | 448.58 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

**පුනරාවර්ථන ප්‍රතිපාදන**

| ව්‍යාපෘති අංක 01 | වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන |
|---|---|

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 50.00ක් වෙන් වී ඇති අතර රු. මි. 13.89ක මූල්‍ය ප්‍රගතියක් ලබාගෙන ඇත. මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

1. ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු නියාමනය සඳහා අවශ්‍යය නීති රීති සහිත කෙටුම්පත ජාතික සභාව වෙත පරික්ෂා කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. මේ සඳහා රු. මි. 1.23ක් වෙන් කර ඇති අතර පිටපත් 120,000ක් මුද්‍රණය කර බෙදාහැරීමට සැලසුම් කර ඇත.
2. පාසල් සිසුන් සහ විශ්‍රාමික පුද්ගලයෝ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා රු. මි. 5.24ක් වෙන් කර ඇති අතර වැඩසටහන් 135 පැවැත්වීමට සැලසුම් කර ඇත. රු. මි. 0.48ක් වැයකර ඇත.
3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා රු. මි. 3.10ක් වෙන් කර ඇත. රු. මි. 0.06ක් වැයකර හැඳුනුම්පත් 183ක් නිකුත්කර ඇත.
4. වැඩිහිටි නිවාස ප්‍රතිසංස්කරණය කිරීම, ලියාපදිංචි කිරීම, ප්‍රමිතිකරණය සහ මාලිගාතැන්න වැඩිහිටි නිවාසය නඩත්තු කිරීම සඳහා රු. මි. 1.00ක් වෙන් කර ඇති අතරමේ වන විට රු. මි. 0.90ක වියදම් දරා ඇත.
5. වැඩිහිටියන් 500ක් සඳහා ස්වයං රැකියා ලබා දීම වෙනුවෙන් රු. මි.15.00ක් වෙන් කර ඇත. රු. මි. 5.22ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගනිමින් වැඩිහිටියන් 197ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.
6. ජාතික වැඩිහිටි සභාව හා නඩත්තු මණ්ඩලය පැවැත්වීම සඳහා රු. මි. 3.62ක් වෙන්කර ඇති අතර රු. මි. 1.91ක් වැයකර සාකච්ඡා 35ක් පවත්වා ඇත.
7. වැඩිහිටි දිමනාව ගෙවීමට අදාළ පරිපාලන වියදම් ලෙස රු. මි. 4.70ක් වෙන් කර ඇති රු. මි. 3.60ක වියදමක් දරා ඇත.
8. විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා රු. මි. 1.26ක් වෙන් කර ඇති අතර රු. මි. 0.14ක් වැයකර එක් සාකච්ඡා පවත්වා ඇත.
9. ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා රු. මි. 0.50ක් වෙන් කර ඇති රු. මි. 0.19ක වියදමක් දරා ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්යන්හි ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදුකර ඇත.
10. මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම හා ප්‍රකාශන නිකුත් කිරීම සඳහා රු. මි. 12.76ක් වෙන් කර ඇති රු. මි. 1.36ක වියදමක් දරා පොත් 1,000ක් හා අත් පත්‍රිකා 37,000 මුද්‍රණය කර ඇත. පුස්තකාල සඳහා පොත් 143ක් මිලදී ගෙන ඇත.

11. ඔක්තොම්බර් මස 01 දින ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා රු. මි. 0.50ක් වෙන් කර ඇත.

| ව්‍යාපෘති අංක 02 | වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් මාසික දීමනාව ලබා දීම |
|---|---|

මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගෙන ඒ හරහා දීමනා ගෙවදිට කටයුතු කරයි. ජනවාරි සිට මැයි මස දක්වා රු.2,000/- බැගින්ද මැයි මස සිට රු.5,000/- බැගින්ද මාසික ජීවනාධාරය ලබා දී ඇත. එසේම පොරොත්තු ලේඛණගත ප්‍රතිලාභීන්ට රු.5,000/- බැගින් ගෙවීම් මැයි මස සිට සිදුකරනු ලබයි. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හදිසි ප්‍රතිචාර සංරචක (CERC) වැඩසටහන යටතේ මෙම ගෙවීම් ප්‍රතිපූරණය කරනු ලබයි. (එම තොරතුරු පිටු අංක. 14-16 ඇතුලත් වේ). ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 13,550.00ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභීන් 627,771කට රු. මි. 7,000.20ක ප්‍රතිපාදන ලබා දී ඇති.

| ව්‍යාපෘති අංක 03 | වයස අවුරුදු 100ට වැඩි වැඩිහිටියන් මාසික දීමනාව ලබා දීම |
|---|---|

මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගෙන ඒ හරහා දීමනා ගෙවදිට කටයුතු කරයි. ජනවාරි සිට මැයි මස දක්වා රු.5,000/- බැගින්ද මැයි මස සිට රු.7,500/- බැගින්ද මාසික ජීවනාධාරය ලබා දී ඇත. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හදිසි ප්‍රතිචාර සංරචක (CERC) වැඩසටහන යටතේ මෙම ගෙවීම් ප්‍රතිපූරණය කරනු ලබයි. (එම තොරතුරු පිටු අංක. 14-16 ඇතුලත් වේ). ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 33.59ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභීන් 446කට රු. මි. 16.37ක ප්‍රතිපාදන ලබා දී ඇති.

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල**

| ව්‍යාපෘති අංක 01 | වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩසටහන් |
|---|---|

1. කිසිදු දීමනාවකට හිමිකම් නොකියන, නිදන්ගත බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන් සඳහා රුපියල් 25,000 බැගින් ලබාදෙන "ආරෝග්‍යා" වෛද්‍ය ආධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 25.00ක් වෙන් කර ඇති අතර වැඩිහිටියන් 688ක් සඳහා රු. මි.17.48ක් ලබා දී ඇත.
2. අඩු ආදායම්ලාභී ජ්‍යොෂ්ඨ පුරවැසියන් 300ක් සඳහා ශ්‍රවණාධාර ලබාදීම සඳහා රු. මි. 5.43ක් වෙන් කර ඇති අතර වැඩිහිටියන් 107ක් සඳහා රු. මි. 2.24ක මුදලක් වැයකර වැඩිහිටියන් 144ක් සඳහා ශ්‍රවණාධාර උපකරණ ලබා දී ඇත.
3. පන්නල පිළිගැනීමේ වැඩිහිටි නිවාසයේ නඩත්තුව සහ පරිපාලනය සඳහා රු. මි. 10.00ක් වෙන් කර ඇති අතර මේ වන විට රු. මි. 7.25ක් වියදම් කර ඇත.
4. සරණ වැඩිහිටි නිවාසයේ පරිපාලනය (දෙහිඅත්තකණ්ඩිය) සඳහා රු. මි. 0.22ක් වෙන් කර ඇති අතර මේ වන විට රු. මි. 0.12ක් වියදම් කර ඇත.
5. කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීම සඳහා රු. මි. 180.00ක් වෙන් කර ඇති අතර මේ වන විට රු. මි. 93.25ක් වියදම් කර ඇත.
6. වැඩිහිටි නිවාස 50ක් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එක් නිවසකට මිලියන 2.0ක මූල්‍ය ආධාර ලබා දීම. මේ සඳහා රු. මි. 100ක් වෙන්කර ඇති අතර රු. මි. 3.71ක් වැඩිහිටි නිවාස 6ක් සඳහා ලබා දී ඇත.
7. වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 50ක් ඉදිකිරීම සඳහා එක් මධ්‍යස්ථානයකට රු. මි. 3.50 බැගින් ලබා දීම. මේ සඳහා රු. මි. 175.00ක් වෙන් කර ඇති අතර රු. මි. 32.69ක් වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 17ක් සඳහා ලබා දී ඇත.
8. අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයින් සඳහා නිවාස ඉදි කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා රු. මි. 5.00 බැගින් ලබා දීමේ දිරිය පියස නිවාස වැඩසටහන සඳහා රු. මි. 25.00ක් වෙන්කර ඇත. වැඩිහිටියන් 48ක් සඳහා රු. මි. 24.00ක් නිවාස ආධාර ලෙස ලබා දී ඇත.
9. වැඩිහිටියන්ට තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා එක් ප්‍රතිලාභියෙකුට උපරිම වශයෙන් රු. මි. 0.075ක් ලබා දීමේ සුවපහසු මූල්‍යාධාර

යෝජනා ක්‍රමය. මෙහිදී එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක අවම වශයෙන් ප්‍රතිලාභීන් 06ක් වන පරිදි වැඩිහිටියන් 2,000ක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට සැලසුම් කරමින් රු. මි 100ක් මෙම වැඩසටහන සඳහා වෙන් කර ඇත. වැඩිහිටියන් 1,521ක් සඳහා රු. මි. 75.69ක් ලබා දී ඇත.

10. වැඩිහිටි ආගමික චාරිකා සංවිධානය කිරීම සඳහා රු. මි. 5ක් වෙන් කර ඇත. මෙහිදී එක් චාරිකාවක් සඳහා රු. මි. 0.05ක් වන පරිදි චාරිකා 100ක් සඳහා මූල්‍ය පහසුකම් සැපයයි. මේ වන විට චාරිකා 75ක් සඳහා 3.53ක් ලබා දී ඇත.
11. ගම් මට්ටමේ වැඩිහිටි කමිටු බලගැන්වීම සඳහා රු. මි. 99.90ක් වෙන් කර ඇති අතර උපරිම රු. මි. 0.1ක් බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කමිටු 999ක් සඳහා ලබා දීමට සැලසුම් කර ඇත. මේ වන විට කමිටු 501ක් සඳහා 50.11ක් වියදම් කර ඇත.
12. එක් මධ්‍යස්ථානයකට රු. මි 0.05 බැගින් වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථාන 50ක් සඳහා උපකරණ මිලදී ගැනීමට මූල්‍ය ආධාර ලබාදීම සඳහා රු. මි. 25.00ක් වෙන් කර ඇත. රු. මි. 3.61ක් වැයකර දිවා සුරකුම් මධ්‍යස්ථාන 9ක් සඳහා මූල්‍ය ආධාර ලබා දී ඇත.
13. වැඩිහිටි නිවාස 100ක් සඳහා ඉල්ලීම මත යම් වසංගත හෝ හදිසි අවස්ථාවකදී උපරිම රු. 2000/-ක ආධාර සැපයීම සඳහා රු. මි. 2ක් වෙන් කර ඇති අතර වැඩිහිටි නිවාස 3ක් සඳහා රු. මි. 0.46ක් ලබා දී ඇත.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණ 02 - සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම
- තිරසර සංවර්ධන අරමුණ 16 - තිරසර සංවර්ධන සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.

## ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ අභියෝග

- අස්ථාවර වෙළඳපල තත්ත්වය හේතුවෙන් නිතර නිතර භාණ්ඩ හා සේවා වල මිල අධික ලෙස ඉහළ යාම.
- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ඉහත තත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- වැඩිහිටියන් සඳහා ඩිජිටල් සාක්ෂරතාව ප්‍රවර්ධනය හා ආර්ථිකයට වැඩිහිටියා දායක කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය.
- වැඩිහිටි සුව සරණ රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.

# 6.3.6 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

### හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මගින් ස්ථාපිතව ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

### අරමුණු

- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන් මියගියවිට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයින් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.

### උපාය මාර්ග

- එක් එක් ඉලක්කගත කණ්ඩායම් (නාවිකයන්, විගමණික ශ්‍රමිකයන්, පතල් කම්කරුවන්, වතු ආශ්‍රිත සේවක ප්‍රජාව, ආදී) ඉලක්ක විගමණික කර ආකර්ෂණීය ප්‍රතිලාභවලින් සමන්විත නව විශ්‍රාම වැටුප් සැලසුම් සකස් කර හඳුන්වාදීම.
- කාර්යක්ෂම පාරිභෝගික සේවයක් සැපයීම සඳහා නව විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධති හඳුන්වාදීම සහ ප්‍රශස්ථ වූ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් ප්‍රතිලාභ හිමිගැන්වීම සරල, විධිමත් හා කඩිනම් කිරීම.
- පාසැල් ශිෂ්‍ය ප්‍රජාව තුළ සමාජ ආරක්ෂණය සහ එහි වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම.
- තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම හා පෙළඹවීම සඳහා වෘත්තීය පුහුණු ආයතන හා ඒකාබද්ධව තරුණ කණ්ඩායම් ඉලක්ක කර දිරිමත් කිරීමේ, දැනුවත් කිරීම සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවාගැනීම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මගින්.

- සමස්ත සමාජ ආරක්ෂණ වැඩසටහන් සියල්ලම එකම ආයතනයක් යටතට පත් කිරීම.
- පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- වාණිජ බැංකු සහ සුපිරි වෙළඳසැල් මගින් ප්‍රතිලාභ ගෙවීමේ සහ වාරික රැස්කිරීමේ අවස්ථාව ලබාදීම මගින් පාරිභෝගික දුරස්ථභාවය අවම කිරීම.
- මණ්ඩලය සම්බන්ධීකරණයෙන් සාමාජිකත්වය ලබා ගනු ලබන පුද්ගලයන්ට රාජ්‍ය වාණිජ බැංකු මගින් ණය මුදලක් ලබා දීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු. මි.) | 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|
| පුනරාවර්තන | 135.40 | 103.68 | 31.72 |

## 2022.09.30 දක්වා අත්කරගත් නිමවුම් හා ලබාගත් ජයග්‍රහණ

### සාමාජික බඳවාගැනීම් ප්‍රගතිය

විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා සාමාජික බඳවාගැනීම් ප්‍රගතිය

| වර්ෂය | සාමාජික බඳවාගැනීම් ප්‍රගතිය | වටිනාකම (පළමු වාරිකය) (රු.මි.) |
|---|---|---|
| 1996.01.01 – 2021.12.31 | 834,796 | 641.34 |
| 2022.01.01 – 2022.09.30 දක්වා | 16,788 | 46.67 |
| **එකතුව** | **851,584** | **688.01** |

### 2022.01.01 – 2022.09.30 දක්වා ප්‍රතිලාභ ගෙවීම

| විස්තරය | සාමාජික සංඛ්‍යාව | වටිනාකම (රු. මි.) |
|---|---|---|
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 33,690 | 281.99 |
| මරණ පාරිතෝෂික ගෙවීම් | 33 | 1.23 |
| අර්ධ අබාධිත පාරිතෝෂික ගෙවීම් | - | - |
| පූර්ණ ආබාධිත මාසික දීමනා | 53 | 0.34 |
| අතිරේක ප්‍රතිලාභ ((5 වසර ශිෂ්‍යත්ව, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස. (උ/පොළ)) | 353 | 4.08 |
| **එකතුව** | **34,129** | **287.30** |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල වෙනත් සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

- සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් 16,788ක් බඳවා ගැනීම.
- අක්‍රිය සාමාජිකයන් නැවත සක්‍රිය කිරීම සඳහා නව ව්‍යාපෘතිය මගින් අක්‍රිය සාමාජිකයන් 22ක් නැවත සක්‍රිය කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් 1,288 ක් පැවැත්වීම.

- පරිගණකගත නව විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීමට අවශ්‍ය විස්තරාත්මක පිරිවිතර වාර්තාව (DSR) සැකසීම අවසන් කිරීම.
- ස්වයං රැකියා සඳහා තරුණයින් දිරිමත් කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් 3ක් පැවැත්වීම.
- පාසල් සිසුන් තුළ සඳහා සමාජ ආරක්ෂණය සහ එහි වැදගත්කම ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- සමාජ මාධ්‍ය ජාලා, රූපවාහිනී හා ගුවන් විදුලි දැන්වීම් ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා හරහා ප්‍රවෘත්ති ආවරණය, රූපවාහිනි සාකච්ඡා හා පුවත්පත් ලිපි යන ක්‍රම මඟින් විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය.
- විදේශ සේවා නියුක්තිකයින් සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.
- භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් වෙත නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.
- නාවිකයින් වෙත නව සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.
- කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කලාකරුවන් 85 ක් බඳවාගැනීම.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණ 16 - තිරසර සංවර්ධන සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.

## ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

- විශ්‍රාම වැටුපක අවශ්‍යතාවය සම්බන්ධව ජනතාවගේ ඇති දැනුවත්භාවය සහ අවබෝධය ප්‍රමාණවත් නොවීම.
- යෝජනා ක්‍රම සඳහා සාමාජික වුවද නියමිත පරිදි වාරික නොගෙවීමෙන් අක්‍රිය සාමාජික ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම සහ එහිදී සක්‍රිය සාමාජික ප්‍රතිශතය ඉහල අගයක පවත්වා ගැනීමට සාමාජික මුදල් සඳහා රාජ්‍ය මට්ටමින්, සේවා යෝජක පාර්ශවයෙන්, රාජ්‍ය නොවන සංවිධාන වැනි බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන දායකත්වය පහළ මට්ටමක පැවතීම හේතු වීම.
- ජනතාව සඳහා අප රට තුළ සමාජ ආරක්ෂණය අනිවාර්ය නොවීම.
- විවිධ වූ ක්ෂේත්‍රයන් ඉලක්ක කර ගනිමින් ආයතනික මට්ටමින් විශ්‍රාම වැටුප් ක්‍රම හඳුන්වාදීම.
- තරඟකාරී ප්‍රතිලාභ සහිත යෝජනා ක්‍රම හඳුන්වාදීම සඳහා නෛතික බාධා පැවතීම සහ ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි වෙන් නොවීම.
- කාර්යමණ්ඩල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීම සහ ඒ සඳහා බඳවාගැනීම් සිදු කිරීමට නීතිමය බාධාවන් පැවතීම.

- වර්ෂයේ මුල් මාස 8 තුළ පැවති, කොවිඩ් වසංගතය සමග පැවති සංචරණ සීමාවන් සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් ක්ෂේත්‍ර කටයුතු සඳහා බාධාවන් පැමිණීම.
- අධික උද්ධනමය නිසා ගිවිසගත් විශ්‍රාම වැටුප් සැලසුම්වල මූර්ත අගය පහළ වැටීම.
- ආර්ථික අර්බුදය හේතුවෙන් පුද්ගල ඉතුරුම් අඩුවීම.

**යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති**

- වෙළඳ නාවිකයින් සඳහා "නාවිකයා" නමින් නව සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- "බුදුපුත් මාපිය හරසර" නමින් ශාසනය වෙනුවෙන් තම දරුවන් භාරදුන් භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් සඳහා හඳුන්වාදුන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- "මනුසවි" නමින් විදේශ සේවා නියුක්තිකයින් සඳහා හඳුන්වාදුන් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ඒ අනුව ළමා කාලයේ සිටම සම්පත් කළමනාකරණය, සමාජ ආරක්ෂණය සහ එහි වැදගත්කම, යැපුම් මානසිකත්වයෙන් මිදීම,සෑම වෘත්තීයක් සඳහාම නිසි වෘත්තීය ගරුත්වය ලබාදීම වැනි තත්ත්වයන් පිළිබඳව පාසැල් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- සමාජ ආරක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම.
- සුපිරි වෙළෙඳසැල් හා පෞද්ගලික බැංකු මඟින් වාරික ගෙවීමේ අවස්ථා ඇති කිරීම.
- මැණික් හා පතල් කාර්මිකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.
- වැවිලි කර්මාන්තය ආශ්‍රිත සේවා නියුක්තිකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වාදීම.
- ධීවර කාර්මිකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.

# 6.3.7 ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

### හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council) මගින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම සිදු කරයි.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා නම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. පරිපාලන හා මුදල් අංශය

### අරමුණු

- සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩසටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අමාත්‍යවරයාට සහය ලබා දීම.
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.
- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.
- සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- සමාජ සුභසාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ කළමනාකාරීත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබාගැනීමට සැලැස්වීම.
- ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

## උපායමාර්ග

- සමාජ වැඩ වෘත්තියවේදී අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
- සමාජ වැඩ පිළිබඳ දේශීය හා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- සමාජ වැඩ, සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළකිරීම.
- සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
- සමාජ සුභසාධන කටයුතු වල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම.

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු.මි.) | 2021.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 80.00 | 48.30 | 31.70 |
| පුනරාවර්තන | 126.00 | 92.88 | 33.12 |
| **එකතුව** | **206.00** | **141.18** | **64.82** |

## ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදුව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් අවසන් කිරීමට නියමිතය. මෙම ගොඩනැගිල්ල A හා B ලෙස කොටස් දෙකකින් සමන්විතය.

| ඇස්තමේන්තුගත මුළු වියදම (රු. මි.) | 2017.01.01 සිට 2021.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022 වර්ෂය සඳහා අනුමත අයවැය (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2017.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.09.30 දක්වා භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1,000.00 | 750.45 | 60.00 | 48.30 | 798.75 | A කොටස - (97.1%)<br>▪ 3 වන මහලේ ඇළුමිනියම් හා සිවිලිම් වැඩ සිදු කිරීම<br>▪ විදිලි උපාංග හා ගිනි නිවීමේ උපාංග සවි කිරීම<br>▪ පිටත බිත්ති කපරාරු කිරීමට හා තීන්ත ගෑම<br>▪ ශ්‍රවණාගාරයේ ධවනි පැනල හා ලී වේදිකාව සකස් කිහීම<br>▪ 1 වන හා 3 වන මහලේ නාන කාමරවල බිත්ති සහ පොළව ටයිල් කිරීම<br>▪ වැසි ජලය බැහැර කිරීමට කානු පද්ධතිය කැනීම<br>▪ පිටත අගුවේ සිවිලිම සකස් කිරීම |
| | | | | | B කොටස - (100%)<br>▪ ගිනි ආරක්ෂණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම |

## භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

සමාජ සේවා විද්‍යාලය මගින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා

| **ව්‍යාපෘති අංක 01** | **සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව** |
|---|---|

1. වසර 04ක පූර්ණ කාලීන උපාධි පාඨමාලවකි. 2017/2018, 2018/2019 යන වසර සඳහා ඉංග්‍රීසි භාෂාවෙන්ද 2019/2020 (E, S, T), 2020/2021 (E, S, T) යන වසර සඳහා ඉංග්‍රීසි, සිංහල, දෙමළ භාෂාවෙන්ද දේශන පැවැත්වීම සහ ක්ෂේත්‍ර පුහුණුව, ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සිදුකරයි. සියලුම අධ්‍යයන අංශ වල මුලු ශිෂ්‍ය සංඛ්‍යාව 968කි.
2. 2021/2022 අධ්‍යන වර්ෂයට අදාලව පළමු අධ්‍යයන වාරය ආරම්භ කර ඇත. සියලුම අධ්‍යයන අංශ වල මුලු ශිෂ්‍ය සංඛ්‍යාව 448කි.

| **ව්‍යාපෘති අංක 02** | **සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල හා දෙමළ මාධ්‍යය)** |
|---|---|

2018/2019, 2019/2020 යන වසර සඳහා දේශන පැවැත්වීම සහ ක්ෂේත්‍ර පුහුණුව, ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සිදුකරයි. සියලුම අධ්‍යයන අංශ වල මුලු ශිෂ්‍ය සංඛ්‍යාව 89කි.

පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

| **ව්‍යාපෘති අංක 01** | **කෙටි කාලීන පුහුණු පාඨමාලා පැවැත්වීම** |
|---|---|

මේ යටතේ අනෙකුත් දෙපාර්තමේන්තු වල ඉල්ලුම මත පදනම්ව සිදු කරනු ලබන කෙටි කාලීන පුහුණු වැඩසටහන් හා ග්‍රාමීය මධ්‍යස්ථාන වල පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා රු. මි. 0.21 වෙන් කර ඇති අතර රු. මි. 0.09ක වියදමක් දරා ඇත. පුද්ගලයින් 778කගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 15ක් පවත්වා ඇත.

| **ව්‍යාපෘති අංක 02** | **ක්ෂේත්‍ර අධ්‍යයනය** |
|---|---|

මේ යටතේ ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රයෝගික අත්පොත සිංහල භාෂාවට පරිවර්ථනය කිරීම අවසන් කර ඇති අතර ක්ෂේත්‍ර වැඩ අධීක්ෂණ වැඩමුළු පැවැත්වීමට අදාලව පීය අධීක්ෂකවරුන් සඳහා වැඩසටහන් 2ක් පවත්වා ඇත. රු. මි. 0.12ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

| **ව්‍යාපෘති අංක 03** | **උපදේශන පිළිබඳ නව උපාධි වැඩසටහනක් හඳුන්වා දීම.** |
|---|---|

උපදේශන පිළිබඳ නව උපාධියක් හඳුන්වා දීමට කටයුතු සිදු කරමින් පවතින අතර යෝජනාවේ පිටපත් 03ක් අනුමැතිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට සැලසුම් කරඇත. රු. මි. 0.17ක් වෙන් කර ඇත. වියදම රු. මි. 0.05කි.

පර්යේෂණ හා ප්‍රකාශන අංශය මගින් සිදුකරන ලද පර්යේෂණ හා නිකුත් කරන ලද ප්‍රකාශන

| **ව්‍යාපෘති අංක 01** | **සමාජ වැඩ පිළිබඳ ප්‍රකාශන නිකුත් කිරීම**<br>1. සමාජ වැඩ පිළිබඳ සඟරාව (ද්විවාර්ෂික)<br>2. සමාජ සංවර්ධනය පිළිබඳ සඟරාව (ද්විවාර්ෂික)<br>3. සමාජ වැඩ පිළිබඳ විද්‍යුත් සඟරාව (ද්විවාර්ෂික)<br>4. සමාජ වැඩ පිළිබඳ ශිෂ්‍ය සඟරාව<br>5. ප්‍රවෘත්ති ලිපි ප්‍රකාශයට පත් කිරීම (ද්විවාර්ෂික) |
|---|---|

සියලු රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශ ඉලක්ක කර ගනිමින් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සියලු අංශවල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය හා ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රකාශයට පත් කිරීම මෙහිදී සිදුවේ. ද්විවාර්ෂිකව ඉදිරිපත් කරන සඟරා හා ලිපි වලට අදාලව

පළමු වෙළුම නිකුත් කර ඇත. සමාජ වැඩ පිළිබඳ ශිෂ්‍ය සඟරාවට අදාලව ලිපි සංස්කරණය කරමින් පවතී. මෙම වැඩසටහන සඳහා රු. මි. 0.10 වෙන්කර ඇත.

| ව්‍යාපෘති අංක 02 | පොත් එළිදැක්වීම සහ බුද්ධිමය කතිකාවතක් පැවැත්වීම. |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 0.05 වෙන්කර ඇති අතර පොත් 5ක් එළිදැක්වීමට කටයුතු සැලසුම් කර ඇත. විද්වතුන් 200කගේ සහභාගීත්වයෙන් බුද්ධිමය කතිකාවතක් පැවැත්වීමට අදාල කටයුතුද සැලසුම් කර ඇත.

| ව්‍යාපෘති අංක 03 | සමාජ සංවර්ධනය පිළිබඳ උපාධිය සඳහා විෂයමාලා සංවර්ධනය. |
|---|---|

සමාජ සංවර්ධනය පිළිබඳ උපාධිය සඳහා විෂයමාලා සංවර්ධනය කිරීමට අදාලව සාකච්ඡා පවත්වා සංකල්ප පත්‍රිකා සකස් කරමින් පවතී. මෙම වැඩසටහන සඳහා රු. මි. 0.05 වෙන්කර ඇත.

| ව්‍යාපෘති අංක 04 | කාලීන අවශ්‍යතා හා ගැටලු පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම<br>1. කොවිඩ්-19 රෝගයෙන් සුවය ලැබූ පුද්ගලයන් ඔවුන්ගේ අන්තර් සබඳතා පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටලු<br>2. COVID 19 සෞඛ්‍ය සේවා සහ අපද්‍රව්‍ය කළමනාකරණයේ පාරිසරික බලපෑම, අනාගතය සඳහා සමාජ ඔරොත්තු දීමේ හැකියාව<br>3. ආපදා ඇතිවීම, අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි අංශ කෙරෙහි ඇතිකරන බලපෑම්<br>4. සමාජ ප්‍රතිපත්ති ප්‍රකාශනය - II ප්‍රකාශයට පත් කිරීම |
|---|---|

මෙම පරීක්ෂණයන්ට අදාලව දත්ත එකතු කිරීම, සාකච්ඡා පැවැත්වීම සිදු කරමින් පවතින අතර සඳහා රු. මි. 0.10 වෙන්කර ඇත.

| ව්‍යාපෘති අංක 05 | මාර්ගගත ක්‍රමය ඔස්සේ සමාජ සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම. |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 0.05 වෙන්කර ඇති අතර 100කගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය පවත්වා අවසන් කර ඇත.

## මුදල් අයකරමින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා/ පුහුණු වැවසටහන්

සමාජ සේවා විද්‍යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා

| ව්‍යාපෘති අංක 01 | සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලා MSW |
|---|---|

2018/2019 (ඉංග්‍රීසි, සිංහල, දෙමළ), 2019/2020 (ඉංග්‍රීසි), 2020/2021 (ඉංග්‍රීසි, සිංහල, දෙමළ) යන අධ්‍යයන වර්ෂයන්ට අදාලව අයවිය යුතු මුදල රු. මි. 15.00කි. මේ වන විට රු. මි. 3.04ක මුදලක් අයවී ඇත. පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් සිසුන් 16 දෙනෙකු සඳහා වාචික පරීක්ෂණ පවත්වනු ලැබේ. සිසුන් 29 දෙනෙකු සඳහා පර්යේෂණ ව්‍යාපෘතිය සහ ක්ෂේත්‍ර පුහුණුව II ක්‍රියාත්මක වේ, සිසුන් 66 දෙනෙකු සඳහා ක්ෂේත්‍ර පුහුණුව පැවැත්වේ.

පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

| ව්‍යාපෘති අංක 01 | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා වැඩසටහන 2019/2020 |
|---|---|

ඩිප්ලෝමාධාරීන් 564 දෙනෙක් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදී. අයවිය යුතු මුදල රු. මි. 8.9 කි. මේ වන විට රු. මි. 0.08ක මුදලක් අයවී ඇත.

| ව්‍යාපෘති අංක 02 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව |
|---|---|

2020/2021, 2021/2022 යන අධ්‍යයන වර්ෂයන්ට අදාලව ජාතික සමාජ සංවර්ධන ආයතන ප්‍රධාන කාර්යාලය/ තලාව/ රන්න/ කිලිනොච්චිය හා අම්පාර යන මධ්‍යස්ථාන වල දේශය පවත්වනු ලබයි.

2022/2023 යන අධ්‍යයන වර්ෂයට අදාලව ශිෂ්‍යයන් ලියාපදිංචි වීම සිදුකරමින් පවතී. රජයේ නිලධාරීන් සහ අ.පො.ස. (උ.පෙළ) සමතුන් ඇතුළුව සියලුම අධ්‍යයන වර්ෂ වල මුලු ශිෂ්‍ය සංඛ්‍යාව 1,100 කි. පාඨමාලාව සඳහා අයවිය යුතු මුදල රු. මි. 25.30 කි. මේ වන විට රු. මි. 6.12ක මුදලක් අයවී ඇත.

| ව්‍යාපෘති අංක 03 | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව |
|---|---|
| 2022/2023 අධ්‍යයන වර්ෂයන්ට අදාලව සිසුන් 27 දෙනෙකු සඳහා දේශන පවත්වනු ලබයි. පාඨමාලාව සඳහා අයවිය යුතු මුදල රු. මි. 2.00 කි. මේ වන විට රු. මි. 0.42ක මුදලක් අයවී ඇත. | |

| ව්‍යාපෘති අංක 04 | ළමයින් ඉලක්ක ගත කර ගනිමින් ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව |
|---|---|
| සිසුන් 19 දෙනෙකු සඳහා දේශය පවත්වනු ලබන අතර පාඨමාලාව සඳහා අයවිය යුතු මුදල රු. මි. 0.21කි. | |

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.
- තිරසර සංවර්ධන අරමුණ 08 - සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම.
- සමාජ වැඩ වෘත්තිය සඳහා පිළිගැනීමක් ඇතිකිරීමට කටයුතු කිරීම සඳහා UNICEF ආයතනයේ අනුග්‍රහයෙන් කටයුතු කිරීම.
- ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමට කටයුතු කිරීම.

# 6.3.8 ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## හැඳින්වීම

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 1974 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර මෙය 1978 වර්ෂයේදී ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ නැතහොත් කොන් වූ දිළිඳු ප්‍රජාව සතු විභව ශක්තිය මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමුහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක නම් වූ කාර්යබද්ධ පුහුණු පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි.

නිෂ්පාදනයේදී, අලෙවියේදී, පරිභෝජනයේදී සහ ණය ක්‍රියාවලියේදී දිළිඳු ප්‍රජාව මුහුණපාන අවාසිදායක තත්ත්වයට වඩා වාසිදායක තත්වයක් බවට සහමුලින්ම පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ කාර්යභාරයකි. අත්හදා බැලීම තුළින් කාර්යබද්ධව ඉගෙනීමේ ක්‍රියාවලිය සමාජ සජීවීකරණය නම් වැඩිහිටි අධ්‍යාපන නව ක්‍රමවේදය මේ සඳහා භාවිත කරයි. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පසුකාලීනව ශ්‍රී ලංකාව තුළ ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ක්‍රියාත්මක සියලුම ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සඳහා ගලපා ගන්නා ලදි.

මෙකී කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ඔස්සේ සංවර්ධනය කරන ලද පුහුණු මාදිළි 12 ක් ඔස්සේ ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනයේ නියුතු රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධාන වැඩකරුවන් සඳහා අභ්‍යාසකරණය තුළින් ඔවුන් සවිබලගැන්වීම සිදුකරනු ලබයි.

## අරමුණු

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමනාකරණය
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළනැංවීම
- නවෝත්පාදන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම

## උපාය මාර්ග

- ඉලක්කගත ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ යෑම.
- ප්‍රතිපත්ති සම්පාදකයින් /සංවර්ධනවේදීන් සඳහා තොරතුරු සම්පාදනය.
- සේවා හා ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය වර්ධනය වීම.
- නව සංවර්ධන ප්‍රවේශයන් සමාජගත වීම.
- නව නිෂ්පාදන හඳුන්වාදීම තුළින් තාක්ෂණය ප්‍රචලිත වීම.
- ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජගත වීම

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 40.10 | 29.49 | 10.61 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | තෝරාගත් සෞභාග්‍යා ගම්මානයක සහභාගීත්ව ග්‍රාමීය ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම |
|---|---|

මෙම වැඩසටහන සඳහා රු. මි. 0.05ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර නිලධාරීන් 63 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 2ක් ක්‍රියාත්මක කර ඇත.

| ව්‍යාපෘති අංක 02 | සිද්ධි අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිතා කරන උපාය මාර්ග පිළිබඳ විමර්ශන අධ්‍යයනය |
|---|---|

මේ යටතේ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිතා කරන උපාය මාර්ග පිළිබඳ විමර්ශන පිළිබඳ අධ්‍යයනය, රජයේ ප්‍රතිපත්තියට අනුකූලව දිළිඳුකම පිටුදැකීම සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිද්ධි අධ්‍යයන සිදුකර ඇත.

| ව්‍යාපෘති අංක 03 | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
|---|---|

ක්ෂේත්‍ර පුහුණුකරුවන් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් 29ක් හා බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

| ව්‍යාපෘති අංක 04 | ප්‍රකාශන නිකුත් කිරීම |
|---|---|

ප්‍රජාශක්ති සඟරාවේ එක් විද්‍යුත් වෙළුමක් නිකුත් කර ඇත. සංවර්ධන පුවත් එක් වෙළුමක් වෙබ් ප්‍රකාශන හරහා නිකුත් කර ඇත.

| ව්‍යාපෘති අංක 05 | පුස්තකාල සංවර්ධනය කිරීම |
|---|---|

මේ යටතේ ප්‍රකාශන 2,000ක් සඳහා වර්ණ කේත පද්ධතිය යොදවා ඇත.

| ව්‍යාපෘති අංක 06 | කාලීන අවශ්‍යතා මත පර්යේෂණ සිදු කිරීම |
|---|---|

මේ යටතේ ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ආසියානු හා අප්‍රිකානු රටවල් ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන් පිළිබඳ ද්විතියික දත්ත පදනම් කරගෙන සිදු කරන ලද පර්යේෂණය ( රටවල් 06 ක් ඇසුරින්)

- ❖ ආයතනයේ දේශන ශාලා හා නේවාසිකාගාර පුහුණුව සහ නවාතැන් සඳහා බාහිර ආයතන වෙත ලබා දීමෙන් රු. මි. 1.42ක් ආදායමක් ලබා ඇත.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.
- තිරසර සංවර්ධන අරමුණ 16 - තිරසර සංවර්ධන සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.

## ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ඉහත තත්ත්වයන් මත ක්‍රියාත්මක සැලැස්ම විටින් විට වෙනස් වීම.

## යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි ආයතනය විසින් සකසන ලද පුහුණු මාදිලි 12 ක් ඔස්සේ ප්‍රාදේශිය හා ග්‍රාමීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හා ප්‍රජා සංවිධාන ක්‍රියාකාරීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කාලීන සමාජ ආර්ථික ප්‍රවණතා ආවරණය කරමින් සමාජ පර්යේෂණ 02 ක් ක්‍රියාත්මක කිරීම.
- මෑත කාලයේ අඩු ආදායම්ලාභින් සඳහා ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන්හි ඵලදායිතාව සොයා බැලීමේ සමීක්ෂණ දෙකක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාව සවිබලගැන්වීම සඳහා ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් ඇසුරින් සිද්ධි අධ්‍යයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාව සවිබලගැන්වීම උදෙසා කටයුතු කරන සංවර්ධනවේදීන්, පර්යේෂකයින්, සංවර්ධන ක්‍රියාකාරීන් වෙත සංවර්ධන ක්‍රමෝපායන් හා සංවර්ධන පුවත් පිලිබඳ දැනුම බෙදා හැරීමේ අරමුණින් ප්‍රකාශන එළි දැක්වීම.
- පුහුණු පහසුකම් හා නේවාසිකාගාර පහසුකම් වැනි බාහිර සේවා සැපයීම මඟින් ආදායම් උපයා රාජ්‍ය ආදායමට බැර කිරීම.



# 6.3.9 උපදේශන අංශය

### හැඳින්වීම

2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් එවකට පැවති කාන්තා අභිවෘද්ධි හා සමාජ සුබසාධන අමාත්‍යාංශය යටතේ උපදේශන අංශය නමින් අංශයක් ස්ථාපිත කර 2005 වර්ෂයේ නව උපාධිධාරීන් බඳවා ගැනීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව, දෙපාර්තමේන්තු ගත තනතුරක් ලෙස "උපදේශන සහකාර" නමින් නිලධාරීන් බඳවා ගනිමින් උපදේශන මැදිහත්කරණ කාර්යය පුළුල් කර ඇත.

ඒ අනුව, වරින් වර විවිධ ප්‍රතිපත්ති යටතේ බඳවාගෙන මේ වනවිට සේවය කරන උපදේශන නිලධාරින් සංඛ්‍යාව 210කි. ඔවුන්, ප්‍රධාන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලටත් අනුයුක්තව උපදේශන සේවා සැපයීම සිදු කරයි.

### අරමුණු

- ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම අවම කිරීම
- දිළිඳු ප්‍රජාව ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම් කටයුතු ශක්තිමත් කිරීම සඳහා මානසිකව බලගැන්වීම
- උපදේශන ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් භාවිතා කරමින් ගුණාත්මක උපදේශන සේවාවක් සැපයීම
- උපදේශන සේවයේ නියුතු වෘත්තිකයන් අතර විධිමත් සහසම්බන්ධතාවක් ඇති කිරීම
- උපදේශන සේවා ලබාදීම පිළිබඳ අධීක්ෂණය හා මඟපෙන්වීම

### උපාය මාර්ග

- නිෂ්පාදන ගම්මානවල ප්‍රතිලාභීන් ආර්ථික සවිබලගැන්වීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල තිරසරභාවය පවත්වා ගැනීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය සිදු කිරීම
- මනෝ සමාජයීය ගැටලු අවම කිරීම සඳහා සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීම
- ස්වභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා ව්‍යසන උපදේශන සායන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මනෝවිද්‍යා උපදේශනය, මනෝ ප්‍රතිකාර හා එහි ප්‍රතිලාභ පිළිබඳ රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා නායකයින්, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුවරුන්, දෙමාපියන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, යෞවන යෞවනියන් හා සමෘද්ධි ප්‍රතිලාභීන් දැනුවත් කිරීම තුළින් උපදේශන සේවා ව්‍යාප්ත කිරීම
- උපදේශන සේවාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම
- උපදේශන සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම

- උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට උපදේශන නිලධාරින්ගේ සේවය ලබාදීම (රෝහල්, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන්සේවා සමාගම)
- උපදේශන විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක හා දැනුම ප්‍රවර්ධනය සඳහා ප්‍රකාශන නිකුත් කිරීම (සිංහල හා දෙමළ මාධ්‍ය)

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය

භාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | අනුමත වාර්ෂික අයවැය (රු.මි.) | 2021.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2022.10.01 සිට 2022.12.31 දක්වා අපේක්ෂිත මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 10.00 | 4.06 | 5.94 |

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | ප්‍රජාව ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමේ දී මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරු වූවන් සඳහා මනෝවිද්‍යාක්මක උපදේශන මැදිහත්කරණ වැඩසටහන් පැවැත්වීම |
|---|---|

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක මෙම වැඩසටහන සඳහා රු. මි. 6.78ක් වෙන් කර ඇති අතර වැඩසටහන් 191ක් පවත්වා රු. මි. 1.98ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| ව්‍යාපෘති අංක 02 | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා උපදේශන සායන ලෙස මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්වීම් වැඩසටහන් පැවැත්වීම. |
|---|---|

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල නිෂ්පාදන කාර්යයේ නියැලෙන්නන් හා අඩු අදායම්ලාභී ප්‍රජාව මෙන්ම ඔවුන්ට සේවා සපයන රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කරගනිමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් උපදේශන සායන 133ක් පවත්වා ඇත. රු. මි. 0.15 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රු. මි. 0.11 මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| ව්‍යාපෘති අංක 03 | ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් උපදේශන කටයුතු සම්බන්ධීකරණය |
|---|---|

ප්‍රාදේශීය මට්ටමින් සේවය කරනු ලබන උපදේශන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුල මාසිකව ක්‍රියාත්මක වන අතර කාර්තුමය වශයෙන් අතිරේක ලේකම් හා අධ්‍යක්ෂ (උපදේශන)ගේ මුලිකත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. සාකච්ඡා 12ක් පවත්වා ඇති අතර රු. මි. 0.06ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රු. මි. 0.02ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| ව්‍යාපෘති අංක 04 | මාර්ගගත දත්ත ගබඩාවක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම |
|---|---|

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ මාර්ගගත දත්ත ගබඩාව පවත්වාගෙන යාම වෙනුවෙන් රු. මි. 0.94ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර රු. මි. 0.38ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| වයාපෘති අංක 05 | 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව විධිමත් ක්‍රමවේදයක් සහිතව ප්‍රතිනිර්මාණය කිරීම |
|---|---|

මනෝවිද්‍යාත්මක උපදේශන සේවාව අවශ්‍ය, නමුත් ඒ සඳහා ඍජුව යොමුවීමට අකමැති හෝ නොහැකි සේවාලාභීන්ට දුරකථන පහසුකම් ඔස්සේ මනෝවිද්‍යාත්මක උපදේශන සේවාවක් සැපයීම වෙනුවෙන් රු. මි. 0.08ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර රු. මි. 0.08ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත. දුරකථන ඇමතුම් 2,032ක් ලැබී ඇත.

| වයාපෘති අංක 06 | ජාතික උපදේශන දිනය සැමරීම |
|---|---|

සෑම වසරකම ඔක්තෝබර් 10 දිනෙන් ආරම්භ වන ලෝක මානසික සෞඛ්‍ය සතියට සමගාමීව ශ්‍රී ලංකාව තුළ ඔක්තෝබර් 15 දිනට යෙදී ඇති ජාතික උපදේශන දිනය මෙම වර්ෂයේදී ඔක්තෝබර් 14 දින පවත්වනු ලබයි. එහිදී, උපද්ශන වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විද්වත් දේශනයක් හා කතිකාවතක් සහිත ජාතික මට්ටමින් වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ සඳහා රු. මි. 0.50ක් වෙන් කර ඇත.

| වයාපෘති අංක 07 | නව තාක්ෂණික මෘදුකාංග සපයා ගනිමින් මනෝවිද්‍යාත්මක උපදේශන සේවාව සම්බන්ධීකරණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය |
|---|---|

උපදේශන අංශයේ නිලධාරීන් සඳහා තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කිරීම, අන්තර්ජාල සම්බන්ධතාව ලබා දීම, පරිගණක 2 ක් සහ වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීම සඳහා රු. මි. 0.96ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රු. මි. 1.03ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

| වයාපෘති අංක 08 | සිත්සරණ උපදේශන මධ්‍යස්ථාන ඉදිකිරීම/ ඉඩකඩ වෙන් කර ගැනීම/ නඩත්තු කටයුතු හා කාර්යාල උපකරණ මිල දී ගැනීම |
|---|---|

මනෝවිද්‍යා උපදේශන නිලධාරීන්ගේ කාර්යාල 17ක් සඳහා කාර්යාල උපකරණ ලබා දීම. රු. මි. 0.53ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රු. මි. 0.51ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

## 2022.09.30 දක්වා ක්‍රියාත්මක කල වෙනත් සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 2011 ක් ප්‍රතිලාභීන් 80,992 ක් උදෙසා පැවැත්වීම. (නායකත්ව, අධ්‍යාපන, පූර්ව විවාහ, ආතති කලමනාකරණය, ආකල්ප සංවර්ධනය ආදී වැඩසටහන්)

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම
- තිරසර සංවර්ධන අරමුණ 03 - නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම

### ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ අභියෝග

- වසර මුල අපේක්ෂා කල පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අක්මුදල් නිසි කලට වේලාවට නොලැබීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

### යෝජනා හා ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රජාව ආර්ථිකව සවිබල ගැන්විම සඳහා උපදේශන වැඩසටහන් පැවැත්විම. (25 -30 දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් )
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාවය පිළිබඳ මනෝවිද්‍යාත්මක උපදේශනය (යෞවන සමාජ තරුණ පිරිස)
- කාන්තාවන් සවිබල ගැන්විම සඳහා උපදේශන මැදිහත්කරණය (එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් අඩු ආදායම්ලාභි පවුල් 25ක්)
- ගැහැණු දරුවන් සවිබල ගැන්වීම සඳහා උපදේශනය (වයස අවුරුදු 16 ට අඩු)

## 6.3.10 විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් සිදුකරයි.

| ව්‍යාපෘති අංක 01 | ලෝක බැංකු ව්‍යාපෘතිවල අනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචක (Contingent Emergency Response Components – CERC) යටතේ මුදල් හුවමාරුව |
|---|---|

පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් බලපෑමට ලක් වූ අවදානම් සහිත කණ්ඩායම්වලට සහන සැලසීම සඳහා ලෝක බැංකු මූල්‍ය පහසුකම් යටතේ ඇති ආයෝජන ව්‍යාපෘතිවල අනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචක (Contingent Emergency Response Components – CERC) යටතේ 2022 මැයි මස සිට ජූලි මස දක්වා මුදල් හුවමාරු ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, නිත්‍ය දීමනා ලබන සමෘද්ධි ප්‍රතිලාභීන්, ආබාධ සහිත පුද්ගලයන්, නිදන්ගත වකුගඩු රෝගීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අමතර දීමනාවක්ද සහිතව මාස තුනක කාලය සඳහා මාසික දීමනා ලබාදෙන ලදී. තවද පොරොත්තු ලේඛනගතව සිටි පුද්ගලයන් සඳහා ද රුපියල් 5,000 ක මාසික දීමනාවක් ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2022 මැයි මස සිට ජූලි මස දක්වා මාස තුනක කාලය සඳහා ඉහත දීමනා ලබාදීම වෙනුවෙන් රුපියල් බිලියන 56.3 ක මුදලක් අනුමත කර ඇත.

මෙම ව්‍යාපෘතියට අදාල ගෙවීම් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. (මෙම ව්‍යාපෘතියට අදාල ගෙවීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු පිටු අංක. 14 - 16 ඇතුලත් වේ.)

| ව්‍යාපෘති අංක 02 | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය |
|---|---|

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ 2022 සැප්තැම්බර් සිට මාස තුනක කාලසීමාවක් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතියි. CERC ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද මුදල් හුවමාරු කාණ්ඩ සහ මාසික දීමනා, ව්‍යාපෘති කාලසීමාව තුළ, මෙම ව්‍යාපෘතියේ ණය සංරචකය යටතේ එලෙසම පවත්වාගෙන යාම අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශය මඟින් සිදු කරනු ලබයි.

ව්‍යාපෘතියේ ආධාර සංරචකය යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන, වැඩිහිටි නිවාස අළුත්වැඩියා කිරීම/ ඉදිකිරීම සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වාසස්ථාන සැපයීම සඳහා මූල්‍යාධාර ලබාගැනීමට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශය මඟින් සකස් කරමින් පවතියි.

**ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලදී.**

- තිරසර සංවර්ධන අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම
- තිරසර සංවර්ධන අරමුණ 03 - නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම

# 6.4 පාලන හා මෙහෙයුම් අංශ

## 6.4.1 පාලන අංශය

සමාජ සවිලබගැන්වීම් අංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛ වලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරිම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ.පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශ වලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- සමාජ සවිබලගැන්වීම් අංශයේ හා අංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාල ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- සමාජ සවිබලගැන්වීම් විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරිම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- යාමට අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙම අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මානව සම්පත් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් 2022 වර්ෂය තුල රු.මි. 1.2ක් වෙන් කර ඇති අතර 2022.09.30 වන විට රු.මි. 0.37ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඒ අනුව, පහත දැක්වෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා මාර්ගෝපදේශ පිළිබද එක් දින පුහුණු වැඩසටහන - නිලධාරීන් 62ක් සහභාගී වී ඇත.
- ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන
- ආධ්‍යාත්මික බුද්ධිය පිළිබඳ පුහුණු වැඩසටහන
- කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන
- ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

ඒ අනුව, 2020.09.30 දින වන විට නිලධාරීන්ගේ විෂායානුබද්ධ කුසලතා හා දැනුම වර්ධනය සඳහා වැඩසටහන් 5ක් යටතේ නිලධාරීන් 351 දෙනෙක් පුහුණු කර ඇත. එසේම තනි පුද්ගල පුහුණු වැඩසටහන් යටතේ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා නිලධාරීන් දෙදෙනෙක් යොමු කර ඇත.. වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය අලුත් කිරීමට ඒක් නිලධාරියෙකු සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

## 6.4.2 ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමගම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.
සමාජ සවිබලගැන්වීම් අංශයේ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩල වල ගිණුම් සුපරික්ෂණය සිදුකරනු ලැබේ.

## 6.4.3 අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත ඍජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය , කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## 6.4.4 සැලසුම් හා මෙහෙයුම් අංශය

සමාජ සවිබලගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් විෂය යටතේ සිදුවේ.

## 6.4.5 සංවර්ධන අංශ

සමාජ සවිබලගැන්වීම් අංශය හා අනුබද්ධ ආයතනයන සම්බන්ධීකරණය, මෙහෙයවීම, අධීක්ෂණය හා පාලනයට අදාල කටයුතු සඳහා සංවර්ධන අංශ 3 ක් ක්‍රියාත්මක වේ.

**ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන පිහිටුවීම**

සංවර්ධන II වන අංශය මඟින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වලට අවශ්‍ය සේවාවන් එකම තැනකින් ලබා දීම සඳහා ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන (One Stop Shops) පිහිටුවීම සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

රටේ දළ දේශිය නිෂ්පාදිතයට සැලකියයුතු දායකත්වයක් සපයන ක්ෂුද්‍ර මූල්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ජාතික ආර්ථිකයේ ප්‍රධාන තැනක් හිමිවේ. ක්ෂුද්‍ර මූල්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මිලියන 1.2 ක් පමණ රටතුළ ස්ථාපිත වී ඇති අතර එමගින් මිලියන 3 කට වඩා ජනතාවකට ජීවනෝපාය සලසයි. මෙම ක්ෂේත්‍රයේ ජනිත වී ඇති රැකියා ප්‍රමාණය රටේ සමස්ථ රැකියා ප්‍රමාණයෙන් 45% ක් පමණ වේ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දී පවත්නා අණ පනත්. විවිධ ආයතන මගින් ලබා ගත යුතු අනුමැතීන් හා බලපත්‍ර මූල්‍ය පහසුකම් සැලසීම ව්‍යාපාර යටිතල පහසුකම් සම්බන්ධීකරණය ආදී නීතිමය කටයුතු හේතුවෙන් හා ප්‍රමාද වීම් හේතුවෙන් ව්‍යවසායකයින් තම ව්‍යාපාර ලියා පදිංචි කිරීමට යොමු වීම ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය වේ. මෙම ව්‍යවසායකයින්ට අවශ්‍ය ව්‍යාපාර ලියාපදිංචිය ඇතුළු පහත සේවා ලබා දීම සම්බන්ධීකරණය සිදුකිරීමට දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් 25ම ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන ඇති කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

1. නීතිමය සේවා, පහසුකම් හා උපදේශනය
2. ධාරිතා හා හැකියා සංවර්ධනය
3. තාක්ෂණය හා නව නිපැයුම් සඳහා සහාය
4. ව්‍යවසායක හා කළමනාකරණ දැනුම ලබා දීම
5. මූල්‍ය පහසුකම් සඳහා යොමු කිරීම
6. වෙළඳපළ අවස්ථා හඳුන්වා දීම

ඒ අනුව යුරෝපා සංවර්ධන ආධාර යටතේ මොණරාගල, බදුල්ල, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වලද නෙදර්ලන්ත ආධාර යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආධාර යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද ස්ථාපිත කර ඇත. ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන සඳහා සංවර්ධන නිලධාරීන් 03 බැගින් නිලධාරීන් 75 ක කාර්යමණ්ඩලයක් සඳහා කළමනාකරන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඒ අනුව දැනට ස්ථාපිත කර ඇති මොණරාගල, බදුල්ල, මාතලේ, නුවරඑළිය, කිලිනොච්චිය හා අනුරාධපුරය දිස්ත්‍රික්ක සඳහා සංවර්ධන නිලධාරීන් 18 දෙනෙක් අනුයුක්ත කර ඇති අතර එම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ ද ලබා දී ඇත.

# 07. කාන්තා හා ළමා කටයුතු අංශය

# 7.1 හැඳින්වීම

“ශ්‍රී ලාංකීය අනන්‍යාත්වයෙන් හා ඵලදායී පුරවැසියන්ගෙන් යුතු, පවුලේ සතුට හා සමාජ සමානාත්මතාවය තහවුරු වූ තිරසර සංවර්ධිත සෞභාග්‍යමත් දේශයක්” යන දැක්මෙන් යුතුව අමාත්‍යාංශයේ කාන්තා හා ළමා අංශය ක්‍රියාත්මක වේ.

ඒ අනුව ප්‍රධාන මෙහෙවර වන්නේ කාන්තාවන්ගේ හා ළමුන්ගේ සංවර්ධනය හා යහපත උදෙසා අවශ්‍ය නීතිරීති හා ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, නියාමනය හා ඇගයීමයි. අලුතින් නීතිරීති හා ප්‍රතිපත්ති හඳුන්වාදීම හා ඒවා සංශෝධනය කිරීම, ආයතනික යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, පුහුණු ධාරිතා ඇතුළු මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය දත්ත හා තොරතුරු පවත්වාගෙන යාම, කළමනාකරණ තොරතුරු පද්ධති නඩත්තුව හා ජාලගතකිරීම, පර්යේෂණ, නියාමන හා ව්‍යාපෘති වැඩසටහන් ඇගයීමට ලක්කිරීම ප්‍රමුඛ කාර්යයන් වේ.

ඒ අනුව, ජාත්‍යන්තර සම්මුතීන් හා ජාතික ප්‍රමුඛතාවයන් සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශය කාන්තා හා ළමා ක්ෂේත්‍ර ඔස්සේ මෙම කාර්යභාරය ඉටු කරයි. ඒ අතර, කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කොට සැලකීමේ සම්මුතිය (CEDAW), කාන්තා ප්‍රඥප්තිය, තිරසර සංවර්ධන දර්ශක හා පාදක ප්‍රතිපත්තීන්, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය හා කාන්තා ළමා ක්ෂේත්‍රයේ ප්‍රගමනයන්ට දායක වන සියලු ප්‍රතිපත්තීන් හා සැලසුම් ද මීට අදාළ වේ.

ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව යන ආයතන/දෙපාර්තමේන්තු හරහා විවිධ කාර්යභාරයන් රැසක් ඉටු කරයි. 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව ප්‍රධාන සංවර්ධන හා සුභසාධන වැඩසටහන් වෙනුවෙන් රු.මි. 5858.630 ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත වෙන් කර තිබූ අතර, 2022 සැප්තැම්බර් 30 දින වන විට සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මි. 4510.051ක් වේ.

එමෙන්ම, ප්‍රාග්ධන වියදම වශයෙන් රු.මි 1,208.630 ක් වෙන්කර තිබූ අතර, එහි ප්‍රගතිය රු.මි. 1,032.411ක් වේ. රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා ශ්‍රී ලංකාවද මුහුණ දී සිටින ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හමුවේ ළමුන් හා කාන්තාවන් මුහුණ දෙන ගැටලුවල සංකීර්ණතා මතුවුව ද, ඒවා මඟ හැරීම සඳහා ජාත්‍යන්තර ආයතනවල ද මූල්‍ය හා තාක්ෂණික දායකත්වයෙන් විශේෂ වැඩසටහන ක්‍රියාවට නැංවීම අරඹා ඇත.

2023 වර්ෂය සඳහා නව ප්‍රවේශයන් ඔස්සේ ඍජුව, කෙටි හා දීර්ඝ කාලීනව ළමුන්ට හා කාන්තාවන්ට ප්‍රතිලාභ අත්වන කාර්යභාරයක් ඉටුකිරීමට කාන්තා හා ළමා කටයුතු අංශය කටයුතු යොදා ඇත.

# 7.2 ආයතන අනුව සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය

## 7.2.1 සංවර්ධන අංශය

### 1. ප්‍රධාන කාර්යභාරය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම දරණ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන හා විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ඇගයීම් සිදුකිරීම වේ.

### 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**2.1 දිස්ත්‍රික් සහ ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම**

දිස්ත්‍රික් සහ ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා වර්ෂයකට, දිස්ත්‍රික් 25 සඳහා රු.මි. 0.930ක ප්‍රතිපාදන නිදහස් කරනු ලබන අතර මෙම වර්ෂයේදී පළමු කාර්තු 3 සඳහා රු. මි. 0.699ක ප්‍රතිපාදන ලබා දී ඇත. එම කමිටු වාර්තා ගෙන්වා ගැනීම, ඒවායේ ජාතික මට්ටමින් සිදු කළ යුතු මැදිහත්වීම් වේ නම් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම හා පසුවිපරම් කටයුතු ද සිදු කෙරේ.

**2.2 එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) යටතේ වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් සඳහා වූ ව්‍යාපෘතිය (Gender and Women's Rights )**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කර කාන්තාවන් හා ගැහැනු දරුවන්ට එරෙහිව සිදුවන හිංසනයන් වළක්වාලීමටත් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙමින් සංවර්ධනයේ සමාන ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සැලසීමේත් අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

2022 වසරේ වැඩසටහන් සඳහා රු.මි.6.900ක ප්‍රතිපාදන මෙම UNFPA අරමුදල මඟින් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය මත ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සැලසුම් කළ වැඩසටහන් බොහොමයක් මාර්ගගත ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කෙරිණි.

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ තාක්ෂණික දායකත්වයෙන් හා අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට පත් වින්දිතයන් සඳහා අවශ්‍ය සේවාවන් වෙත යොමු කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත (Referral Guideline) භාෂා 3න්ම සකස් කර එය දිස්ත්‍රික්ක 24 හා (වව්නියාව හැර) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 327 වෙත බෙදා හරිමින් එහි ඇතුලත් කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීමට මාර්ගගත වැඩසටහන් 3ක් ගම්පහ, අනුරාධපුර හා කළුතර දිස්ත්‍රික්කයන් හි හා නිලධාරීන් කැඳවා කෑගල්ල, මහනුවර යන දිස්ත්‍රික්ක දෙකෙහි ද පවත්වන ලදී.

මාර්ගගත ක්‍රමය උපයෝගී කරගනිමින් ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා මාර්ගගත මෙවලම් භාවිතය (Zoom, Google Meet, Webex, Microsoft Teams) පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම සඳහා මාර්ගගත වීඩියෝ නිබන්ධන මාලාවක් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අධ්‍යයන අත්පොතක් ලෙස සකසා දිස්ත්‍රික්ක 24 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 327වෙත තැපැල් මඟින් බෙදාහැරීමට කටයුතු කරන ලදී.

අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම පිණිස ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සකස් කර ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම් කොට, එම ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රු.මි. 0.200 ක ප්‍රතිපාදන යැවීමට කටයුතු කර ඇති අතර ඒවායේ පසුවිපරම් කටයුතු ද සිදු කරනු ලැබේ.
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට පත් වින්දිතයන් සඳහා සේවා සැපයීමේ දී අවශ්‍ය වන හදිසි කළමනාකරණ පිරිවැය දැරීම වෙනුවෙන් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු.5000 බැගින් රු.මි. 1.800 ක ප්‍රතිපාදන දිස්ත්‍රික්ක 25 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 334 වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

### 2.3 ළමුන් සඳහා වූ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ දී අප අමාත්‍යාංශය වෙත රු. මි. 12.220ක සමස්ත ප්‍රතිපාදනයක් ලැබිණි. සංවර්ධන අංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අතර එම ප්‍රතිපාදන වෙන්කොට ගෙන වැඩසටහන් සිදුකරනු ලබයි.

#### 2.3.1 **සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් ( රු.මි. 2.185 )**

- නව යෞවන ගැහැනු දරුවන් අඩු වයස් ගැබ් ගැනීම්වලින් වැළැක්වීම උදෙසා උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 79 ක කාන්තා හා ළමා සංවර්ධන ඒකකවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- මෙම පුහුණු වැඩසටහන **"අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ කාන්තා හා ළමා සංවර්ධන ඒකකවල කාර්ය මණ්ඩලවල ධාරිතා වර්ධන පුහුණු මොඩියුලය"** පාදක කර ගනිමින් සිදු කල අතර එම පුහුණු මොඩියුලය එම පළාත්වල සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බෙදා දෙන ලදී.
- තවද, මේ වන විට එම පළාත්වල සියළුම දිස්ත්‍රික්කවල අඩු වයස් ගැබ් ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර කෑගල්ල, බදුල්ල, මොණරාගල, නුවරඑළිය, කුරුණෑගල, කළුතර, මාතලේ, රත්නපුර සහ යාපනය යන දිස්ත්‍රික්කයන් සඳහා ප්‍රතිපාදන ලබා දී පාසල් ළමුන් සඳහා වැඩසටහන් සිදු කර ඇත.

- ප්‍රජා මූලික සෞඛ්‍ය ප්‍රවර්ධන සංකල්පය මත ඒකාබද්ධ ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා දිස්ත්‍රික්ක 25 ක තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25 ක කාන්තා හා ළමා සංවර්ධන ඒකකවල ක්ෂේත්‍ර නිලධාරීන් සහ අමාත්‍යාංශ සම්පත්දායක සංචිතයේ නිලධාරීන් සඳහා රජරට විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව මගින් නේවාසික පුහුණුවීම් දෙකක් පවත්වන ලදී. තවත් වැඩසටහන් 5ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වා ඇත.

දැනට එම නිලධාරීන් විසින් තෝරා ගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස 25ක ප්‍රජා සංවර්ධන කටයුතු පහත මූලධර්ම 6 ඔස්සේ ප්‍රයෝගිකව සිදු කරමින් සිටී.

i. ප්‍රජාවේ විවිධ කණ්ඩායම් සමග සම්බන්ධ වීම.
ii. ක්‍රියාවලියක් ලෙස ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම.
iii. එම ප්‍රජා සංවර්ධන කටයුතුවල අයිතිය ප්‍රජාව සතු වීම.
iv. යටිතල සාධක හඳුනා ගැනීම. ( ප්‍රජාවට ඇති ගැටළු/ සතුට/ සුවතාවය සඳහා )
v. මෙම යටිතල සාධක ආමන්ත්‍රණය කිරීම සඳහා අදාල ක්‍රියාකාරකම් කිරීම.
vi. අදාල හා සංවේදී දර්ශක භාවිතයෙන් වෙනස්කම් මැනීම.

තවද සංවර්ධන අංශය විසින් මෙම ක්ෂේත්‍ර සඳහා මෙහෙයුම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන අතර මාසිකව එම ක්ෂේත්‍රවල ප්‍රගතීන් අමාත්‍යාංශය මඟින් ද අධීක්ෂණය කරනු ලබයි.

- අධි අවදානම් දරුවන් සිතියම්ගතකරණය (MVC Mapping)

අප අමාත්‍යාංශය විසින් මේ සඳහා මාර්ගෝපදේශයක් සකස්කර ඇති අතර අධි අවදානම් සහිත දරුවන් හඳුනා ගැනීම හා එම අවදානම් සහිත සාධක මැඩලීම මඟින් එම දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විධිමත් හා ක්‍රමානුකූල ප්‍රවේශයක් රාජ්‍ය ආයතන මඟින් අනුගමනය කරවීම මෙහි ප්‍රධාන අරමුණයි.

කෑගල්ල, පුත්තලම, රත්නපුර, කුරුණෑගල, මහනුවර, කළුතර, කොළඹ, යාපනය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාසවල නියමු ව්‍යාපෘතීන් සිදු කල අතර එම දිස්ත්‍රික්කවල අදාල ක්ෂේත්‍ර නිලධාරීන් මේ සඳහා පුහුණු කර ඇත.

### 2.3.2 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - (රු. මි. 2.015)

- අවදානම් සහගත තත්ත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුලින් මූල්‍ය හා මූල්‍ය නොවන සහායයන් සැලසීමට අදාලව සත්කාර (ආරක්ෂණ) සැලසුම් 14ක් දැනට නිම කර ඇත.
- නිවුන් දරු ආධාර වැඩසටහන යටතේ පවුල් 34 ක් සඳහා දැනට ආධාර ලබා දී ඇත.

- ආර්ථික අපහසුතා ඇති ළමුන් සඳහා පාසල් උපකරණ ලබාදීම වෙනුවෙන් සම්පත් සංචිතයක් පිහිටුවීම යටතේ දිස්ත්‍රික්ක 25 වෙත ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම වසරේදී අතැති බිල්පත් සඳහා දිස්ත්‍රික්ක 4කට රු.මි. 0.488 ක ප්‍රතිපාදන ලබා දී ඇත

### 2.3.3 මුල් ළමාවිය සංවර්ධනය පිලිබඳ ජාතික ලේකම් කාර්යාලය (රු. මි. 4.000)

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා 06ක් ඔස්සේ විනාඩි 30 බැගින් සති අන්තයේදී විකාශනය කරන ලද රූපවාහිනී සම්මුඛ සාකච්ඡා වැඩසටහන් 6 ක් සඳහා රු.මි. 1.166ක මුදලක් ගෙවීම් කොට ඇත.
- සමාජ මාධ්‍ය භාවිතා කරමින් ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණ ඇතිව මුල් ළමාවිය අධ්‍යාපනය සහ ආරක්ෂාවට අදාලව විනාඩි 3-5 දක්වා වූ වීඩියෝ වාර්තා වැඩසටහන් 5ක් නිෂ්පාදනය කල අතර ඒ සඳහා රු.මි. 1.963 ක මුදලක් ගෙවීම් කර ඇත.
- රු.මි. 0.350 ක ඉතිරි මුදල 2021 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම යටතේ රත්නපුර, මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ළමා නිවාසයන්හි ළමා මිතුරු පරිසර සකස් කිරීමේ වැඩසටහනෙහි අතැති බිල්පත් පියවීම සඳහා යොදා ගන්නා ලදී.

### 2.3.4 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (රු.මි. 4.000)

- ළමා සහභාගීත්වය තුළින් පාසල් ළමා ආරක්ෂක කමිටු සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ විශේෂ වැඩසටහන් වෙනුවෙන් අම්පාර, මඩකලපුව, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, නුවරඑළිය, ත්‍රිකුණාමලය, වව්නියාව යන දිස්ත්‍රික්කවල ප්‍රා.ලේ.කාර්යාල වෙත ප්‍රතිපාදන යවා ඇත.
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සයිබර් නිරීක්ෂණ ඒකකයේ ක්‍රියාකාරීත්වය එනම්, ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා අන්තර්ජාල ද්වාරය නිර්මාණය කිරීමේ කර්තව්‍යයේ පරිපාලන කටයුතු සිදුවෙමින් පවතී.

## 2.4 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බහු පාර්ශවකරුවන්ගේ ශක්‍යතා ඉහල නැංවීමේ ව්‍යාපෘතිය (UNDP) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ ඉහත සැලැස්ම පිළිබඳ 2021 වර්ෂයේදී UNDP හි තාක්ෂණික සහාය ඇතිව සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන හවුල්කරුවන් සම්බන්ධ කර ගනිමින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සහභාගීත්ව සමාලෝචනයක් සිදුකරන ලදී. ඒ අනුව, ජාතික ක්‍රියාකාරී සැලැස්මේ නියම කර ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 67% කට ආසන්න ප්‍රමාණයක් බව අනාවරණය විය.

2023 - 2027 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම ආමන්ත්‍රණය කිරීම සඳහා UNDP සහ UNFPA සමඟ එක්ව, පෙර සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුළින් ලබා ඇති ප්‍රගතිය සහ සමාලෝචන නිර්දේශ ද මත පදනම්ව අමාත්‍යාංශය විසින් නව (SGBV) ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම මේ වනවිට ආරම්භ කර ඇත.

## 3. 2023 වර්ෂය සඳහා ඉලක්කගත විශේෂිත වැඩසටහන්

- දිස්ත්‍රික් හා කාන්තා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම.
- ළමා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සහ ළමා සංවර්ධනය සහතික කිරීම සහ කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම යටතේ අවදානම් තත්ත්වයන් සිතියම්ගත කිරීම. -MVC Mapping
- ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය.
- ළමා හා කාන්තා සංවර්ධන ඒකක ස්ථාපිත කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පහසුකම් සැපයීම.
- නව යොවුන් වියේ ගැබ් ගැනීම් වැළැක්වීම පිළිබඳව විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා දීප ව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගෘහ මූලික කාන්තාවන් පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (FHH) අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සමාලෝචනය හා ක්‍රියාත්මක කරවීම.
- අමාත්‍යාංශ මට්ටමින් සමරන ජාතික උත්සව සම්බන්ධ කටයුතු හා මාධ්‍ය ප්‍රචාරණය.
- ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කේන්ද්‍රීය නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශ සම්පත්දායක සංචිතයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ප්‍රාදේශීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන.
- කාන්තාවන්ට එරෙහි සියළු හිංසන වැළැක්වීමේ (CEDAW) ප්‍රඥප්තියේ නිර්ණායකයන් ක්‍රියාවට නැංවීම සඳහා අවදානමට ලක්වූ දිළිඳු කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම

# 4. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය -2022.09.30

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | **ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ වැඩසටහන (171-2-06-3-2509(13) රු.මි. 6.952** | | | | | |
| | **ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ වැඩසටහන** | 6.230 | 3.491 | වැඩසටහන් 10 | ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙහි වින්දිතයින් බවට පත්වූවන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සේවාවන් වෙත යොමු කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් (Referral programs) පැවැත්වීම 5 - කෑගල්ල, මඩකලපුව (අනුරාධපුර, ගම්පහ, කළුතර - මාර්ගගතව) | සහභාගිවූ සංඛ්‍යාව 478 |
| | | | | මුද්‍රිත පොත් 1500 (සිංහල 1000 ඉංග්‍රීසි 500 | යොමුගත කිරීමේ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම හා බෙදාහැරීම (සිංහල /දෙමළ) | දිස්ත්‍රික්ක 25 හා එහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334 |
| | | | | දිස්ත්‍රික්ක 25 හා එහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334 x රු. 5000/- | SGBV ගැටළුවලට අදාළ සිද්ධි කළමනාකරණ පිරිවැය ලෙස චෙක්පත් මඟින් මුදල් යවා ඇත. | දිස්ත්‍රික්ක 25 හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334 x රු. 5000/- |
| | | | | මිලදී ගත් ලිපි ද්‍රව්‍ය | අමාත්‍යාංශයෙහි හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පාර්ශවය මඟින් "වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි" ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ලිපිද්‍රව්‍ය සඳහා පිරිවැය දැරීම | |
| | | | | දිස්ත්‍රික්ක 10 | ගාල්ල, කෑගල්ල , හම්බන්තොට සහ මඩකලපුව යන ප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නව යොවුන් වියේ ගැබ්ගැනීම් වැළැක්වීමේ මොඩියුලය පිළිබඳ පුහුණු (ToT) වැඩසටහන් පවත්වන ලදී. | කෑගල්ල, ගාල්ල, තංගල්ල, සූරියවැව, බෙලිඅත්ත ප්‍රා.ලේ.කා |
| | | 0.500 | 0.166 | දැනුවත් කිරීමේ වැඩසටහන් 2 | පොදු ප්‍රවාහනයේදී ලිංගික අතවර කිරීම් සහ හිරිහැර සම්බන්ධ- උපදේශනය, දැනුවත් කිරීම් යාපනය දිස්ත්‍රික්කය | සහභාගිවූවන් 100 |
| | | 0.222 | 0.069 | කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 5 බිල්පත් ගෙවූ මාස ගණන | කාන්තා රැකවරණ මධ්‍යස්ථානවල පිහිටුවා ඇති CDMA දුරකථන සඳහා මාසික ගාස්තු - මාස 7ක බිල් ගෙවා ඇත. | |
| | **එකතුව** | **6.952** | **3.726** | | | |
| 2 | **ළමා අපයෝජන හා කාන්තා හිංසන වැලැක්වීම** (171—2 -06 – 4 – 2509) - රු.මි. 1.323 | | | | | |
| 2.1 | දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම (25*4) | 0.931 | 0.519 | දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම (25*4) | පළමු කාර්තුවේ දී රැස්වීම් 21/25 ක් දෙවන කාර්තුවේදී 17/25 ක් ද තෙවන කාර්තුවේදී 20/25 ක් ද පවත්වා ඇත. 58% | සහභාගිවූවන් 2327 |
| 2.2 | අවදානම් සහගත දරුවන් සිතියම්ගතකරණය (MVC Mapping) | 0.131 | 0.131 | ගම්මාන 4 ක වැඩසටහන් 4 රත්නපුර- අයගම කොළඹ- පාදුක්ක කුරුණෑගල-රස්නායකපුර කළුතර- බේරුවල | රත්නපුර- අයගම ප්‍රා.ලේ.කො.-කෝට්ටබන්දාව සහ කොළඹ, පාදුක්ක ප්‍රා .ලේ.කො.-සියඹලාව, කුරුණෑගල-රස්නායකපුර, කළුතර -පිංහේන ග්‍රාමයන්හි වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. රත්නපුර , අයගම අවදානම් සහගත දරුවන් 90ක් පමණ හඳුනාගෙන ඇත. 100% | අදාළ ගම්මාන වල දරුවන් (ප්‍රගති වාර්තා ලැබෙමින් පවතී.) |
| | **උප එකතුව** | 1.062 | 0.650 | | | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 2.3 | කාන්තා හා ළමා සංවර්ධන ඒකක සඳහා භාණ්ඩ මිලදී ගැනීම් වෙනුවෙන් අතැති බිල්පත් සඳහා ගෙවීම් | 0.184 | 0.183 | ඒකක 1 | නිවිතිගල ප්‍රා.ලේ.කොට්ඨාසයේ කාන්තා හා ළමා සංවර්ධන ඒකක සඳහා භාණ්ඩ මිලදී ගැනීම් වෙනුවෙන් අතැති බිල්පත් සඳහා ගෙවීම් | |
| 2.4 | ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | 0.077 | 0.077 | අනුරාධපුරය-කුරුළුගම, කළුතර- පිංහේන, නුවරඑළිය-මඩුල්ල, වව්නියා-කන්නාතිට්ටි, රත්නපුර-කෝට්ටබන්දාව, පුත්තලම-කොත්තන්තිව් යන ගම්මානවල ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කිරීම | ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා මගින් ප්‍රධානව *පවුල් අර්බුද *මත් ද්‍රව්‍ය භාවිතය වැඩිවීම *බෝ නොවන රෝග ඉහළ වීම *භෞතික පහසුකම් හිග වීම *පාසල් යන වයසේ දරුවන් පාසැල හැර යාම *අඩු ආදායම්ලාභීන් වීම වැනි ගැටළු හඳුනාගෙන ඇත.<br>එම ගැටළු සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය සඳහා‘‘ක්‍රියාකාරී සැලැස්මක්’’සැකසීම එක් එක් ප්‍රා.ලේ.කාර්යාල නිලධාරීන් විසින් සිදුකරමින් සිටී. ඒ සඳහා මෙහෙයුම් යාන්ත්‍රණයක් සංවර්ධන අංශය මගින් සකස් කර ඇත. | අදාළ ගම්මාන වල ප්‍රජාව |
| **උප එකතුව** | | **0.261** | **0.260** | | | |
| **එකතුව** | | **1.323** | **0.910** | | | |
| 3. | ළමුන් සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (171—2 -08 – 6 – 2509(13)] | | | | | |
| 3.1 | සංවර්ධන අංශය | | | | | |
| | නව යෞවන ගැහැනු දරුවන් අඩු වයස් ගැබ් ගැනීම්වලින් වැළැක්වීමට පිළිබඳ පාසල් සිසුන් , ළමා සමාජ හා කාන්තා සමිති නියෝජිතයන් දැනුවත් කිරීමට වැඩසටහන් පැවැත්වීම. | 2.185 | 1.866 | උතුරු සහ නැගෙනහිර පළාත්වල සියලුම කාන්තා සහ ළමා සංවර්ධන ඒකක නිලධාරීන් දැනුවත් කිරීම සහ පාසල් සිසුන් , ළමා සමාජ හා කාන්තා සමිති නියෝජිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් | දරුවන් අඩු වයස් ගැබ් ගැනීම්වලින් වැළැක්වීමට පිළිබඳ උතුරු සහ නැගෙනහිර පළාත්වල සියලුම කාන්තා සහ ළමා සංවර්ධන ඒකක නිලධාරීන් සඳහා Zoom හරහා පුහුණු සැසි 3 ක් පවත්වන ලදී. | නිලධාරීන් 110 |
| | | | | | පාසල් සිසුන් , ළමා සමාජ හා කාන්තා සමිති නියෝජිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් දිස්ත්‍රික්ක 9ක (කෑගල්ල , බදුල්ල, මොණරාගල, නුවරඑළිය, කුරුණෑගල , කළුතර ,රත්නපුර, මාතලේ සහ යාපනය දිස්ත්‍රික්කවල) වැඩසටහන් සිදුකර ඇත. | ප්‍රගති වාර්තා ලැබෙමින් පවතී |
| | ප්‍රජා බලගැන්වීමේ සංකල්පය භාවිතා කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ සම්පත් සංචිත සාමාජිකයින් හා ප්‍රා.ලේ.කා.නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | | නේවාසික පුහුණු සැසි 2ක් මාර්ගගත පුහුණු සැසි 5 ක් | අමාත්‍යාංශයේ සම්පත් සංචිත සාමාජිකයින් හා ප්‍රා.ලේ.කා.නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය වෙනුවෙන් දින දෙකක නේවාසික පුහුණු සැසි 2ක් සහ මාර්ග ගත පුහුණු සැසි 5 ක් පවත්වන ලදී.සම්පත් දායකයින් -රජරට විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය | නිලධාරීන් 150 |
| | අවදානම් සහගත දරුවන් සිතියම්ගතකරණය. | | | කෑගල්ල / පුත්තලම/ මහනුවර/ගම්පහ/රත්නපුර/ මඩකලපුව/ කොළඹ | නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් දිස්ත්‍රික්ක 6 ක තෝරාගත් ගම්මාන 6 ක සිතියම්ගතකරණ කටයුතු සිදුකර ඇත. අවදානම් සහගත දරුවන් සිතියම්ගතකරණය පිළිබඳ මාර්ගෝපදේශය කෙටුම්පත්කර ඇත. | ප්‍රගති වාර්තා ලැබෙමින් පවතී. |
| **එකතුව** | | **2.185** | **1.866** | | | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 3.2 | **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (රු.මි.2.015)** | | | | | |
| | අවදානම් සහගත තත්ත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුලින් මූල්‍ය සහ මූල්‍ය නොවන සහායන් සැලසීම | 0.533 | 0.485 | ආරක්ෂණ සැලසුම් 15 | ආරක්ෂණ සැලසුම් 14 (91%) | සැලසුම් 14 |
| | නිවුන් දරු ආධාර වැඩසටහන | 0.488 | 0.277 | දරුවන් 60 | පවුල් 34 (57%) | පවුල් 34 |
| | ආර්ථික අපහසුතා ඇති ළමුන් සඳහා පාසල් උපකරණ ලබාදීම සඳහා සම්පත් සංචිතයක් පිහිටුවීම | 0.506 | 0.500 | දිස්ත්‍රික් 25 | දිස්ත්‍රික් 25 (99%) | |
| | අතැති බිල්පත් | 0.488 | 0.488 | දිස්ත්‍රික් 4 | දිස්ත්‍රික් 4 (100%) | |
| | **එකතුව** | **2.015** | **1.750** | | | |
| 3.3 | **මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය (රු.මි. 4.000)** | | | | | |
| | නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් පොත මුද්‍රණය | 0.570 | 0.513 | පොත් 1000 | පොත් 1000 | |
| | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සංකල්ප පිළිබඳව සිදුකෙරෙන මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටන | 3.430 | 3.130 | | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා 06ක් ඔස්සේ විනාඩි 30 බැගින් සති අන්ත රූපවාහිනී සම්මුඛ සාකච්ඡා වැඩසටහන් 6 ක්. සමාජ මාධ්‍ය භාවිතා කරමින් සිදුකළ මුල් ළමාවිය අධ්‍යාපනය සහ ආරක්ෂාව ට අදාලව විනාඩි 3-5 දක්වා වූ වීඩියෝ වාර්තා වැඩසටහන් 5ක් | සියළු ප්‍රජාව |
| | ළමා නිවාසයන්හි ළමා මිතුරු පරිසර සකස් කිරීමේ වැඩසටහනෙහි අතැති බිල්පත් පියවීම | - | 0.350 | | රත්නපුර, මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ළමා නිවාසයන්හි අතැති බිල්පත් පියවීම | |
| | **එකතුව** | **4.000** | **3.993** | | | |
| 3.4 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (රු.මි. 4.000) | | | | | |
| | ළමා සහභාගීත්වය තුලින් පාසල් ළමා ආරක්ෂක කමිටු සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ විශේෂ වැඩසටහන් | 1.00 | 0.000 | පාසල් 333 | අම්පාර, මඩකලපුව, යාපනය,කිළිනොච්චිය, මන්නාරම, මුලතිව්, නුවරඑළිය, ත්‍රිකුණාමලය, වව්නියාව යන දිස්ත්‍රික්කවල ප්‍රා.ලේ.කා. සඳහා බැදීම් පත්‍ර මඟින් රු.මි.0.825 මූල්‍ය ප්‍රතිපාදන යොමුකර ඇත. පාසල් ආරම්භ වීම නිසා වැඩසටහන් සිදුකරමින් පවතී. | |
| | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සයිබර් නිරීක්ෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වයළු එනම්, ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා අන්තර් ද්වාරය නිර්මාණය කිරීම | 3.000 | 0.000 | | එක්සත් රාජධානියේ ඉන්ටනෙට් වොච් පදනම සමඟ කටයුතු කිරීමට නීතිපතිවරයාගෙන් උපදෙස් ලබාගෙන ඇත. පරිපාන කටයුතු සිදුවෙමින් පවතී. | |
| | **එකතුව** | **4.000** | **0.000** | | | |

# 7.2.2 සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

## 1. ප්‍රධාන කාර්යභාරය

ළමා හා කාන්තා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය හා තොරතුරු තාක්ෂණ භාවිතාවන් ශක්තිමත් කිරීම.

මීට අමතරව ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම දක්වා මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේද ක්‍රියාවට නැංවීම ද සිදුකෙරේ.

තවද, අංකිත සාක්ෂරතාවයෙන් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සන්නද්ධ කාන්තා හා ළමා ප්‍රජාවක් බිහි කිරීම තුළින් සමාජ, ආර්ථික සංවර්ධනය ඵලදායීව හා ගුණාත්මකව ළඟා කර ගැනීමත් අපේක්ෂා කෙරේ.

ඒ සඳහා පහත ප්‍රධාන ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාත්මක වේ.

- අමාත්‍යාංශයේ සියළු අංශ/ ආයතන ඒකාබද්ධ කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම.
- ළමා හා කාන්තා ක්ෂේත්‍රයට අදාළ ජාතික සැලසුම් සම්පාදනය කිරීම හා ඒවාට දායකත්වය ලබාදීම.
- සංවර්ධන වැඩසටහන්වල මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණය ඇතුළුව ප්‍රගති සමාලෝචනය.
- සංවර්ධන වැඩසටහන් මෙහෙයුම් කටයුතු.
- ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා සම්බන්ධීකරණ ක්‍රියාවලිය පවත්වාගෙන යාම හා විශේෂ වැඩසටහන් සම්බන්ධීකරණය.
- විවිධ අමාත්‍යාංශවලින් සකස් කෙරෙන ජාතික සැලසුම් හා ප්‍රතිපත්තීන්වලට කාන්තා හා ළමා කටයුතු විෂයට අදාළ නිර්දේශයන් ලබාදීම.
- කාන්තා හා ළමා විෂය ක්ෂේත්‍රයේ ප්‍රගමනයන්ට දායක වන විවිධ අධ්‍යයනයන් සිදුකිරීම හා ඒවා වාර්තාකරණය.
- සංවර්ධන වැඩසටහන්වලට අදාළව ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකිරීම, නිගමන හා නිර්දේශ ඇතුළත් වාර්තා ක්‍රියාත්මක ආයතන වෙත ලබා දීම.
- විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කිරීම හා ඒවා සම්බන්ධීකරණය.
- කාන්තාවන්ගේ දැනුම වර්ධනය සඳහා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ වැඩසටහන් දියත් කිරීම.
- අමාත්‍යාංශයේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකරගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ක්‍රම භාවිත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති නිර්මාණය හා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.

- අමාත්‍යාංශයේ සෑම අංශයක්ම සම්බන්ධ කරමින් අභ්‍යන්තර පරිගණක ජාල පද්ධතිය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ ජාලකරණ, දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දීම.
- අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය, ෆේස්බුක් පිටුව හා YouTube චැනලය පවත්වාගෙන යෑම හා යාවත්කාලීන කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් මිලදී ගැනීම් වලදී ප්‍රසම්පාදන කටයුතු වලට අදාල තාක්ෂණික නිර්දේශ ලබා දීම.
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් දියත් කිරීම.
- ශ්‍රී ලංකීය කාන්තා ප්‍රජාව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව දිස්ත්‍රික් මට්ටමින් "සුහුරුලිය" වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා ව්‍යවසායකයින් වෙනුවෙන් සකස් කරන ලද "ඊ - පොළ" ඩිජිටල් අලෙවිකරණ වේදිකාව නවීකරණය කරමින් පවත්වාගෙන යාම.
- ඊ -රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකීය කාන්තා ප්‍රජාව තොරතුරු හා තාක්ෂණික දැනුමෙන් ඔප්නැංවීම සඳහා "සුහුරුකත" වාර්ෂික සඟරා කලාප 2ක් මුද්‍රණය කිරීම.
- අමාත්‍යාංශයේ භාවිත වන පරිගණක සඳහා වෛරස්ගාඩ් මෘදුකාංගය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- කාන්තා හා ළමා විෂය පථයට අදාළ සංඛ්‍යාලේඛන දත්ත හා විශ්ලේෂණය කිරීමට අදාළ කාර්යයන් සිදු කිරීම.

# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

## 2.1 ක්ෂේත්‍ර නිරීක්ෂණ හා වැඩසටහන් පසුවිපරම

ගම්පහ දිස්ත්‍රික්කයේ කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කර, එහි සේවාවන්හි ඵලදායීතාව හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තාවක් ක්‍රියාත්මක ආයතනය වෙත ලබා දීම.

ඉදිරියේ දී කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයෙන් ආධාර ලබා දී ඇති ව්‍යවසායකත්ව කාන්තාවන් පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් ද සිදු කිරීමට කටයුතු යොදා ඇත.

## 2.2 සුනිසි මෙහෙවර සේවා ස්ථාන

රැකියා ස්ථානයන්හි කාන්තාවන්ට සිදුවන හිංසන අවම කරමින් වඩා හිතකර හා සුරක්ෂිත වාතාවරණයක් තුළ කාන්තාවන්ට සේවා සැපයීමට හැකිවන පරිදි වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශය හා එක්ව නව ප්‍රවේශයක් යටතේ මූලික කටයුතු අරඹා ඇත.

## 2.3 ආසියානු සංවර්ධන (ADB) ව්‍යාපෘතිය කාන්තා හා ළමා අංශය වෙනුවෙන් සම්බන්ධීකරණය.

වත්මන් ආර්ථික අර්බුදකාරී වාතාවරණය හමුවේ කාන්තාවන් හා ළමුන් මුහුණු දී ඇති අධි අවදානම් පෝෂණ හා රැකවරණ ගැටළු වෙනුවෙන් ආමන්ත්‍රණය කෙරෙන විදේශ ව්‍යාපෘතියකි. ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන මෙම ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්හි කාන්තා හා ළමා අංශවල කටයුතු සම්බන්ධීකරණය සිදු කෙරේ.

## 2.4 සුහුරුලිය වැඩසටහන

මෙම අමාත්‍යාංශය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව එක්සත් ජාතීන්ගේ ආසියා පැසිෆික් තොරතුරු හා සන්නිවේදනය සඳහා වූ මධ්‍යස්ථානය සමඟ 2016 වර්ෂයේ දී සුහුරුලිය වැඩසටහන ආරම්භ කරන ලදී. තොරතුරු තාක්ෂණයේ නව්‍ය අවස්ථාවන් විවර කිරීම තුළින් ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ආර්ථිකය නඟාසිටුවීම, ඔවුන් මුහුණ දෙන ආර්ථික හා සමාජීය ගැටළු වෙනුවෙන් වූ විසඳුම් ලබා දීම, අංකිත සාක්ෂරතාවයෙන් හෙබි කාන්තා පරපුරක් බිහිකිරීම, සමාජ ආර්ථික සංවර්ධනය සහ ඒ තුළින් සියළු ශ්‍රී ලාංකික කාන්තාවන් වෙත වඩාත් යහපත් ජීවන තත්ත්වයක් උදාකර ගැනීමට කටයුතු සැකසීම මෙම වැඩසටහනේ මූලික අරමුණු වේ. 2022 වසර තුළදී ද දිවයිනේ සියළු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ෆේස්බුක් ආයතනයේ මූල්‍ය සහයෝගයෙන් සුහුරුලිය වැඩසටහන් 27ක් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර මේ වන විට වැඩසටහන් 21 ක් සාර්ථකව සිදු කරඇත.

## 2.5 ඊ- පොළ - මාර්ගගත අලෙවිකරණ වේදිකාව

වර්තමානයේ ඉතා ඉහළ දියුණුවක් ලබා ඇති තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ දිරිමත් ලාංකික ව්‍යවසායක කතුන් වෙත පිළිගැන්වීම සඳහා අමාත්‍යාංශය මඟින් ඊ - පොළ මාර්ගගත අලෙවිකරණ වේදිකාව 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මේ හරහා කාන්තා ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළඳපොලට හඳුන්වා දීමට ද මාර්ගගත ආකාරයෙන් අලෙවිකරණය සිදු කිරීමට ද අවස්ථාවන් උදාකර දීම මෙහි අරමුණයි. දැනට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ මෙන්ම සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශයේ ලියාපදිංචි කාන්තා ව්‍යවසායකයින් මෙහි ලියාපදිංචි වී සිටි.

# 3. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | ක්ෂේත්‍ර නිරීක්ෂණ හා පසුවිපරම |  |  | ක්ෂේත්‍ර නිරීක්ෂණ 02 | ගම්පහ තාවකාලික රැකවරණ මධ්‍යස්ථානය නිරීක්ෂණයට ලක්කර ඇත. |  |
| 2 | "සුනිසි මෙහෙවර" සේවා ස්ථාන සංකල්පය ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම. |  |  | සියලුම පාර්ශව අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | පාර්ශව අමාත්‍යාංශ/ ආයතන සමඟ මූලික සාකච්ඡාවක් පවත්වා ඇත |  |
| 3 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | 0.010 | 0.007 | රැස්වීම් 6 | කාර්තුමය/මාසික ප්‍රගකි සමාලෝචන රැස්වීම් 5ක් පවත්වා ඇත. |  |
| උප එකතුව |  | 0.010 | 0.007 |  |  |  |
| 4 | ඊ-පොළ වැඩසටහන දියත් කිරීම | 0.700 | 0.370 | • පුහුණු වැඩසටහන්<br>• වාර්ෂික සේවා ගිවිසුම සහ SMS සේවාව සඳහා මාසික ගාස්තුව | • පුහුණු වැඩසටහන්<br>• වාර්ෂික සේවා ගිවිසුම සහ SMS සේවාව සඳහා මාසික ගාස්තුව | 40 |
| 5 | කාන්තා ව්‍යාවසායකින් තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වීමේ සුහුරුලිය වැඩසටහන | 0.100 | 0.100 | වැඩසටහන් 27 | වැඩසටහන් 21 | 1700 |
| 6 | පාසල් ළමුන්ගේ මාර්ගගත අධ්‍යාපනය පළිබඳ සිදු කරන ලද සමීක්ෂණ වාර්තාව | 0.200 | 0.200 | පොත් 100 | පොත් 100 |  |
| 7 | තොරතුරු තාක්ෂණ පිළිබඳ පුහුණුව වැඩසටහන් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා | 0.050 | 0.020 | පුහුණු වැඩසටහන් 9 | පුහුණු වැඩසටහන් 7 |  |
| 8 | ස්ත්‍රී පුරුෂභාවය අනුව දිස්ත්‍රික්ක මට්ටමින් තොරතුරු සිතියම්ගත කිරීම (Gender Atlas) |  |  | වැදගත් දත්ත දිස්ත්‍රික් අනුව සිතියම්ගත කිරීම. | වෙබ් අඩවියේ පළ කර ඇත. |  |
| 9 | වාර්ෂික සේවා ගිවිසුම් | 1.650 | 0.710 | සේවා ගිවිසුම් 4ක් අළුත් කිරීම | සේවා ගිවිසුම් 2 ක් අළුත් කර ඇත. |  |
|  | එකතුව | 2.71 | 1.407 |  |  |  |

## 7.2.3 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය


### දැක්ම

ශාරීරික, මනෝ සමාජයීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් යුතු ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරු පරපුරක් බිහිකිරීම.

### මෙහෙවර

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

**සංවිධාන ව්‍යුහය**




## 1. ප්‍රධාන කාර්යභාරය

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය.

# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

## 2.1 ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රු. 20,000 ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන

2015දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන මඟින් මාතෘ සායනවල ලියාපදිංචි වන සෑම ගර්භනී මවකටම ගර්භනී සමයේ හා කිරිදෙන සමයේදී අවශ්‍ය අතිරේක පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට රු. 2000/-ක වටිනාකමින් යුතු වවුචර් 10ක් එකවර ලබා දේ. ගර්භනී සමයේ අවසන් මාස 06 හා කිරි දෙන සමයේ පළමු මාස 04 සඳහා එම පෝෂණ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකියාව ඇත. ඒ යටතේ 2022 වර්ෂයට අදාළව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 4,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2022.09.30 දිනට ප්‍රතිලාභීන් 119,462ක් සඳහා රු.මි. 3102.963 ක් වැය කර ඇත.

## 2.2 පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන

පෙර පාසල් වියේ පසුවන අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 256 ක පෙර පාසල් 3,808 ක දරුවන් 90,203 ක් පමණ මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබයි. 2022 වර්ෂය තුළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 150 ක් වෙන් කර ඇත. වර්තමානයේ පවතින උද්ධමන තත්ත්වය මත එක් දරුවෙක් වෙනුවෙන් වෙන්කර ඇති රු.30/- ක මුදල ද ප්‍රමාණවත් නොවේ. එහෙයින් 2022 අගෝස්තු මස 01 දා සිට 2023 මැයි මස 15 දින දක්වා එක් දරුවෙක් වෙනුවෙන් වෙන් කර ඇති මුදල රු. 60/- දක්වා වැඩිකර මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතිය මඟින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, 2022 සැප්තැම්බර් 30 දිනට ප්‍රතිලාභී දරුවන් 63,321ක් සඳහා රු. මි.73.273 ක් වැය කර ඇත.

## 2.3 පෙරපාසල් ගුරුවරියන් සඳහා රු. 2500/- ක මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන - "ගුරු අභිමානී වැඩසටහන"

මෙම "ගුරු අභිමානී වැඩසටහන" වෙනුවෙන් ප්‍රතිලාභී ගුරුවරියන් 16,275 ක් සඳහා 2022 වර්ෂයේදී රු.මි. 500 ක මුදලක් වෙන්කර ඇති අතර, එක් කාර්තුවක් සඳහා රු.මි. 125 බැගින් වෙන්කර තිබුණි. ඒ අනුව, 2022.09.30 දින වන විට ප්‍රතිලාභී ගුරුවරියන් 15,726ක් සඳහා රු.මි. 301.409 ක් ලබා දී ඇත.

## 2.4 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් වැඩසටහන්

පෙර වර්ෂවලදී භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන ලබා දුන්නද, 2022 වර්ෂයේ එසේ මුදල් වෙන්වී නොමැති බැවින්, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෙන් කර ඇති අතර

ඊට අදාළව පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් කාර්තු වශයෙන් මුදල් ලබාදීම සිදුකරනු ලැබේ.

## 2.5 මුල් ළමාවිය සංවර්ධන තක්සේරුකරණ වැඩසටහන

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මඟින් පර්යේෂණාත්මකව සකස් කරන ලද මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති වෙත දරුවා ළඟා වන බව තක්සේරු කර ගැනීමට හා ඊට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීමට මෙම මුල් ළමාවිය තක්සේරුකරණ වැඩසටහන් සකස් කොට ඇත. ඒ යටතේ සෑම පෙර පාසලකම වයස අවුරුදු 3 - 4 සහ 4 - 5 යන වයස් කාණ්ඩවලට අයත් සියලු දරුවන් මෙම තක්සේරුකරණ වැඩසටහන්වලට ඇතුළත් කර ගනී.

මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම සඳහා රු.මි. 0.216 ක් වෙන් කර ඇති අතර රු.මි. 0.195 ක් මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් 151 ක් පුහුණු කිරීම සඳහා වැය කර ඇත. තක්සේරුකරණය පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා රු.මි. 12.775 ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2022.09.30 දින වනවිට රු.මි. 2.864 ක් වැයකර ගුරුවරුන් 2905 ක් වෙනුවෙන් වැඩසටහන් 69ක් පවත්වා ඇත. තක්සේරුකරණය පිළිබඳ ගුරුවරු පුහුණු කිරීමේ මාර්ගෝපදේශ වීඩියෝව සකස් කිරීම සඳහා රු. මි. 1.250 ක් වැයකර ඇත.

## 2.6 මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් සඳහා ඉගෙනුම් කව වැඩසටහන

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළ ‘‘සෙල්ලම් පාදක ඉගෙනුම් කව’’ පිළිබඳව පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන් 26ක් වෙනුවෙන් ප්‍රතිලාභීන් 990ක් සඳහා රු.මි. 0.375ක් වැයකර ඇත.

සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පෙර පාසල් 670 ක් සඳහා පෙර පාසල් කව ගොඩනැගීම සඳහා රු.මි. 16.750 ක් වෙන්කර ඇති අතර 2022.09.30 දිනවන විට රු.මි. 6.244ක් වැයකර ප්‍රතිලාභීන් 8040ක් සඳහා වැඩසටහන් 268ක් පවත්වා අවසන් කර ඇත.

## 2.7 ‘‘අරුණ දකින රටා’’ මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළුව

මුල් ළමාවිය දරුවන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීමට අවස්ථාවක් සැලැස්වීම, හසුරු කුසලතා සංවර්ධනය කිරීම, සෞන්දර්යාත්මක හැකියාවන් අගය කිරීම අරමුණු කොටගෙන සෞන්දර්යාත්මක හැකියාවන්ගෙන් පිරිපුන් මුල් ළමාවියේ දරු පරපුරක් බිහිකිරීමේ පරමාර්ථයෙන් ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි "අරුණ දකින රටා" වැඩසටහන පැවැත්වේ. මෙම වැඩසටහන සඳහා 2022 වර්ෂයට රු.මි. 6.700 ක වෙන්කර ඇති අතර 2022.09.30 වන විට පවත්වන ලද වැඩසටහන් 335 ක් සඳහා රු.මි. 5.025 ක් වියදමක් වාර්තා වී ඇත. එහි ප්‍රතිලාභීන් 28,174ක් වේ.

### 2.8 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටු රැස්වීම් පැවැත්වීම

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව නව, "මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව'' පිහිටුවන ලදී. මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් සිදුකරන ජාතික මට්ටමේ කළමනාකරණ කමිටුව වේ.

එය ක්‍රියාකාරී සැලසුම් සම්පාදනයේ දී, ක්‍රියාත්මක කිරීමේ දී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යයන්වලදී ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා වූ බහු ආංශික සහයෝගීතාවය සහතික කරනු ලබයි. මුල් ළමාවිය විෂය හා සම්බන්ධ සියලුම පාර්ශවයන් මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරනු ලබන අතර 2022 වර්ෂයේ මාර්තු මස කමිටු රැස්වීම පවත්වන ලද අතර ඒ සඳහා රු. මි. 0.015ක මුදලක් වැය වී ඇත.

### 2.9 මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික කමිටුව

මානව සම්පත් සංවර්ධනයේ වැදගත් කාලසීමාවක් වන මුල් ළමාවිය සංවර්ධන අවධිය සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමුකරමින් මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවසන් කර ඇත. මෙම අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳව සියළුම පළාත් ලේකම්වරුන්, ජාතික කමිටු සාමාජිකයින්, පළාත් පෙර පාසැල් ඒකක ප්‍රධානීන් සහ සියළු පාර්ශවකරුවන් දැනුවත් කිරීමට අදාළව 2022.09.12 දින සිදුකරන ලද කමිටු රැස්වීම සඳහා රු.මි. 0.074ක් වැය වී ඇත.

### 2.10 නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය

නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා ඉහළ ඵලදායීතාවයක් ගොඩනැඟිම සහ නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන අවස්ථාවන් හඳුනා ගැනීම අරමුණු කරගෙන දිස්ත්‍රික් මට්ටමින් විශේෂ වැඩසටහන් පැවැත්වීමට රු.මි. 1.186ක් වෙන්කර ඇති අතර 2022.09.30 දින වනවිට ප්‍රතිලාභීන් ගණන 811 කි. ඒ සඳහා රු.මි. 0.346 ක් වැයකර ඇත.

### 2.11 සෙනෙහෙ තටාක" දෙමාපියන් දැනුවත් කිරීම සඳහා සහභාගීත්ව නව සංකල්ප අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සහභාගීත්ව ප්‍රවේශය හරහා නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව නව ක්‍රමවේදයක් හඳුනාගෙන නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්වල ඉහළ ඵලදායීතාවක් ළඟාකර ගැනීම අරමුණු කරගෙන මෙම වසර සඳහා රු.මි. 0.350 ක් වෙන්කර ඇති අතර 2022.09.30 දින වන විට ප්‍රතිලාභීන් 796ක් වෙනුවෙන් රු.මි. 0.160 ක් වැය කර ඇත.

## 2.12 විශේෂ ව්‍යාපෘති

මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට යහපත් කාර්යාලයීය පරිසරයක සිට රාජකාරි කිරීම සහ ඔවුන් අභිප්‍රේරණය කිරීම අරමුණු කරගනිමින් අවශ්‍ය කාර්යාලයීය උපකරණ ලබාදීම සඳහා විශේෂ ව්‍යාපෘති යටතේ මෙම වසර සඳහා රු.මි. 2.875 ක් වෙන් කර ඇති අතර 2022.09.30 දින වන විට රු.මි. 0.912 ක් වැය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක නිලධාරීන් සඳහා කාර්යාලයීය පුටු, මේස, කබඩ් ලබාදී ඇත.

## 2.13 මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණයට අදාළ විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා පර්යේෂණ ප්‍රතිඵල හා යෝජනා මත පදනම්ව විධිමත් වැඩසටහන් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ සිදුකළ නිලධාරීන් දිරිගැන්වීම හා අගය කිරීම අරමුණු කරගනිමින් මෙම වසර සඳහා රු.මි. 0.434 ක් වෙන්කර ඇති අතර 2022 පෙබරවාරි මස පවත්වන ලද දැනුවත් කිරීමේ සහ ඇගයීමේ වැඩසටහන සඳහා නිලධාරීන් 35ක් වෙනුවෙන් රු.මි. 0.030 ක් වැයකර ඇත.

## 2.14 "මාතෘ අභිමාණී" වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තෝරාගත් ගැබිණි මව්වරුන් වෙනුවෙන් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා රු.10,000/- ක් බැගින් ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ. එම වැඩසටහන සඳහා රු.මි. 3.710 ක් වෙන්කර ඇති අතර 2022.09.30 දින වනවිට වැඩසටහන් 156ක් පවත්වා ඇති අතර රු.මි. 1.226ක් වැය කර ඇත.

## 2.15 ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීම

ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන 2018, 2019, 2020 යන වර්ෂ 03 පුරාවට ක්‍රියාත්මක වන වැඩසටහනකි. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, සංවර්ධන අංශය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව එක්ව මෙම ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන සිදුකරනු ලබයි. මෙම වසර සඳහා මියන 6.200 ක් ඇස්තමේන්තු ගත කළ ද, දෙවන කාර්තුව සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පමණක් රු.මි. 0.200 ක් වෙන් කර ඇත.

## 2.16 මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් ප්‍රධාන කාර්යාලය සමඟ

සම්බන්ධීකරණය කරමින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්යභාරය ඉහළ ඵලදායීතාවයකින් යුක්තව සිදු කිරීම සඳහා මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කරනු ලබයි. ඒ සඳහා රු.මියන 0.407 ක මුදලක් වෙන් කර ඇති අතර ඉන්ධන හිඟය හේතුවෙන් ප්‍රවාහන අපහසුතා මත මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඇත. නිලධාරීන් කැඳවා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා තිබූ දිස්ත්‍රික්ක 2022.09.30 දින වනවිට රැස්වීම් 52ක් පවත්වා රුපියල් මියන 0.103 ක වියදම් දරා ඇත.

**2.17 හදිසි ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු**

හදිසි ආපදා තත්ත්වයන්ට ලක්වන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත අවශ්‍ය උපකරණ ලබාගැනීම සඳහා මෙම වැඩසටහන මඟින් ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර 2022 වර්ෂය සඳහා රු.මි.0.271 ක් වෙන්කර ඇත. 2022.09.30 දිනට මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ “ජූනියර් ස්ටෙප් පෙරපාසල” වෙත රු.මි. 0.049ක් වැයකර ඇත.

**2.18 නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ සේවය කරන සියළු නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳව අවධානය යොමුකරමින් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා රු.මි. 0.500ක මුදල් වෙන්කර ඇති අතර කාර්ය සාධන දර්ශක සකස් කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් රු.මි. 0. 023 ක් වැයකර ඇත.

**2.19 ළමා රැකවරණ මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම.**

ළමා නිවාස සහ දරුවන් භාරගැනීමේ මධ්‍යස්ථාන තුළ සිටින දරුවන්ට පුළුල් සංවර්ධන අවස්ථාවන් සහිත ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම සහ ළමා නිවාස සහ දරුවන් භාරගැනීම මධ්‍යස්ථානවල සේවයේ නියුතු නිලධාරීන්ගේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුම ආකල්ප හා කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන සඳහා රු.මි. 7.500 ක් වෙන්කර ඇති අතර 2022.09.30 දින වන විට මධ්‍යස්ථාන 2ක පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. ඒ සඳහා රු.මි. 0.800 ක මුදලක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

**2.20 මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂය හා සම්බන්ධව වගකිව යුතු සියළු පාර්ශවයන් ඒකරාශී කරගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදුකරයි. " හැමකල් රැක ගතයුතු - දරුවන් වෙයි මිණිමුතු " යන තේමාව යටතේ 2022 වර්ෂයට අදාළව මෙම වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කරන ලද අතර ඒ වෙනුවෙන් රු.මි. 7.500 ක් වෙන් කරන ලදී. 2022.09.30 වන විට ප්‍රධාන වැඩසටහන් 28 ක් පවත්වා ප්‍රතිලාභීන් 4252ක් වෙනුවෙන් රු.මි. 6.141ක් වැය කර ඇත.

## 3. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය(2022.09.30 දක්වා) | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01. | ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රු. 20,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන | 4000.000 | 3102.963 | 2,000,000 පෝෂණ මළු | 1,194,624 (ආසන්න වශයෙන් බෙදී ගිය පෝෂණ මළු සංඛ්‍යාව) | ආසන්න වශයෙන් ගැබිණි මව්වරුන් 119,462 |
| 02. | පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන | 150.000 | 73.273 | පෙර පාසල් දරුවන් 90,203 | පෙර පාසල් දරුවන් 63,321 | පෙර පාසල් දරුවන් 53,778 |
| 03. | පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන<br>"ගුරු අභිමාණී"- මාසිකව රුපියල් 2500/- | 500.000 | 301.409 | පෙර පාසල් ගුරුවරියන් 16,275 | පෙර පාසල් ගුරුවරියන් 15,726 | පෙර පාසල් ගුරුවරියන් 15,726 |
| | **එකතුව (පුනරාවර්තන වියදම්)** | **4650.000** | **3477.645** | | | |
| **04.** | **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන්** | | | | | |
| 4.1 | මුල් ළමාවිය සංවර්ධන තක්සේරුකරණ වැඩසටහන<br>❖ නිලධාරීන් පුහුණු කිරීම | 0.216 | 0. 195 | වැඩසටහන් 03 | වැඩසටහන් 03 | නිලධාරීන් 151 |
| | ❖ ගුරුවරු පුහුණු කිරීම | 12.775 | 2.864 | වැඩසටහන් 280 | වැඩසටහන් 69 | ගුරුවරු 2905 |
| 4.2 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් සඳහා ඉගෙනුම් කව වැඩසටහන | | | | | |
| | ❖ ගුරුවරු පුහුණු කිරීම | 0.390 | 0.375 | වැඩසටහන් 26 | වැඩසටහන් 26 | ප්‍රතිලාභීන් 990 |
| | ❖ කව ගොඩනැඟීම | 16.750 | 6.224 | වැඩසටහන් 334 | වැඩසටහන් 250 | ප්‍රතිලාභීන් 8040 |
| | උප එකතුව | **30.131** | **9.658** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 4.3 | ''අරුණ දකින රටා'' මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළුව | 6.700 | 5.025 | වැඩසටහන් 335 | වැඩසටහන් 335 | දරුවන් 28174 |
| 4.4 | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටු රැස්වීම් පැවැත්වීම | 0.165 | 0.015 | කමිටු 04 | කමිටු 01 | සාමාජිකයින් 31 |
| 4.5 | මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික කමිටුව | 0.075 | 0.074 | කමිටු 02 | කමිටු 01 | සාමාජිකයින් 50 |
| 4.6 | නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය | 1.186 | 0.346 | වැඩසටහන් 25 | වැඩසටහන් 10 | ප්‍රතිලාභීන් 811 |
| 4.7 | "සෙනෙහෙ තටාක" දෙමාපියන් දැනුවත් කිරීම සඳහා සහභාගීත්ව නව සංකල්ප අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0.350 | 0.160 | වැඩසටහන් 10 | වැඩසටහන් 07 | ප්‍රතිලාභීන් 796 |
| 4.8 | විශේෂ ව්‍යාපෘති | 2.875 | 0.912 | වැඩසටහන් 25 | වැඩසටහන් 10 | නිලධාරීන් 10 |
| 4.9 | මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම | 0.434 | 0.034 | ඇගයීමේ වැඩසටහන් 01, පුහුණු වැඩසටහන් 02 | ඇගයීමේ වැඩසටහන් 01 | නිලධාරීන් 35 |
| 4.10 | "මාතෘ අභිමානී" වැඩසටහන | 3.710 | 1.226 | වැඩසටහන් 336 | වැඩසටහන් 156 | මව්වරු 6398 |
| 4.11 | ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීම | 6.200 | 0.200 | ව්‍යාපෘති 25 | ව්‍යාපෘති 1 | දරුවන් සහ දෙමාපියන් 48 |
| 4.12 | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් | 0.407 | 0.103 | වැඩසටහන් 104 | වැඩසටහන් 52 | නිලධාරීන් 356 |
| 4.13 | හදිසි ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු | 0.271 | 0.049 | වැඩසටහන් 01 | වැඩසටහන් 01 | දරුවන් 50 |
| 4.14 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන හා පුහුණුව | 0.500 | 0.021 | වැඩසටහන් 04 | වැඩසටහන් 01 | නිලධාරීන් 30 |
| 4.15 | ළමා රැකවරණ මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම. | 7.500 | 0.800 | මධ්‍යස්ථාන 15 | මධ්‍යස්ථාන 02 | ප්‍රතිලාභීන් 60 |
| 4.16 | මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සතිය | 7.500 | 6.141 | වැඩසටහන් 28 | වැඩසටහන් 28 | ප්‍රතිලාභීන් 4252 |
| **උප එකතුව** | | **37.873** | **15.106** | | | |
| **එකතුව (ප්‍රාග්ධන වියදම්)** | | **69.000** | **24.569** | | | |

# 7.2.4 මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකු)


## හැඳින්වීම

මුල් ළමාවිය ක්ෂේත්‍රයේ වැදගත්කම හා ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය පිළිබඳව 2014 වර්ෂයේ කරන ලද අධ්‍යයන පදනම් කොටගෙන හඳුනාගත් අඩුපාඩු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා සැමට එකසේ ලබා ගත හැකි සේවාවක් බවට පත්කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ ලෝක බැංකුව එකඟත්වයට පත්වීමෙන් පසු මෙරට ප්‍රථම මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය 2016 වසරේදී ආරම්භ කෙරුණි. ලෝක බැංකු (IDA) මූල්‍ය අනුග්‍රහයෙන් 2016 – 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතීන් සිදු කෙරේ.

## අරමුණ

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා සැමට එක සේ ලබාගත හැකි සේවාවක් බවට පත් කිරීම.

**සංවිධාන ව්‍යුහය**




ව්‍යා.නි - ව්‍යාපෘති නිලධාරී  
කා.ස - කළමනාකාර සහකාර  
ස.නි - සහකාර නිලධාරී  
ක.ක.ස - කාර්යාල කාර්ය සහායක  
තා.නි - තාක්ෂණික නිලධාරී

# 1. ප්‍රධාන කාර්යභාරය

දීප ව්‍යාප්තව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/ පෙර පාසල් පිළිබඳ ජාතික සංගණනයක් 2016 වර්ෂයේදී පැවැත්විණි. එම සංගණනයේ මූලික දත්ත පදනම් කර ගනිමින් ව්‍යාපෘතියේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකෙරේ.

- අඩු පහසුකම් සහිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදීම.
- අඩු ප්‍රතිලාභ සහිත/ ප්‍රතිලාභ නොලද ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.
- ආර්ථික අපහසුතා සහිත මුල් ළමාවිය දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පෙර පාසල් ගාස්තු සහනය ලබාදීම.
- පළාත් මට්ටමින් මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා සුබසාධන සහාය ලබාදීම.
- මුල් ළමාවියේ දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර/ ඩිප්ලෝමා පුහුණු පාඨමාලා සඳහා පෙර පාසල් ගුරුවරුන් යොමුකිරීම.
- දෙමාපියන් දැනුවත් කිරීම සහ මනෝ සමාජයීය සහාය ලබාදීම.
- සෑම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකම දෙමාපිය කමිටු පිහිටුවීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ කට්ටල ලබා දීම.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ නියමු පුහුණුකරුවන් පුහුණු කිරීම.
- මුල් ළමාවිය සංවර්ධන ගුරුවරුන්ට කෙටි කාලීන ප්‍රමිතිගත පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා විධිමත් අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමයක් දියත් කිරීම.
- වතුකරයේ ක්‍රියාත්මක වන කටයුතු
  - ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම.
  - ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සෙල්ලම් මිදුල ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම.
  - ළමා සංවර්ධන නිලධාරීන් සඳහා ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවක් ලබාදීම.
  - ළමා සංවර්ධන නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්.
  - දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
  - දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.

### ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්

ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභීන් වන්නේ වසර 3-5 දක්වා පෙර පාසල් යන දරුවන් හා වතුකරයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල වයස 0-2 ත් අතර දරුවන් වේ. අනෙකුත් වක්‍ර ප්‍රතිලාභීන් වන්නේ මුල් ළමාවිය සංවර්ධන ගුරුවරුන් හා ගුරු සහායකයින්, ගුරු පුහුණුකරුවන්, මුල් ළමාවිය සංවර්ධන පරිපාලකයන්, ව්‍යාපෘතියේ පහසුකම් ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට ඇතුළත් වන දරුවන්ගේ පවුල්ය.

## 2. 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

- නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම්
- වතුකරයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා නව සෙල්ලම් මිදුල් සකස් කිරීම්
- මුල් ළමාවිය සංවර්ධන නියමු පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදාන ලබා දීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට අවශ්‍ය ලී බඩු උපකරණ සහ අධ්‍යාපනික සෙල්ලම් උපකරණ කට්ටල , ජල පෙරහන සහ ප්‍රථමාධාර උපකරණ ලබා දීම.

# 3. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

| අනුඅංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම් | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘති භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම. | 624.000 | 252.720 | 925 සහ අවිච්ඡේද ව්‍යාපෘති 633 | |
| 2 | අඩු ප්‍රතිලාභ/ ප්‍රතිලාභ නොලද ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම | 270.000 | 392.650 | 2022 - මධ්‍යස්ථාන 19<br>2021 - මධ්‍යස්ථාන 2 | ඉදිකිරීම් සිදුකරමින් පවතී |
| 4 | අඩු ප්‍රතිලාභ/ ප්‍රතිලාභ නොලද ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම | 23.000 | 6.120 | 2022-1 සහ 2020- 1 (අවිච්ඡේද) | ඉදිකිරීම් සිදුකරමින් පවතී, |
| 6 | හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ඉගැන්වීමේ ඉගෙනුම් ද්‍රව්‍ය පැකේජ බෙදාහැරීම (ක්‍රීඩා ද්‍රව්‍ය කට්ටල) | 80.000 | - | 3,386 | ප්‍රසම්පාදන අදියරේ පවතී. |
| 7 | හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ජලපෙරහන් බෙදාහැරීම. | 72.000 | - | 6,000 | ප්‍රසම්පාදන අදියරේ පවතී. |
| 8 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජලය, සනීපාරක්ෂක සහ විදුලි පහසුකම් සැපයීම - නව | 138.000 | 101.080 | 1,394 | 73 සම්පූර්ණ කර ඇත, 292ක ඉදිකිරීම් සිදුකරමින් පවතී, |
| 9 | හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත කියවීමේ ද්‍රව්‍ය කට්ටල බෙදාහැරීම | 110.000 | | 3,386 | ප්‍රසම්පාදනය අදියරේ පවතී. |
| 11 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ද්‍රව්‍ය සැපයීම - වාර්ෂික ළමා සංවර්ධන ඇගයීම් (CDA) පැවැත්වීම සඳහා NSECD මගින් ද්‍රව්‍ය කට්ටල 12,000 ක් මුද්‍රණය කිරීම | 82.000 | 3.140 | 12,000 | 2300 බෙදාහරින ලදී |
| 12 | මුල් ළමාවිය සංවර්ධන පුහුණුකරුවන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම සහතික පත්‍ර මුද්‍රණය කිරීම සහ සම්මාන ප්‍රදානෝත්සවය | 12.000 | 6.090 | 2 | වැඩසටහන් 1 |
| 13 | පෙර පාසල් ගුරුවරියන් සඳහා වන මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන | 46.000 | 5.970 | 77 | වැඩසටහන් 25 |
| 14 | පුහුණු පෙර පාසල් ගුරුවරුන් සඳහා කාලාන්තර ගුරු පුහුණු අන්තර් ක්‍රියා වැඩසටහන | 9.000 | 0.120 | 92 | පුහුණු වැඩසටහන් 8 |
| උප එකතුව | | **1466.000** | **767.890** | | |

| අනුඅංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම් | මූල්‍ය ඉලක්කය (රු.මී) | මූල්‍ය ප්‍රගතිය (රු.මී) | ව්‍යාපෘති භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 15 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දිගු කාලීන සහතික පත්‍ර /ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව (ජාතික අධ්‍යාපන ආයතනයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය) | 5.000 | 2.400 | 490 | 490 පුහුණු වෙමින් පවතී. |
| 16 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පෙර පාසල් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 10.000 | 1.600 | 2500 | 2355 පුහුණු වැඩසටහන් අවසන් කර ඇත. |
| 17 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සමාජ විගණනය සිදුකිරීම | 6.000 | - | 1 | සමීක්ෂණය අවසන් කර ඇත. වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. |
| 18 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචිය සඳහා පළාත් මට්ටමින් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 10.000 | - | 1 | සංකල්ප රාමුව සකස් කර ඇත. |
| 19 | සිසුන් සඳහා ගාස්තු නිදහස් කිරීම. | 300.00 | 7.310 | 37500 | ගාස්තු නිදහස් කිරීමේ කාර්ය ආරම්භ විය. |
| 20 | මුල් ළමාවිය දරුවන් සඳහා උදෑසන ආහාර සැපයීම. (රු.30 දීමනාව රු. 60 දක්වා වැඩි කර මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරේ.) | 587.000 | - | 155,000 | මූලික කටයුතු අවසන්. නොවැම්බර් මාසයේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. |
| 21 | මෙහෙයුම් පිරිවැය | 133.000 | 65.120 | | |
| උප එකතුව | | **1051.000** | **76.43** | | |
| එකතුව | | **2517.000** | **844.32** | | |

## වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ක්‍රියාකාරකම්

| අනු අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම් | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘති භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන නව ඉදිකිරීම් | 322.000 | 88.240 | 21 | මධ්‍යස්ථාන 21ඉදිකිරීම් සිදු කරමින් පවතී. |
| 2 | පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන (CDCs)ප්‍රතිසංස්කරණය කිරීම-21 | 21.000 | 18.260 | 21 | 21 සම්පූර්ණ කර ඇත. |
| 3 | ගෘහ භාණ්ඩ/උපකරණ සැපයීම (CDC නව ඉදිකිරීම් /CDC ප්‍රතිසංස්කරණය කිරීම) | 16.000 | 15.140 | 91 | 35 බෙදා හැර ඇත. |
| 4 | එළිමහන් ක්‍රීඩා උපකරණ සැපයීම | 25.000 | - | 140 | 89 බෙදා හැර ඇත. |
| 5 | ළමා සංවර්ධන නිලධාරීන් සඳහා ඩිප්ලෝමා පුහුණුවක් පැවැත්වීම (මොඩියුල 5) | 6.000 | 5.960 | 3 | 3 සම්පූර්ණ කර ඇත. |
| 6 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 2.500 | 1.970 | 240 | පුහුණු සැසි 137 |
| 7 | ළමා ඇගයීම් පුහුණුව පැවැත්වීම | 1.000 | 0.520 | | 3 සම්පූර්ණ කර ඇත. |
| 8 | මෙහෙයුම් පිරිවැය | 19.220 | 17.610 | | |
| | **එකතුව** | **413.000** | **147.700** | | |

**ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය හා සබැඳි නියෝජිත ආයතන හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාකාරකම්**

| අනු අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ව්‍යාපෘති භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය** | | | | | |
| 1 | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම | 54.40 | 21.33 | මධ්‍යස්ථාන පිහිටුවීම -1 | 42% |
| **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| 1 | පළාත් 09 සඳහා උපකරණ කට්ටල ලබා දීම | 0.450 | - | 9 | ප්‍රසම්පාදන සිදුවෙමින් පවතී. |
| **මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය** | | | | | |
| 1. | පුහුණුවීම් සහ අනෙකුත් ක්‍රියාකාරකම් 29ක් පැවැත්වීම | 95.000 | 13.760 | පුහුණුවීම් සහ අනෙකුත් ක්‍රියාකාරකම් 29ක් පැවැත්වීම | |
| උප එකතුව | | **149.85** | **35.090** | | |
| ව්‍යාපෘති මුළු එකතුව | | **3,079.850** | **1,026.41** | **100%** | **60%** |

# 7.2.5 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## දැක්ම

ළමුන්ගේ අයිතිවාසිකම් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

## මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටලුවලට යොමු වූ ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියලු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකරදීම.

## 1. ප්‍රධාන කාර්යභාරය

පරිවාස හා ළමාරක්ෂක යන ප්‍රධාන අංශ දෙකක් යටතේ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.


### 1.1 පරිවාස සේවය

- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සම්බන්ධීකරණය, සහාය වීම හා ප්‍රගතිය විමසීම.
- පරිවාස සේවය සඳහා සහ ඒ යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා මඟපෙන්වීම සහ ජාතික ප්‍රතිපත්ති/ ප්‍රමිතීන් සකස් කිරීම.
- ළමුන්ට අදාළ නීති සංශෝධනය හා නව නීති සම්පාදනය.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම.
- පුහුණු හා පර්යේෂණ කටයුතු.
- ළමා රැකවරණ ආයතන සංවර්ධනය සඳහා සහාය වීම.

### 1.2 ළමාරක්ෂණ සේවය

- ළමුන් විෂයෙහි වන ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම.
- ජාතික සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම.
- ළමුන්ගේ පැවැත්ම හා සංවර්ධනය වෙනුවෙන් විවිධ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුහුණු හා පර්යේෂණ කටයුතු.
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම.

- ළමයින්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් වන ළමා සභා හා ළමා සමාජ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ළමාරක්ෂණය සඳහා වන සමාජ ව්‍යූහයන් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ළමුන් සම්බන්ධව ක්‍රියාත්මක වන කටයුතු සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ප්‍රගතිය විමසීම.
- ළමාරක්ෂණය සඳහා දිවයින පුරා සේවයේ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා කටයුතු කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් නොවිසඳුන හා විසඳීමට ජාතික මට්ටමේ මැදිහත්වීම් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව අමාත්‍යාංශ ලේකම්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම.


කොමසාරිස් - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (සංවර්ධන)
නීති නිලධාරි
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)
සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු)
ගණකාධිකාරී
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංඛ්‍යාලේඛන නිලධාරි
ප්‍රධාන කළමණාකරණ සහකාර
කළමණාකරණ සේවා නිලධාරි
තොරතුරු තාක්ෂණ සේවා නිලධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහායක
ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
ස්ථාන භාර නිලධාරි (පුහුණු හා පර්යේෂණ)
ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර
සංවර්ධන නිලධාරි
ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි
පරිවාස නිලධාරි
ස්ථානභාර නිලධාරි (ජා.ළමා උපදේශන මධ්‍ය)
සංවර්ධන නිලධාරි
මනෝ උපදේශිකා
නොවිධිමත් අධ්‍යාපන උපදේශිකා
සහකාර වෝර්ඩන්
රියදුරු
අරක්කැමි
කාර්යාල කාර්ය සහායක
මුරකරු
සනීපාරක්ෂක කම්කරු
මූල්‍ය සහකාර
කළමණාකරණ සේවා නිලධාරි
කාර්යාල කාර්ය සහායක

# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

ළමාරක්ෂණය, ඒ කෙරෙහි ඉදිරිපෙළ කාර්යයක් ඉටු කරන ප්‍රජාව කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක කළ යුතු සමාජ වගකීමකි. මූලික තාක්ෂණික ව්‍යුහයන් හා ක්‍රමවේදයන් හඳුනා ගනිමින් අවශ්‍ය මැදිහත්වීම් ලබා දෙමින් ශක්තිමත් වැඩසටහන් සමූහයක් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඉටු කිරීමට මැනවින් කේන්ද්‍රගත කරන ලද මානවීය යාන්ත්‍රණයක් හා ප්‍රජා කේන්ද්‍රීය ළමාරක්ෂණ ක්‍රමවේද කීපයක් ද පරිවාස දෙපාර්තමේන්තුව සතුව පවතී.

## 2.1 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු වැඩසටහන

ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පිහිටුවා ඇති කමිටු ධුරාවලිය ළමුන් විෂයෙහි හඳුනාගන්නා ගැටලු සාකච්ඡාවට ගැනීම තුළින් විසඳුම් ලබාදීමේ ක්‍රියාවට මුලපුරන ප්‍රධාන යාන්ත්‍රණයයි. ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු පිහිටුවීමේ මාර්ගෝපදේශය සඳහා කැබිනට් අනුමැතිය ද ලැබී ඇති අතර මේ වන විට දිවයින පුරා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 9,965ක් පිහිටුවා ඇත.

ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු පවත්වාගෙන යාමේ වගකීම රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් 2021 වසරේ සිට විධිමත් ලෙස ග්‍රාම නිලධාරීන් වෙත පවරා ඇත්තේ එහි ක්‍රියාත්මකභාවය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණ ඇතිවය. එමෙන්ම පළාත් ළමා සංවර්ධන කමිටුව මෙම අමාත්‍යාංශ ලේකම්ගේ 2018.01.10 දිනැති 01/2018 චක්‍රලේඛය අනුව ක්‍රියාත්මක වේ.

## 2.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව

ළමා අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත යොමු කළ යුතු කාලාන්තර වාර්තාව සකස් කිරීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සාධනීය මැදිහත්වීම, ළමුන්ට අදාළ ගැටලුවලදී උපදේශක-උද්දේශන මැදිහත්වීම, ළමා අයිතිවාසිකම් ශක්තිමත්ව සමාජගත කිරීම මෙන්ම සියලු ආකාරයේ ළමා අපයෝජන වළක්වාලීම සඳහා ජාතික මට්ටමින් සැලසුම් සකස් කිරීමට සහාය වීම මෙම කමිටුවේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

2022.09.13 වන දින ජාතික කමිටු රැස්වීමක් සූම් තාක්ෂණය ඔස්සේ පවත්වා කඩිනමින් ඉදිරි කටයුතු සිදුකළ යුතු බවට ගත් කමිටු රැස්වීමේ යෝජනා සම්බන්ධයෙන් කටයුතු සිදු කෙරේ. කමිටු ව්‍යුහය හරහා යොමු වන ගැටලු මත මීළඟ රැස්වීම තීරණය කෙරේ.

## 2.3 ළමා සමාජ හා ළමා සභා වැඩසටහන

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පරිදි ශ්‍රී ලාංකීය ළමුන්ගේ සහභාගීත්ව අයිතිය වඩාත් අර්ථාන්විතව සහතික කිරීමට හඳුන්වා දෙන ලද ළමා සමාජ වැඩසටහන ළමුන්ගේම ව්‍යුහයකි. ග්‍රාමසේවා වසම් මට්ටමින් පිහිටුවනු ලබන ළමා සමාජ ධුරාවලිය ප්‍රාදේශීය ළමා සභාව හා ජාතික ළමා සභාව දක්වා විහිදේ.

## 2.4 ළමා මූලික පර්යේෂණ

දරුවන්ගේ සහභාගීත්වය අර්ථාන්විතව ලබා ගැනීමට ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන වැඩසටහනකි. ළමා මූලික පර්යේෂණ යෝජනාවලියක් සකස් කිරීමට පුහුණුව ලබාදීමෙන් අනතුරුව ළමුන් විසින්ම හඳුනාගන්නා ගැටළුවකට ළමුන්ගේම විසඳුම් ඇතුළත් යෝජනාවලියක් ඔවුන් විසින්ම ක්‍රියාත්මක කිරීම තුළින් දරුවන් සජීවී විපර්යකාරයකයන් බවට මෙහිදී පත් කෙරේ.

මෙම වර්ෂයේදී දරුවන් විසින් යෝජනා කරන ලද වැඩසටහන් අතරින් තෝරා ගන්නා ලද දිස්ත්‍රික්ක සඳහා රු.75,000.00 බැගින් ලබාදීමට කටයුතු කර ඇත.

## 2.5 ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන

මෙම වැඩසටහන මූලික වශයෙන් ළමා සභා හා ළමා සමාජ දරුවන් කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කරන වැඩසටහනකි. ශ්‍රී ලංකාව මෑතක සිට විවිධ ස්වභාවික ආපදා අවදානම් තත්ත්වයන්ට බහුලව මුහුණ දෙනු ලබන රටක් ලෙස හඳුනාගෙන ඇත. එම නිසා දරුවන් පෙර සූදානම් ක්‍රියාවලිය තුළ සාධනීය මැදිහත්කරුවන් ලෙස ශක්තිමත් කිරීම ඉතා වැදගත් උපායමාර්ගයක් වන අතර, එය දිගුකාලීන වශයෙන් සුරක්ෂිත සමාජයක් උදෙසා සිදුකරන ආයෝජනයකි. මෙම අරමුණ පෙරදැරිව අප දෙපාර්තමේන්තුව මඟින් ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

එම වැඩසටහන යටතේ 2022 වර්ෂය තුල දරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. දරුවන් විසින් යෝජනා කරන ලද ව්‍යාපෘතියක් සඳහා දෙපාර්තමේන්තුව මඟින් මූල්‍ය දායකත්වය වශයෙන් උපරිම රු.10,000.00ක් ලබාදීම සිදු කරයි.

## 2.6 ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ පර්යේෂණ ශක්‍යතාවයන් ප්‍රවර්ධනය කිරීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/සහකාර නිලධාරීන්ගේ වෘත්තීය දැනුම, කුසලතා හා අත්දැකීම් ශාස්ත්‍රීය ප්‍රවේශයක් ඔස්සේ හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබාදීමත්, වෘත්තීය කුසලතා තවදුරටත් ඔප්නැංවීමත් අරමුණු කර ගනිමින් සමාජ විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශයක් එළිදැක්වීම මේ යටතේ සිදු වේ. මෙම පරීක්ෂණ සිදු කරන්නේ තමන් විසින්ම පෞද්ගලිකව වියදම් දරා ගනිමිනි.

## 2.7 දැනුවත් කිරීමේ වැඩසටහන්

ළමා අයිතිවාසිකම් සමාජය තුළ තහවුරු කිරීම, ළමා අපයෝජනයන් නිවාරණය කිරීම හා සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ අරමුණින් දැනුවත් කිරීම් ක්‍රියාත්මක කරනු ලබයි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ආකාරයට ප්‍රජාවට ඒ පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීමේ අවශ්‍යතාවය ඒ තුළින් සම්පූර්ණ කළ හැකිය. කොවිඩ් 19 වසංගතය නිසා මාර්ගගත ක්‍රමය ඔස්සේ

සිදුවන දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම සඳහා අන්තර්ජාලය තුළ දරුවන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සම්බන්ධ වැඩසටහන සහ යහපත් දෙමාපියභාවය හා දරුවන් හික්මවීමේ යහපත් ක්‍රමවේද පිළිබඳව දෙමාපියන්ගේ කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක වේ. මේ යටතේ ළමා අයිතිවාසිකම් හා බැඳුණු විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ දැනුවත් කිරීම් සිදුවේ.

## 2.8 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ළමුන්ගේ පැවැත්ම හා සංවර්ධනය වීමේ අයිතිය සහතික කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 2.8.1 ආන්තික ප්‍රජාවගේ දරුවන් සඳහා අයිතිවාසිකම් තහවුරු වූ පරිසරයක් නිර්මාණය කිරීම.

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් පරිදි ළමුන්ගේ සංවර්ධනයට, රැකවරණයට, ආරක්ෂා වීමට හා අධ්‍යාපනය ලැබීමට ඇති අයිතීන් සහතික කිරීම සඳහා ද වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ළමා අයිතීන් අහිමිවීමේ වැඩි අවදානමක් ඇති වතු, වීදි, මහල් නිවාස, ධීවර සහ ආදිවාසී වැනි ආන්තික ප්‍රජාවන්ගේ දරුවන් කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කෙරේ.

- ආන්තික ප්‍රජාවගේ දරුවන් සඳහා ජංගම සේවා පැවැත්වීම හා නෛතික ලියකියවිලි ලබාදීම.
- අවාසි සහගත ප්‍රජාව සම්බන්ධව ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.

## 2.9 අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් අරමුණුගත වූ වැඩසටහන්

ළමුන්ගේ සංවර්ධනයට සෘජු බලපෑම් කරනු ලබන සාධකයක් වන අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීමට පහත ප්‍රමුඛ වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවනු ලබයි.

### 2.9.1 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය

කැපකරු මාපියන්ගේ මූල්‍ය ආධාර මත ආර්ථික අපහසුතා සහිතව අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ශිෂ්‍යත්ව ලබාදෙන වැඩසටහනකි. මාසිකව කැපකරු මාපියන් ලබාදෙන මුදල් තැපැල් කාර්යාල මඟින් ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇති අතර කැපකරු මාපියන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යාධාරය ලබා දෙන කාලය තීරණය වේ.

### 2.9.2 "අත්වැල" අනුග්‍රාහක මාපිය යෝජනා ක්‍රමය

දරුවෙකුට සුරක්ෂිත පවුලක ජීවත්වීමට ඇති අයිතිය තහවුරු කරමින් දරුවාගේ සමස්ත සංවර්ධනය සැලසීමේ අරමුණින් මෙම "අත්වැල" අනුග්‍රාහක මාපිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. එහිදී අනුග්‍රාහකයන් හා ආධාර අපේක්ෂිත දරුවන්/පවුල් අතර සම්බන්ධීකරණයක් දෙපාර්තමේන්තුව මඟින් සිදුවේ. ළමා අයිතිවාසිකම් කඩවූ හෝ කඩවීමේ අවදානමක් ඇති දරුවන් සහ හදිසි විපතක් හෝ ආපදාවන්ට ලක්වූ දරුවන් සඳහා මූල්‍යමය ආධාර, ද්‍රව්‍යමය ආධාර හා සේවා සම්පාදනය සඳහා මැදිහත් වීම් සිදුකරනු ලබයි. මූල්‍යමය ආධාර අවශ්‍ය දරුවන්ට ඔවුන් නමින් අරඹන ගිණුමක් හරහා මුදල් ලබාදීම සහ ද්‍රව්‍ය, වෙනත් ආධාර හා සහාය සේවාවන් අවශ්‍ය දරුවන්ට දෙපාර්තමේන්තුව

හරහා හෝ නිර්දේශය මත සෘජුව සහාය ලබාදීම මෙහිදී සිදු කරයි. අවම අනුග්‍රාහක මුදල රු.5,000.00කි.

### 2.9.3 "සිප්සවිය" අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන

අධ්‍යාපන කටයුතුවල නියැලෙන ආර්ථික දුෂ්කරතා සහිත දරුවන්ට අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාම සඳහා ඇට්ලස් ආයතනය මඟින් 2019 වසරේ ආරම්භ කර වසර 5ක් පුරා ක්‍රියාත්මක කිරීමට අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත. මෙහිදී ශිෂ්‍යත්ව 200ක් ලබාදීම සිදුකරයි. ඒ අනුව 6 වසරේ සිට 11 වසර දක්වා තෝරා ගත් දරුවන් 200කට, මසකට රු.1500.00 බැගින් ලබාදීම හා රු.500.00ක මුදල ස්ථාවර තැන්පතු ලෙස ගිණුම්වල ඉතුරු කිරීමක් සිදුකරනු ලැබේ. මාස 3කට වරක් තෝරාගත් දරුවන්ගේ පසුවිපරම් වාර්තා දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගනිමින් පරීක්ෂා කෙරේ.

### 2.9.4 "නැණදිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන

2011 වර්ෂයේදී දීප ව්‍යාප්තව සිදු කළ අවදානම් දරුවන් පිළිබඳ සමීක්ෂණයෙන් හඳුනා ගනු ලැබූ අධ්‍යාපනය ලබා ගැනීම අවදානමට ලක්ව ඇති ළමුන් වෙනුවෙන් "නැණදිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන සඳහා සම්පූර්ණ මූල්‍ය දායකත්වය පෞද්ගලික අංශය ලබාදෙන සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය යටතේ උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වෙයි. මාසික ශිෂ්‍යාධාරය තැපැල් කාර්යාල මඟින් ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

### 2.9.5 කැපකරු දෙගුරු ශිෂ්‍යත්ව ක්‍රමය

අධ්‍යාපනය ලබන ආර්ථික අපහසුතා සහිත දරුවන් සඳහා මාසිකව ලබාදෙන ශිෂ්‍යාධාර ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන් වෙතින් අදාළ කොට්ඨාසයේ දරුවන්ගේ ආධාර මාස 02 ට වරක් ලබා ගැනීම සඳහා පහසුකම් සපයා ඇත. එක් මාසයක් සඳහා එක් දරුවකුට රු.700.00ක මුදලක් හිමිවේ. දරුවන් 2000ක් මෙහි ප්‍රතිලාභ ලබන අතර රජයේ අයවැය මඟින් ඊට දායකත්වය සැපයේ.

### 2.9.6 පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම හා අධ්‍යාපන උපකරණ ලබාදීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනා ගන්නා ලද දරුවන් සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන අතර, අදාළ උපකරණ ලබා දීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර විසින් සිදු කරනු ලබයි. එක් දරුවකුට රු.1000.00ක මුදලක් හිමිවේ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තෝරා ගන්නා දරුවන් 6 දෙනෙකු සඳහා මින් ප්‍රතිලාභ හිමිවේ.

## 2.10 සෞඛ්‍යයට හා පෝෂණයට ඇති අයිතිය සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන්

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් සෞඛ්‍ය හා පෝෂණයට ඇති අයිතිය ළමුන්ට සහතික කරදීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

### 2.10.1 හදිසි විපත් ආධාර වැඩසටහන

ස්වාභාවික ව්‍යසනයන් මෙන්ම වෙනත් විවිධ හේතු සාධක නිසා හදිසි ආපදා තත්ත්වයන්ට පත්වන්නා වූ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා මෙන්ම වෙනත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන ආධාර මුදලකි. එක් පවුලක දරුවන් වෙනුවෙන් අවමය රු. 5,000.00 සහ උපරිමය රු.10,000.00 වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සුදුසු පරිදි ගෙවීමට කටයුතු සම්පාදනය කර ඇත.

### 2.10.2 නිවුන් දරු ආධාර වැඩසටහන

අඩු ආදායම්ලාභී පවුල්වල නිවුන් දරුවන් වෙනුවෙන් ලබාදෙන ආධාර මුදලකි. හුදෙක් නිවුන් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා මෙන්ම වෙනත් අවශ්‍යතා සපුරා ගැනීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි. නිවුන් දරුවන් සඳහා රු.7,500.00 ක් හා තුන් නිවුන් දරුවන් සඳහා රු.15,000.00 ක් වශයෙන් එක් වරක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මෙම ආධාර ලබා දේ.

### 2.10.3 වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන

අඩු ආදායම්ලාභී පවුල්වල රෝගී දරුවන්ට වෛද්‍යාධාර ලබා දීම මේ යටතේ සිදු කෙරේ. එක් දරුවකු සඳහා අවමය රු. 5,000.00 සිට උපරිමය රු. 15,000.00 දක්වා අදාළ රෝගී තත්ත්වයේ ස්වභාවය හා වෛද්‍ය වාර්තා පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ගෙවනු ලබයි.

### 2.10.4 "සෙනෙහස ඉතුරුම්" වැඩසටහන

2004 සුනාමි ව්‍යසනයට ගොදුරු වූ මව්පියන් දෙදෙනාම අහිමි වූ දරුවන් වෙනුවෙන් මාසිකව රු.1,500.00 මුදලක් දරුවා නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුමක තැන්පත් කරන අතර, දරුවන්ට අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසුව එම මුදල් ලබා ගැනීමේ අවස්ථාව සලසා දී ඇත. ඒ අනුව මේ වන විට ආධාර ලබන දරුවන් සංඛ්‍යාව 4කි.

### 2.10.5 ගංවතුරින් අසරණ වූ දරුවන් සඳහා ආධාර ලබාදීම.

2017 වර්ෂයේ සිදු වූ හදිසි ගංවතුර හේතුවෙන් මව පියා අහිමි වූ දරුවන් සඳහා ආධාර ලබා දීම මේ යටතේ සිදුවේ. ඒ අනුව මේ වන විට ආධාර ලබන දරුවන් සංඛ්‍යාව 20 කි.

### 2.10.6 අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම

විවිධ හේතු සාධක නිසා දරුවන් අවදානම් තත්ත්වයන්ට මෙන්ම විවිධ අපයෝජනයන්ට ද ගොදුරු වේ. දරුවන් අපයෝජනයට පත් වීමට පෙර එම අවදානම් තත්ත්වයන් හඳුනා ගනිමින් තාක්ෂණික ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කර ආරක්ෂාව තහවුරු කිරීම හා එම පවුල් ශක්තිමත් කිරීම සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සිදුවේ.

ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සඳහා බහුවිධ ප්‍රවේශයන් ඔස්සේ කටයුතු කෙරෙන අතර දරුවන්ට දිගුකාලීනව පවුල් ඒකකය තුළ ආරක්ෂාවක් මෙන්ම සංවර්ධනයක් ඇති කිරීමට මෙතුළින් හැකියාව ලැබේ.

## 2.11 ලෝක ළමා දිනය සැමරීම

සෑම වර්ෂයකම ජාත්‍යන්තර ළමා දින තේමාවට සමගාමී තේමාවක් යටතේ ලෝක ළමා දින සැමරුම සිදුකරනු ලබයි. එහිදී දරුවන්ගේ සහභාගීත්වය අර්ථ ගැන්වීම සේම, දරුවන්ට තම දක්ෂතා එළිදැක්වීමට අවස්ථාව ලබාදීම හා දරුවන් ඇගයීම තුළින් ඔවුන් දිරිමත් කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා විවිධ අනුග්‍රාහක භවතුන්ගේ දායකත්වයද ලබාගැනීම තුළින් දරුවන් වෙනුවෙන් කටයුතු කිරීම සමාජමය වගකීමක් බව ඒත්තු ගැන්වීමට අපේක්ෂා කෙරේ. "කියන්න බැරි දේ අඳින්න - තෙළි තුඩක අසිරිය" ළමා චිත්‍ර තරඟයේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග හා සහතික පත් ලබා දීම ද සිදු විය.

## 2.12 ළමා නිවාසගත දරුවන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ළමා නිවාසගත දරුවන් සඳහා සුරක්ෂිත හා හිතකර පරිසරයක් සකස් කර දීමේ අරමුණින් ළමා නිවාසවල යටිතල පහසුකම් සංවර්ධනය සිදු කරයි. ඊට අමතරව ළමා නිවාස කාර්ය මණ්ඩලය සඳහා නිරන්තර පුහුණු අවස්ථාවන් ලබාදීම, නිසි ප්‍රමිතියෙන් යුතුව ළමා නිවාස පවත්වා ගෙනයාම හා ළමුන්ට ලබාදෙන සේවාවන් වඩාත් ප්‍රශස්ත මට්ටමකට රැගෙන ඒම සඳහාත් දැඩි සුපරීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබයි.

ළමා නිවාසගත දරුවන් සමාජගත කිරීම සඳහා වෘත්තීය හා ජීවන කුසලතා පුහුණුව ලබා දීම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දී අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 2.13 ළමුන් විෂයෙහි වන ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම

පරිවාස හා ළමාරක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ප්‍රතිපත්ති හා සැලසුම් මෙන්ම ජාතික මාර්ගෝපදේශයන් සකස් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයකි. ඒ අනුව, පහත ප්‍රතිපත්ති, සැලසුම් හා ප්‍රමිතීන් සකස් කිරීමට කටයුතු කර ඇත.

- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වන සිද්ධි කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීම.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය
- ළමා රැකවරණ මධ්‍යස්ථාන හා පරිවාස නිලධාරී ස්ථාවර නියෝග සංශෝධනය.
- ආර්ථාන්විත ළමා සහභාගීත්වය පිළිබඳ මාර්ගෝපදේශ.
- ළමා සංවර්ධන ග්‍රාමීය කමිටු පිළිබඳ මාර්ගෝපදේශ.

## 2.14 පුහුණු හා පර්යේෂණ

දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරීන් සඳහා නිරන්තර දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා වාර්ෂිකව ක්ෂේත්‍රයට අදාළ පුහුණු හා වැඩමුළු සංවිධානය කිරීම සිදුවේ.

ළමාරක්ෂණයට අදාළ ක්ෂේත්‍රයන් ඔස්සේ පර්යේෂණයන් සිදු කිරීම හා වෙනත් ආයතනයන් සිදු කරනු ලබන ළමාරක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන් පිළිබඳ පර්යේෂණ පත්‍රිකා රැස් කිරීම අරමුණු කර ගනිමින් ජාතික පර්යේෂණ හා පුහුණු ආයතනය මෙම දෙපාර්තමේන්තුවට අනුබද්ධව ක්‍රියාත්මක වේ.

# 3. 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ළමුන්ගේ පැවැත්මට, සංවර්ධනයට හා අධ්‍යාපනයට ඇති අයිතීන් ශක්තිමත් කිරීම සඳහා වන වැඩසටහන්

- අර්ථාන්විත ළමා සහභාගීත්වය ශක්තිමත් කිරීම හා වර්ධනය කිරීමට ළමා සමාජ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැළැක්වීම හා උල්ලංඝනය වීම් සඳහා මැදිහත් වීම.
- ආන්තික ප්‍රජාව තුළ ජීවත්වන දරුවන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම.
- ආපදා අවදානම් අවමකරණ ක්‍රියාවලිය තුළ දරුවන්ගේ මැදිහත්වීම ශක්තිමත් කිරීම.
- ළමා මූලික පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
- අන්තර්ජාලය තුළ දරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම (මව්වරුන් සමඟ බන්ධනාගාරගත වී සිටින දරුවන් සඳහා විකල්ප රැකවරණ ක්‍රමයක් හඳුන්වා දීම).
- දැඩි අවදානම් සහගත දරුවන් සඳහා අනුග්‍රාහක කැපකරු මාපිය ක්‍රමයක් හඳුන්වා දීම.
- දරුවන් හදාවඩා ගැනීමේ ක්‍රමවේදය සරල කිරීම සඳහා මූලික කටයුතු සම්පාදනය කිරීම.
- සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශය අනුව අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම.
- මානව සම්පත් සංවර්ධනය සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- පුහුණු හා පර්යේෂණ සිදුකිරීම.
- ජාතික උත්සව සංවිධානය කිරීම හා සැමරීම.
- ප්‍රතිපත්ති සම්පාදනය හා උද්දේශනය.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- මාධ්‍ය හා ප්‍රකාශන

## 4. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය- 2022.09.30

| අනු අංකය | ව්‍යාපෘතිය/කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **1** | **ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම (ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා ප්‍රඥප්තිය) අවශ්‍යතා සහිත දරුවන් සඳහා ආධාර ලබාදීම.** | | | | | |
| 1.1 | වෛද්‍ය හා පෝෂණ ආධාර ලබාදීම. | 2.879 | 1.680 | ළමයි 561 | ළමයි 326 | ළමයි 326 |
| 1.2 | නිවුන්දරු ආධාර ලබාදීම. | 1.097 | 0.795 | පවුල් 142 | පවුල් 97 | පවුල් 97 |
| 1.3 | හදිසි විපත් ආධාර. | 0.567 | 0.390 | ළමයි 113 | ළමයි 73 | ළමයි 73 |
| 1.4 | සෙනෙහස ආධාර ( සුනාමි විපතට පත් ළමුන් සඳහා) | 0.039 | 0.034 | ළමයි 4 | ළමයි 4 | ළමයි 4 |
| 1.5 | ගංවතුරින් අසරණ වූ දරුවන් සඳහා ආධාර | 0.458 | 0.342 | ළමයි 20 | ළමයි 19 | ළමයි 19 |
| **2** | **අධ්‍යාපන ආධාර හා ශිෂ්‍යත්ව ලබාදීම** | | | | | |
| 2.1 | කැපකරු දෙගුරු ආධාර ලබාදීම. | 16.800 | 13.405 | ළමයි 2,000 | ළමයි 2,000 | ළමයි 2,000 |
| 2.2 | අධ්‍යාපන ආධාර ලබාදීම. | 2.0785 | 2.074 | ළමයි 2,023 | ළමයි 2,021 | ළමයි 2,021 |
| **3** | **අවදානම් හා ආන්තික පවුල්වල දරුවන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 3.1 | ආන්තික ප්‍රජාවගේ දරුවන් සඳහා ජංගම සේවා පැවැත්වීම හා නෛතික ලියවිලි ලබා දීම. | 0.686 | 0.453 | වැඩසටහන් 16 | වැඩසටහන් 10 | ළමයි 10, පවුල් 10 |
| 3.2 | අවදානමට ලක්විය හැකි දරුවන්ගේ සංවර්ධනය සහ පැවැත්මේ අයිතීන් සහතික කිරීම සඳහා සහාය වීම | 0.015 | 0.013 | රැස්වීම් 1 | රැස්වීම් 1 | නිලධාරීන් 77 |
| 3.3 | අන්තර්ජාලය තුළ දරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව අත්පත්‍රිකා මුද්‍රණය | 0.105 | 0.105 | අත්පත්‍රිකා 24,000 | අත්පත්‍රිකා 24,000 | අත්පත්‍රිකා 24,000 |
| 3.4 | අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම. | 8.344 | 6.144 | ආරක්ෂණ සැලසුම් 275 | ආරක්ෂණ සැලසුම් 193 | ළමයි 193 |
| 3.5 | අන්තර්ජාලය තුළ දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම | 0.648 | 0.308 | වැඩසටහන් 162 | වැඩසටහන් 77 ඉදිරියේදී තවත් වැඩසටහන් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. | දෙමාපියන් 7,920 |
| උප එකතුව | | **33.716** | **25.744** | | | |

# 4. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය- 2022.09.30

| අනු අංකය | ව්‍යාපෘතිය/කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **4** | **ප්‍රජා මූලික ළමාරක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම** | | | | | |
| 4.1 | ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම | 3.249 | 2.270 | රැස්වීම් 1340 | රැස්වීම් 800 | නිලධාරීන් 59,375 |
| 4.2 | ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම | 0.025 | 0.000 | රැස්වීම් 2 | රැස්වීම් 1 | සාමාජිකයින් 30 |
| 4.3 | ග්‍රාමීය කමිටු පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 0.041 | 0.036 | වැඩසටහන් 2 | වැඩසටහන් 2 | පුහුණුකරුවන් 70 |
| 4.4 | ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම | 0.131 | 0.072 | රැස්වීම් 14 | රැස්වීම් 6 | නිලධාරීන් 375 |
| 4.5 | ආදර්ශ ගම්මාන සඳහා වැඩසටහන් පැවැත්වීම. | 0.000 | 0.000 | ආදර්ශ ගම්මාන | වැඩසටහන් 1 | ළමයි 30 |
| 4.6 | ලෝක ළමා දිනය සැමරීම | 1.514 | 0.331 | වැඩසටහන් 363 | වැඩසටහන් 3 | ප්‍රතිලාභීන් 280 |
| 4.7 | යහපත් දෙමාපියභාවය සහ දරුවන් හික්මවීමේ යහපත් ක්‍රමවේද පිළිබඳව දෙමාපියන්ගේ කුසලතා ඔප්නැංවීමේ සහ අගය කළ යුතු දරුවකු වන්නේ කෙසේද යන්න පිළිබඳව දරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | 1.855 | 1.753 | වැඩසටහන් 336 | වැඩසටහන් 325 | ප්‍රතිලාභීන් 13,975 |
| **5** | **අර්ථාන්විත ළමා සහභාගීත්වය ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 5.1 | ළමා සමාජ සහ ළමා සභා රැස්වීම් පැවැත්වීම (ප්‍රාදේශීය , දිස්ත්‍රික් හා ජාතික මට්ටමින්) | 2.290 | 1.062 | රැස්වීම් 721 | රැස්වීම් 337 | ළමයි 20,500 |
| 5.2 | ළමා හිතකාමී සමාජයක් නිර්මාණය කිරීම සඳහා දරුවන් බල ගැන්වීම - ළමා මූලික පර්යේෂණ | 0.095 | 0.000 | පර්යේෂණ 3 | පර්යේෂණ 0 | සහභාගී වූ සංඛ්‍යාව |
| **6** | **විකල්ප රැකවරණය** | | | | | |
| 6.1 | පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල භෞතික සම්පත් අඩුපාඩු ලබා දීම | 1.922 | 1.459 | ළමා නිවාස 6 | ළමා නිවාස 5 | ළමයි 110 |
| 6.2 | හඳුනාගත් ළමයින් නැවත සමාජ ගත කිරීම. | 2.003 | 0.085 | ළමයි 5 | ළමයි 1 | ළමයි 1 |
| | උප එකතුව | **13.125** | **7.068** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය/කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 6.3 | දරුවන් රැකබලා ගන්නා නිලධාරීන් පුහුණු කිරීම. | 0.200 | 0.000 | වැඩසටහන් සංඛ්‍යාව 1 | වැඩසටහන් සංඛ්‍යාව 0 | |
| 6.4 | පරිවාස නිලධාරීන් සඳහා මිනිස් ජාවාරම වැළැක්වීම හා නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 0.250 | 0.006 | වැඩසටහන් සංඛ්‍යාව 2 | වැඩසටහන් 2 | |
| 6.5 | පළාත් පරිවාස දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය | 0.150 | 0.050 | රැස්වීම් 3 | රැස්වීම් 2 | ළමයින් හා නිලධාරීන් 55 |
| 6.6 | ආයතනගත දරුවන් (පරත්ත) සඳහා පුහුණු වීම්/ කුසලතා සංවර්ධන /ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 0.008 | 0.008 | වැඩසටහන් 1 | වැඩසටහන් 1 | වැඩසටහන් 1 |
| 6.7 | ළමා නිවාස අධීක්ෂණය තුළින් හඳුනා ගන්නා අවශ්‍යතා සඳහා සහ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය සහයයන් ලබා දීම | 4.750 | 4.316 | මධ්‍යස්ථාන 3 | මධ්‍යස්ථාන 2 | ළමයි 237 |
| **7** | **සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය** | | | | | |
| 7.1 | ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචනය කිරීම. | 1.350 | 0.540 | රැස්වීම් 253 | රැස්වීම් 129 | නිලධාරීන් 445 |
| 7.2 | ළ.හි.ප්‍ර.නි. ගේ වාර්ෂික සංස්කරණ සම්මේලනය සහ අත්දැකීම් හුවමාරු කිරීමේ අවස්ථාව සැලසීම | 1.000 | 0.000 | වැඩසටහන් සංඛ්‍යාව 1 | වැඩසටහන ඉදිරියේදී පැවැත්වේ. | නිලධාරීන් 445 |
| 7.3 | පවත්නා යාන්ත්‍රණය තුළින් (රාජකාරී දින පොත) නිලධාරීන්ගේ කාර්ය සාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම | 0.567 | 0.000 | කාර්ය සාධන වාර්තා පොත් 450 | කාර්යය සිදුවෙමින් පවතී. | නිලධාරීන් 420 |
| 7.4 | ආධාර වැඩසටහන් වල ප්‍රතිලාභීන් පසුවිපරම | 0.020 | 0.006 | රැස්වීම් 1 | රැස්වීම් 1 | |
| 7.5 | ආරක්ෂණ සැලසුම් ප්‍රතිලාභීන් පිළිබඳව පසුවිපරම් සිදු කිරීම | 0.038 | 0.038 | වැඩසටහන් සංඛ්‍යාව 1 | වැඩසටහන් සංඛ්‍යාව 1 | |
| | උප එකතුව | **8.333** | **4.964** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය/කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **8** | **නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය** | | | | | |
| 8.1 | ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා (බාහිර පුහුණුව) | 0.200 | 0.060 | පුහුණු සංඛ්‍යාව 4 | පුහුණු සංඛ්‍යාව 1 | නිලධාරීන් 1 |
| 8.2 | සිද්ධි කළමණාකරණ මාර්ගෝපදේශය පිළිබඳව ළ.හි.ප්‍ර.නි. පුහුණු කිරීම | 0.200 | 0.196 | වැඩසටහන් සංඛ්‍යාව 4 | වැඩසටහන් සංඛ්‍යාව 4 | |
| **9** | **වෙනත්** | | | | | |
| 9.1 | මුද්‍රණ කටයුතු සහ ප්‍රකාශන | 0.150 | 0.107 | ප්‍රකාශන 4 | ප්‍රකාශන 2 | |
| 9.2 | අතැති බිල්පත් 217-2-2-5-2202 | 0.355 | 0.355 | | | |
| 9.3 | අතැති බිල්පත් 217-2-2-6-2202 | 0.600 | 0.600 | | | |
| 9.4 | අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව අවලංගු කරන ලද ව්‍යාපෘති 217-2-2-6-2202 | 0.796 | | | | |
| 9.5 | අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව අවලංගු කරන ලද ව්‍යාපෘති 217-2-2-4-2202 | 0.475 | | | | |
| **උප එකතුව** | | **2.776** | **1.318** | | | |
| **මුළු එකතුව** | | **57.950** | **39.094** | | | |

# 7.2.6 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

## මෙහෙවර


ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

## 1. ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පහත පරිදි පුළුල් කාර්යභාරයක් පැවරී ඇත.

- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා රජයට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.
- එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.
- අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම හා ළමා අපයෝජන වැළැක්වීම, වින්දිතයින් ආරක්ෂා කිරීම ඇතුළු ළමා ආරක්ෂාවට අදාල සියළු කාර්යයන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, නියාමනය හා පසුවිපරම් කිරීම.

## සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
නියෝජ්‍ය සභාපති
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සහකාර පොලිස් අධිකාරී
අධ්‍යක්ෂ (වැඩසටහන්)
සායනික මනෝ විද්‍යාඥ
අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු)
අධ්‍යක්ෂ (නීති)
අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම)
අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
අධ්‍යක්ෂ (මූල්‍ය)
විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ ස්ථාන භාර නිලධාරී
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (වැඩසටහන්)
සහකාර අධ්‍යක්ෂ (මනෝවිද්‍යා)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන)
සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා තොරතුරු)
සහකාර අධ්‍යක්ෂ (නීති)
සහකාර අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
ගණකාධිකාරී
විශේෂ පොලිස් විමර්ශන ඒකකය
සහාය කාර්ය මණ්ඩලය

# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

## 2.1 ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ. මෙම ප්‍රතිපත්තියට අනුව 2022 වර්ෂයේ වැඩසටහන් සැලසුම් කිරීම, දේශන සඳහා පුහුණුකරුවන්ගේ සංචිතයක් නිර්මාණය කිරීම, ප්‍රතිපත්තිය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම,දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම සහ ප්‍රගතිය නියාමනය කිරීම සිදු කරයි.

## 2.2 ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.

ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම මඟින් ලංකාවේ සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉහළ ගුණාත්මකභාවයකින් පවත්වාගෙන යාම සහතික කිරීම මෙහි අරමුණ වේ.

## 2.3 ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම

ළමා අපයෝජනයන්ට අදාල තොරතුරු, වීඩියෝ සාක්ෂි පටිගත කිරීමට අදාල තොරතුරු, පොලිස් ස්ථානවලට වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ අවදානම් සහගත ළමුන් පිළිබඳ තොරතුරු ඇතුලත් ජාතික දත්ත පද්ධතිය සකස් කර ඇත. මේ වන විට පරීක්ෂණ මට්ටමේ පවතී.

## 2.4 ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන්.

ළමුන්ට එරෙහිව හිංසනය වැළැක්වීම සඳහා සහ ආගමික ස්ථානවල දී ළමයින්ට සිදුවිය හැකි සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, මෙහි මූලික අරමුණ වේ. පළාත් මට්ටමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ සම්පත්දායක කණ්ඩායම් සකස් කිරීම,මාර්ගෝපදේශයක් සකස් කිරීම සහ ආගමික නායකයින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි

## 2.5 පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පවුර)

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම අරමුණු වේ. මෙහිදී 2011/ අංක 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන සිදු කරනු ලබයි.

## 2.6 පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය භානාපති ජාතික වැඩසටහන"

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ශිෂ්‍ය නායකයින් දැනුවත් කිරීම ඔස්සේ පාසල තුළ ළමා අපයෝජන සිදුවීම් අවම කර ගැනීම සහ වළක්වා ගැනීමට ශිෂ්‍ය නායකයින්ගේ දායකත්වය ලබාගැනීම මෙහි අරමුණු වේ. එමෙන්ම ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම බලාපොරොත්තුවයි, මෙහිදී ළමා ආරක්ෂාව සඳහා ශිෂ්‍ය නායකයින් තීන්දු තීරණ ගැනීම සඳහා සහභාගී කරවා ගැනීම සිදු කරයි. ලංකාවේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පිරිවෙන්, පුද්ගලික සහ අන්තර්ජාතික පාසල්වල ශිෂ්‍ය නායකයන්/ නායිකාවන් මණ්ඩල භාර ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ප්‍රමුඛ කරගනිමින් මෙම වැඩසටහන පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබයි. වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව සිදු කරන අතර,මේ වන විට පාසල් ලියාපදිංචිය ආරම්භ කර ඇත.

## 2.7 පාසල් සඳහා ළමා මනෝවිද්‍යාව සහ මනෝ සමාජයීය වැඩසටහන

"ශික්ෂා" අත්පොත භාවිතා කරමින් ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් පාසල් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන සිදු කරයි. දිරිය වැඩසටහන යටතේ වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජයීය මැදිහත්කරණය ලබා දීම කරනු ලබයි.

## 2.8 හදිසි ආපදා අවස්ථා වලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන.

හදිසි ආපදා තත්ත්වයන්හි දී ළමා ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීම උදෙසා සුදුසු ළමා ආරක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙහි මූලික අරමුණ වේ. එසේම ළමුන් සඳහා හදිසි සහන ලබාදීම ද සිදු කරයි.

## 2.9 ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයට ගොදුරුවූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම.

ළමා අපයෝජන, විවිධ සමාජයීය හා ආර්ථික ගැටළු හේතු කොට වින්දිත, ආන්තික, ආනාරක්ෂිත අවදානම් හා ඇස නොගැටෙන ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා මෙම වැඩසටහන සිදුකරයි.

## 2.10 ළමා සංවර්ධන මධ්‍යස්ථාන

ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියළු ආගමික හා පුණ්‍ය ආයතන අනෙක් පෞද්ගලික ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. ඒ අනුව දීප ව්‍යාප්තව ඇති එම ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝ සාමාජයීය නිලධාරීන් හා ප්‍රාදේශීය නිලධාරීන් සහ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි .

**2.11 ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, දින සැමරුම් සහ සිදුවීම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, නිල වෙබ් අඩවිය, මුහුණු පොත, YouTube සහ Twitter පවත්වාගෙන යාම ඇතුළු සන්නිවේදන වැඩසටහන්**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමට අදාළ තොරතුරු සංවර්ධනය කිරීම සහ ඒවා භාවිතා කරමින් ප්‍රජාව දැනුවත් කිරීම මෙහි මූලික අරමුණ වේ. ඒ අනුව, මුද්‍රිත හා විද්‍යුත් මෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම මඟින් දැනුවත් කිරීම හා ප්‍රචාරණය සිදුකෙරේ.

**2.12 විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම.**

ළමා අපයෝජනවලින් වින්දිත වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සම්බන්ධව විශේෂ විමර්ෂනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව සිදු කරයි.

**2.13 ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම.**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත් වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ( රාගම) ළමා පියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක මඟින් ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදු කරයි.

**2.14 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය සහ 1929 ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ යෙදවුමේ මෙහෙයුම් සහ නඩත්තුව සිදු කිරීම.**

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම පැය 24 පුරා වසරේ දින 365 ම සිදු කරයි.

**2.15 ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජයීය උපකාර සේවාව.**

වින්දිත ළමුන් ප්‍රමාණය අවම කිරීම හා ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැළැක්වීම, අධ්‍යාපනය, කායික හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමගින් ළමා

කේන්ද්‍රීය මනෝ සමාජයීය සහයන් ළමයින්ට ලබා දීම දිස්ත්‍රික් මනෝ සමාජයීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් මඟින් සිදු කරනු ලබයි.

### 2.16 වෘත්තිකයන් සඳහා මනෝ සමාජයීය පුහුණු ලබාදීම සහ IEC මෙවලම් ආදිය සකස් කිරීම.

ළමා ආරක්ෂාව සම්බන්ධ කටයුතු කරන වෘත්තිකයන්ගේ දැනුම යාවත්කාලීන කරමින් වින්දිතභාවයට පත් ළමුන් නැවත ප්‍රතිසාධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

### 2.17 ළමා ආරක්ෂාව පිළිබඳ අවදානමට ලක්වන ප්‍රජාව සහ ළමා කණ්ඩායම් සඳහා විශේෂ වැඩසටහන

අවදානමට ලක්වන ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙහිදී විගමනික ශ්‍රමිකයින්ගේ ළමුන්, වතු ප්‍රජාවගේ ළමුන් ආදී කණ්ඩායම්වල ආරක්ෂාව තහවුරු කිරීමට විවිධ ප්‍රජාව සමග වැඩකටයුතු කරයි.

### 2.18 ළමා ආරක්ෂාව පිළිබඳ සම්පත් පුස්තකාලය සංවර්ධනය කිරීම.

උපරිම ගුණාත්මකභාවයකින් යුතුව තොරතුරු සේවා හා තොරතුරු මූලාශ්‍ර ලබා දෙමින් ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ සඳහා සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීම සහ ආයතනයේ නිලධාරීන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.ළමා ආරක්ෂාව, ළමා සංවර්ධනය, නීතිය, මනෝ විද්‍යාව හා ළමා අයිතීන් ආදී විවිධ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්වලට අදාළ දැනුම වර්ධනය කිරීම මේ යටතේ අපේක්ෂිතය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය විවිධ ළමුන්, පර්යේෂකයන්, විශ්වවිද්‍යාල සිසුන් හා ආයතන දැනුම ලබා ගැනීම සඳහා භාවිතා කරයි.

### 2.19 කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත් වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම.

සුනාමි ව්‍යසනයෙන් වින්දිතභාවයට පත්වූ ළමුන්ගේ භාරකාරීත්වය පරීක්ෂාවට ලක්කරමින් ළමුන්ගේ උපරිම යහපත තහවුරු කෙරෙන භාරකාරීත්වය හා රැකවරණය සඳහා නිර්දේශ සැපයීම සහ සැමට අධ්‍යාපනය යන තිරසර තේමාව යටතේ සුනාමි ව්‍යවසනයෙන් වින්දිත, ආන්තික හා අනාරක්ෂිතභාවයට පත්වූ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම හා ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

### 2.20 ළමා ආරක්ෂණයට අදාළ තාක්ෂණික විෂයයන් පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන (CPD)

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුම සහ කුසලතා පිරි කාර්ය මණ්ඩලයක් ඇති කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

# 3. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම | 0.675 | 0.215 | වැඩමුළු 02 වැඩසටහන් 03 | වැඩමුළු 02 | 54 |
| 02 | ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම. | 0.400 | 0.040 | CDCC ප්‍රතිපත්තිය | රැස්වීම් 8 ක් පවත්වා ඇත. ළමා දිවා සුරුකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2022.08.16 දින කැබිනට් අනුමැතිය ලැබී ඇත. | ලංකාවේ සියලුම ළමා දිවා සුරුකුම් මධ්‍යස්ථානවල ළමුන්. |
| 03 | ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම | 0.500 | 0.000 | දත්ත පද්ධතිය | ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කර ඇත. ඊට අදාල වැඩි දියුණු කිරීම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් යාවත්කාලීන කරමින් සිටී. | වින්දිත, ආන්තික, අවදානම් සහගත සහ අනාරක්ෂිත සියලුම ළමුන් |
| 04 | ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන්. | 4.000 | 0.809 | වැඩසටහන් 250 | වැඩසටහන් 02 | 161 |
| 05 | පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පච්ච) | 2.000 | 1.224 | SCPC අත්පොත සකස් කිරීම කමිටු වැඩසටහන් 500 | මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් පිළිබඳ අත්දැකීම් හුවමාරු වැඩසටහනක් පැවැත්විණි. දිස්ත්‍රික්ක 16 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක් සඳහා මුදල් යොමු කර ඇත. | 83 |
| උප එකතුව | | **7.575** | **2.288** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 06 | පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන | 0.500 | 0.000 | වැඩසටහන් 25 | "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන සඳහා පාසල් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත. ලියාපදිංචි වන පාසල් සමග වැඩසටහන සිදු කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත. | |
| 07 | පාසල් සඳහා ළමා මනෝවිද්‍යාව සහ මනෝ සමාජීය වැඩසටහන | 1.250 | 0.062 | ප්‍රතිලාභීන් 100<br>දින 2 ToT වැඩසටහන, පළාත් වැඩසටහන් 9, පාසල් ප්‍රජා වැඩසටහන් 8 | ToT වැඩසටහන අවසන්. පළාත් වැඩසටහන් 02 ක් අවසන්. | 80 |
| 08 | හදිසි ආපදා අවස්ථා වලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන. | 0.500 | 0.300 | සිද්ධි අනුව | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. 20,000/- බැගින් දිස්ත්‍රික්ක 25කට මුදල් යොමු කර ඇත. | - |
| 09 | ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයට ගොදුරුවූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම. | 4.000 | 0.464 | ළමුන් 1000 | ළමුන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. | 330 |
| 10 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය | 0.500 | 0.276 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය - 369<br>දැනුවත් කිරීම් - පළාත් 7<br>නියාමනයෙන් පසු දැනුවත් කිරීම් -320 | පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන් 7 ක් පවත්වා ඇත. ළමා සංවර්ධන මධ්‍යස්ථාන 320 ක් නියාමනය කිරීම කිරීම ආරම්භ කර ඇත. | 308 |
| **උප එකතුව** | | **6.750** | **1.102** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 11 | ළමා ආරක්ෂණ මාධ්‍ය ව්‍යාපාරය,IEC මෙවලම් සංවර්ධනය, දින සැමරුම් සහ සිදුවීම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, NCPA නිල වෙබ්, මුහුණු පොත, YouTube සහ Twitter පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සන්නිවේදන වැඩසටහන් | 1.000 | 0.774 | මාධ්‍ය ව්‍යාපාරය 01, ශාරීරික දඬුවම් පිළිබඳ පෝස්ටරය 01, දින සැමරුම් 04, වෙබ් නඩත්තුව, සමාජ මාධ්‍ය නඩත්තුව | ප්‍රවෘත්ති නිවේදන- 9<br>ජන මාධ්‍ය සාකච්ඡා - 55<br>ප්‍රදර්ශන සහ ජංගම සේවා -1<br>නිලවෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී. YouTube නාලිකාව, Twitter සහ FB පිටුව යාවත්කාලීන කරන ලදී. ළමා අපචාර සහ අපයෝජන වාර්තා කිරීම සම්බන්ධ දෛනික පුවත්පත් නියාමනය IEC මුද්‍රිත ද්‍රව්‍ය දිස්ත්‍රික්ක 25 ට බෙදා අවසන්.<br><br>"සිතුවිලි සිත්තම" - 2022 සමස්ත ලංකා චිත්‍ර ,පෝස්ටර් සහ කාටූන් තරඟාවලියේ අවසන් විනිශ්චය සිදු කර ජයග්‍රහයකයින් තෝරා අවසන් කර ඇත. | පුද්ගලයන් 64 දෙනෙකු සඳහා තොරතුරු සැපයීම<br><br>සමස්ත ලංකා ජයග්‍රාහකයන් – 55<br>( රන් -19, රිදී - 18, ලෝකඩ - 18)<br>දිස්ත්‍රික් ජයග්‍රාහකයන් - 737<br>( රන් - 285, රිදී - 234, ලෝකඩ - 218) |
| 12 | විශේෂ විමර්ශන, විමර්ශන අධීක්ෂණය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නිරීක්ෂණ, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නිරීක්ෂණ සිදුකිරීම. | 2.500 | 2.780 | සිද්ධි 1000 | විශේෂ පොලිස් විමර්ශන ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 1947ක් සම්පූර්ණ කර ඇත, (මහාධිකරණ 877,මහේස්ත්‍රාත් අධිකරණ 1137 ) නීති ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 34ක් සම්පූර්ණ කර ඇත. 968 දෙනෙකුට නීති සහය ලබාදී ඇත. සයිබර් ආවේක්ෂණ පැමිණිලි 123ක් ලැබී ඇත. | |
| 13 | ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම. | 1.000 | 0.505 | සිද්ධි 100<br>ඒකක 3 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීම 132, අධිකරණ නියෝග මත සාක්ෂි පට නිකුත් කිරීම 102ක් යතුරු ලියන පිටපත් නිකුත් කිරීම 170ක් සිදු කර ඇත. වීඩියෝ සාක්ෂි ලබාදීම සඳහා මහාධිකරණවල පෙනී සිටීම 40 සිදු කර ඇත. නව වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමා පියස පරිශ්‍රයේ විවෘත කර ඇත. | |
| උප එකතුව | | **4.500** | **4.059** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 14 | 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය සහ 1929 ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ යෙදවුමේ මෙහෙයුම් සහ නඩත්තුව සිදු කිරීම. | 0.500 | 0.174 | සිද්ධි 10,000 | 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත පැමිණිලි 6976ක් ලැබී ඇත.<br>1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත ඇමතුම් 86,756 ක් ලැබී ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබී ඇති මුළු පැමිණිලි ගණන 7553 කි. | |
| 15 | ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය උපකාර සේවාව. (NCCPSS) | 0.600 | 0.255 | ගාල්ල සහ අම්පාර නියමු වැඩසටහන්<br>මනෝ සමාජයීය සහාය ලබාදීම සිද්ධි 175ක් සඳහා | ගාල්ල දිස්ත්‍රික්කයේ ළමයෙකුට වෛද්‍ය ආධාර සැපයීමට සහ අවශ්‍ය මනෝ සමාජීය ආධාර සැපයීම සඳහා 4000/- මුදල් අත්තිකාරමක් ලබා දී ඇත. වීඩියෝ සාක්ෂි සඳහා පැමිණි පිරිමි ළමයින් 9 දෙනෙකුට මනෝ සමාජීය සහාය ලබා දී ඇත. | මනෝ සමාජීය මැදිහත්කරණය ළමුන් - 584<br>මනෝ සමාජීය සහය ළමුන් 34 (ගැහැනු - 22 පිරිමි 12 )<br>ළමුන් සම්බන්ධ පසු විපරම් - 432<br>වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන් සූදානම් කිරීම - 36 |
| 16 | වෘත්තිකයන් සඳහා මනෝ සමාජීය පුහුණු ලබාදීම සහ IEC මෙවලම් ආදිය සකස් කිරීම. | 1.450 | 0.094 | ළමා අපයෝජන ප්‍රතිසංවිධාන විෂය මාලාවේ පොත් 500ක් මුද්‍රණය | ළමා අපයෝජන ප්‍රතිසාධන විෂය මාලාවට (Child Abuse Recovery Curriculum) අදාළ දෙමළ පරිවර්තන සහ සිංහල පරිවර්තනය සම්පූර්ණ කර ඇත. | - |
| උප එකතුව | | **2.550** | **0.523** | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 17 | ළමා ආරක්ෂාව පිළිබඳ අවදානමට ලක්වන ප්‍රජාවන් සහ ළමා කණ්ඩායම් සඳහා විශේෂ වැඩසටහන. | 2.500 | 0.408 | වැඩසටහන් 100 | විගමණික ශ්‍රමිකයින්ගේ ළමුන්ගේ ආරක්ෂාව සඳහා NISD විසින් "පවුල් රැස්වීම්" වැඩසටහන් - 01 ළමා වෙළඳාම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - 01 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් - 01 නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් - 03 සහ වතු අංශය සඳහා වැඩසටහන් - 04 | |
| 18 | ළමා ආරක්ෂාව පිළිබඳ සම්පත් පුස්තකාලය සංවර්ධනය කිරීම | 0.200 | 0.000 | පුස්තකාලය නඩත්තු කිරීම | විශ්ව විද්‍යාල සිසුන්ට, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ට සහ වෙනත් අයට ළමා ආරක්ෂාව සහ අනෙකුත් ළමා සංවර්ධනය සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීමට පොත් පරිශීලනය කිරීම සඳහා පුස්තකාලය භාවිතා කිරීමට අවස්ථාව ලබාදී ඇත. | 136 |
| 19 | කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත් වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම. | 1.000 | 0.584 | ළමුන් 30 සුනාමි මණ්ඩල 05 | ළමුන් 2 දෙනෙකුට රු. 3500/= , ළමුන් 17 දෙනෙකුට රු. 5000/= බැගින් එක් (1 ) ළමයෙකුට රු. 8000/= අධ්‍යාපනික ආධාර ලෙස මාසිකව ලබාදීමට කටයුතු කර ඇත. අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල සුනාමි භාරකාර ඇගයීම් මණ්ඩල 02 ක් පවත්වන ලදී. | ළමුන් 20 |
| 20 | ළමා ආරක්ෂණයට අදාළ තාක්ෂණික විෂයයන් පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන (CPD) | 1.000 | 0.196 | ඉල්ලීම් මත පදනම්ව | රාගම සහ කරාපිටිය වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක සඳහා බඳවාගත් නිලධාරීන් සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් දෙදෙනෙකු සඳහා ධාරිතා සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම. | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් 18 |
| උප එකතුව | | **4.700** | **1.188** | | | |
| මුළු එකතුව | | **26.075** | **9.160** | | | |

# 7.2.7 ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

## දැක්ම

ශ්‍රී ලාංකික ජන සමාජය උදෙසා තීක්ෂණ, සංවේදී හා විශ්වාසයෙන් යුතු කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත්වීම.

## මෙහෙවර


සිය බුද්ධිය ද ශක්තිය ද උපරිම හා යහපත් ලෙස භාවිත කරමින් ස්ව ශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකීය කාන්තා පරපුරක් සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීමට විධිමත් සංවිධාන රාමුවක් ඔස්සේ සැලසුම් සහගත වූ දැනුවත් බව ලබා දෙමින් සිදු කෙරෙන සමාජීය හා ආර්ථික බලගැන්වීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම.

## 1. ප්‍රධාන කාර්යභාරය

1. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන් ද සමාජයීය වශයෙන් ද බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ ඇගයීම.
2. සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂීතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
3. කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජයීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජාමූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීම.

## සංවිධාන ව්‍යුහය

### ආයතනික කාර්යය මණ්ඩලය




සංවර්ධන නිලධාරි (24)

වනිතා සංවර්ධන නිලධාරී (1 )

වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර (1 )

උපදේශන නිලධාරී (1)

උපදේශන සහකාර (2)

කළමණාකාර සේවා නිලධාරී (1)

පුස්තකාල සහකාර (01)

කාර්යාල කාර්ය සහයක (3)

### දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්

සංවර්ධන නිලධාරී (361)

උපදේශන සහකාර නිලධාරී (278)

උපදේශන නිලධාරී(11)

වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර (119)

<u>මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය</u>

රැකවරණ මධ්‍යස්ථානය පාලිකා (01)

රැකවරණ මධ්‍යස්ථානය රියැදුරු (01)

රැකවරණ සහකාර මධ්‍යස්ථානය පාලිකා (01)

උපදේශන මධ්‍යස්ථානය තුළ කාර්යාල කාර්ය සහයක

### කාන්තා සංවිධාන ජාලය





# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**වැය ශීර්ෂය 1 - ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම**

## 01. ගෘහ මූලික කාන්තාවන් සඳහා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම.

ගෘහ මූලික කාන්තාවන් ව්‍යාපෘති ගැන්වීම හා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම, ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම, ගෘහ මූලික කාන්තාවන්ට හා එම පවුල්වල සාමාජිකයින්ට ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායක වීමට හා ඒවායේ ප්‍රතිලාභ ලබාගැනීමට ඇති ඉඩකඩ ලබාදීම සිදු කෙරේ.

## 02. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගෘහමූලික කාන්තා පවුල් බලගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ඉලක්ක කර ගනිමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

මෙම මධ්‍යස්ථානය මඟින් උතුරු පළාතේ විසිරී සිටින වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් පිළිබඳ දත්ත රැස් කිරීම හා තොරතුරු බෙදා හැරීම ඵලදායී ලෙස සිදු කිරීම, උතුරු පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සිදු කිරීම සහ සම්බන්ධීකරණය, උපදේශන සේවා සඳහා යොමු කිරීම සිදු කෙරේ.

## 03. “දිරිය මංපෙත”වැඩසටහන. (දිරිය මංපෙත ව්‍යාපෘති හා කෘෂිකර්මය ආශ්‍රිත ගෘහ කර්මාන්ත)

ශ්‍රී ලංකාව පුරා විසිර සිටින ව්‍යවසායක කාන්තාවන් තම ප්‍රදේශයට ආවේණික දේශීය සම්පත් ඇසුරින් නිෂ්පාදන සඳහා යොමු කිරීමත්, ආර්ථික සවිබල ගැන්වීමේ ස්වයං රැකියා ව්‍යාපෘති සවිමත් කිරීමත් මෙමඟින් සිදු වේ. මධ්‍යම පරිමාණ ව්‍යාපෘති හා කුඩා පරිමාණ ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන යොදවා ඇත.

## 04. ධීවර කර්මාන්තය ආශ්‍රිත ගෘහ කර්මාන්තවල නියැලෙන කාන්තාවන් සවිබල ගැන්වීම.

ධීවර කර්මාන්තය බහුලව සිදු කරන ප්‍රදේශවල සේවා වියුක්තව සිටින කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ව්‍යාපෘති සඳහා ව්‍යවසායකයින් හඳුනා ගෙන ප්‍රතිපාදන ලබා දීම හා ධීවර කර්මාන්තයට අදාළ උපකරණ ලබාදීමත් මෙමඟින් සිදුකෙරේ.

## 05. පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ආපදාවන්ට පහසුවෙන් ගොදුරුවීමේ අවදානම් සහගත කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරේ. ආපදා අවස්ථාවන් කල්තියා නිවැරදිව හඳුනා ගැනීම, හානිය අවම කර ගැනීම, ක්‍රියාත්මක කළ යුතු සැලසුම් කල්තියා සකස් කිරීම පිළිබඳව මෙහිදී දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

**06. විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන.**

කාන්තාවන් රැකියා සඳහා විදේශගත වීම හේතුවෙන් ඇතිවන පවුල් බිඳ වැටීම් හා දරුවන්ගේ අනාරක්ෂිතභාවය අවම කිරීම හා විදේශගත වීමකදී ඔවුන් මුහුණපාන විවිධ හිංසන වැළක්වීම සඳහා එම කාන්තාවන් තම කුටුම්භය තුළම රැඳෙමින් ආදායම් උත්පාදන ස්වයං රැකියාවක නිරතවීම සඳහා සවිබල ගැන්වීම සිදු කෙරේ.

**07. සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම "දිවියට අරුතක්" වැඩසටහන**

සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ''දිවියට අරුතක්'' වැඩසටහන ක්‍රියාත්මක වේ. අප අමාත්‍යාංශයට පැමිණ හෝ දුක්ගැනිවිලි වශයෙන් ලිඛිතව එවනු ලබන ඉල්ලීම් සඳහා ආධාර ඉල්ලීම් ලබා දීම ද මෙමඟින් සිදු වේ.

**08. බන්ධනාගාරගත වූවන්ගේ පවුල් සඳහා සහන සැලසීමට එම පවුල් දැනුවත් කිරීම.**

බන්ධනාගාරගතවන කාන්තාවන් නිදහස් වීමෙන් පසු නැවත බන්ධනාගාර ගතවීම වළක්වාලීම සඳහා ස්වයං රැකියාවක නිරත විමට යොමු කිරීම, දීර්ඝ කාලයකට සිරගත වන ස්වාමිපුරුෂයන්ගේ බිරින්දෑවරුන්ට පවුලේ ආර්ථිකය ගොඩනංවා ගැනීමට ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට යොමු කිරීම මෙහිදී සිදුවේ.

**09. වතු අංශයේ කාන්තාවන් සවිබල ගැන්වීම.**

වතු ආශ්‍රිත සේවාවන්හි යෙදෙමින් මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමට උරදෙන කාන්තාවන්ගේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා අමතර ආදායම් මාර්ගයක් ලෙස ස්වයං රැකියාවන්හි නිරතවීමට අවස්ථාව සලසාදී ඇත.

**10. කාන්තා දින ජාතික උත්සවය හා සමගාමී විශේෂ වැඩසටහන්.**

ආරාධිතයන් 600 කගේ සහභාගිත්වයෙන් 2022 මාර්තු මස 08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී කාන්තා දින සැමරුම් ජාතික උත්සවය පැවත්විණි.

ජාතික සැමරුම් වැඩසටහනට සමගාමීව "අම්මාවරුනේ "වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදී. දිවයිනේ සියළු දිස්ත්‍රික්ක නියෝජනය කරන කාන්තා කාර්ය සංවිධානයන්හි ව්‍යවසායක කාන්තා සංවර්ධනය වෙනුවෙන් ඔවුන්ගේ නිෂ්පාදන මෙන්ම අමාත්‍යාංශය,පෞද්ගලික අංශ, රාජ්‍ය නොවන සංවිධාන හා අනුග්‍රහක ආයතනයන්හි අළෙවි කුටි හා ප්‍රදර්ශන කුටි 75 කින් සමන්විත

වෙළඳ ප්‍රදර්ශනය, වෙළඳපොළ, රූපලාවන්‍ය, ඉවුම් පිහුම්, ඡායාරූපකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි.

එමෙන්ම ප්‍රධාන වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් රැසක් ද පවත්වන ලදී. කාන්තා දිනට සමගාමීව 2022.03.18/19 දෙදින නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංචාරක හා වතු අංශයේ කාන්තාවන් සඳහා සුවනාරී සායනය හා උපදේශන වැඩසටහන පවත්වන ලදී.

## 11. වෙළඳපොළ ප්‍රවර්ධනය, කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ.

කාන්තාවන් දිරිගැන්වීම, නිර්මාණ හා නිෂ්පාදන සඳහා ප්‍රදර්ශනාත්මක වෙළඳපොළක් ඇති කිරීම හා ව්‍යවසායකත්ව අත්දැකීම් හුවමාරුව අරමුණු කරගනිමින් ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අලෙවි ප්‍රවර්ධනය සඳහා කාන්තා නිෂ්පාදන අලෙවි පොළ ක්‍රියාත්මක කෙරේ.

## 12. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීම.

සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණ වන පරිදි ලබාගත් ණය හා ණය මූලාශ්‍ර පිළිබඳවත් ඔවුන්ගේ ණය ගෙවීමේ හැකියාව ආදී තොරතුරු ලබා ගනිමින් දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. එම දත්ත පද්ධතිය තුළින් හඳුනාගත් දිස්ත්‍රික්කවල කාන්තාවන් 13 දෙදෙනකු සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර මේවන විට ලබාදී ඇත. දත්ත පද්ධතියේ පවත්නා තොරතුරු අනුව ඉදිරි සම්බන්ධීකරණ කටයුතු සහ ව්‍යාපෘති ගැන්වීම තුළින් ඔවුන්ගේ ණය ගෙවීමේ හැකියාව වර්ධනය සහ ආදායම් ඉපයීම වර්ධනය සිදු කිරිමට නියමිතය. ණය යටතේ අරඹන ව්‍යාපෘතිවල සාර්ථකත්වය ඉහළ නැංවීම, අවදානම අවම කිරීම හා කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වැඩිකිරීම ප්‍රධාන වශයෙන් සිදුකෙරේ.

## 13. ළමා නිවාසවල සිට සමාජගතවන අවු. 18 ඉක්මවූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජීවනෝපාය හා සුහසාධන පහසුකම් ලබා දීම.

මන්නාරම් දිස්ත්‍රික්කයේ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අවු. 18 ඉක්මවූ ගැහැනු ළමුන් 10 දෙනෙකු සඳහා මැහුම් පුහුණුව ලබාදීම හා උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇත.

## 14. ආබාධිත කාන්තාවන් ජීවනෝපාය සංවර්ධනය තුළින් සවිබල ගැන්වීම.

ආබාධිත බව නිසා සමාජ අනුකම්පාව පමණක් ලැබූ ආබාධිත කාන්තාවන් සමාජ හා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම තුළින් ඔවුන් ස්වයං රැකියාලාභී කාන්තාවන් ලෙස සමාජයට දායක කර ඇත.

**15. ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා කාන්තා සංවිධාන ජාලය තුළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.**

කාන්තා කාර්ය සංවිධාන කාන්තාවන්ගේ සුභසිද්ධිය හා ඔවුන් සමාජයීය හා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට අවශ්‍ය පහසුකම් සලසා දීම.

**16. ආදර්ශ ගම්මානවල කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම.**

සෑම දිස්ත්‍රික්කයකින්ම එක් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තෝරාගෙන එහි බහුලවම ආර්ථික අපහසුතා පවතින ග්‍රාම නිලධාරී වසමට අයත් වන ගම්මානයෙහි ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්විය හැකි කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ගේ විභවතාවය ඔප්නැංවෙන පරිදි කේවල හෝ කණ්ඩායම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ වේ.

**17. මාධ්‍ය හා ප්‍රචාරණ හා පුස්තකාලය පවත්වාගෙන යාම.**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා අමාත්‍යාංශය මඟින් සපයන සේවාවන් පිළිබඳ සමාජය දැනුවත් කිරීම, විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාවන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය සහ කාන්තාවන් හා ළමුන් හිතකාමී මාධ්‍ය සංස්කෘතියකට යොමු කිරීම මෙහි අරමුණයි. ඒ යටතේ, පුස්තකාලය පවත්වාගෙන යාම, කාන්තා සවිය සඟරාව සැකසීම, අත්පත්‍රිකා සහ සඟතික පත්‍ර මුද්‍රණය හා ප්‍රචාරණ කටයුතු, වනිතා සංවර්ධන නිලධාරී රාජකාරි අත්පොත මුද්‍රණය සිදු කර ඇත.

**18. ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම.**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කරන සියලු වැඩසටහන් මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය මත දිස්ත්‍රික් මට්ටමින් පසුවිපරම් ප්‍රගති සමාලෝචනය හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරන දිස්ත්‍රික් ප්‍රගති රැස්වීම් පැවැත්වීම.


**වැය ශීර්ෂය 02 - ළමා අපයෝජනය සහ කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම**

**01. කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.**

හිංසනයට හා විවිධ අපයෝජනයන්ට ලක් වූ කාන්තාවන් හා අවු. 18 ට අඩු ළමා වින්දිතයින් හට තාවකාලිකව රැකවරණය ලබාදීම සිදුකරනු ලබයි. රැකවරණ මධ්‍යස්ථාන 07ක් කොළඹ, මාතර, ගම්පහ, රත්නපුර, යාපනය, මුලතිව් හා මඩකළපුව යන දිස්ත්‍රික්ක තුළ පිහිටුවා ඇත. උසාවි, පොලීසි හා රෝහල් මඟින් මෙම මධ්‍යස්ථානයන් වෙත යොමුකරනු ලබන සේවාලාභීන් හට උපදේශනය ලබාදෙමින් අවශ්‍ය තාවකාලික රැකවරණය ලබා දී සුරක්ෂිතව සමාජගත කිරීමට කටයුතු කිරීම මෙහි දී සිදු වේ.

**02. උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.**

පවතින සමාජ සංකීර්ණතාව සහ විවිධ හේතූන් මත මානසික පීඩාවන්ට, ආතතීන්ට හෝ මානසික ව්‍යාධීන්ට ගොදුරු වන සේවාලාභීන් සඳහා උපදේශනය සැපයීම සඳහා කළුතර, අනුරාධපුරය, මොණරාගල, නුගතලාව, කුරුණෑගල, රත්නපුර, කටුනායක, කෑගල්ල, මාතර, ගාල්ල, ගම්පහ, මහනුවර යන ප්‍රදේශයන්හි ස්ථාන 12 ක ස්ථාපිත කර ඇති උපදේශන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය මූලික පහසුකම් සපයමින් පවත්වාගෙන යාම මෙහිදි සිදු වේ.




2022 **ප්‍රතිලාභීන් හා සේවාලාභීන් සංඛ්‍යාව (ඉහත වැය ශීර්ෂ දෙකටම අදාළව)**

# 3. 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

01. කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
02. නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයන්ට විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
03. නීරෝගී දරුවෙකු බිහි කිරීම, මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මඟ පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම/ කුසලතා හා කාලය ලබා දීම සඳහා ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.
04. පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් අතර කාන්තා දායකත්වය වර්ධනය කිරීම.
05. දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
06. රැකියාවට නොයන කාන්තාවන් විවිධ ව්‍යවසායන්ට යොමු වීම සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා ව්‍යාපාරික පුහුණුව හා වෙළඳපොළ සම්බන්ධීකරණයට නිසි ක්‍රමවේද රාජ්‍ය මැදිහත් වීමෙන් සකස් කිරීම.
07. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන ලබා දීම.
08. හඳුනා නොගත් වෙළඳපොළ හඳුනාගැනීම සහ ආර්ථික කටයුතුවලදී ග්‍රාමීය කාන්තාවන්ගේ දායකත්වය වැඩිදියුණු කිරීම.

# 4. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

**වැය ශීර්ෂය 1 - ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම -** 403-02-03-007-2509

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | ගෘහ මූලික කාන්තාවන් සඳහා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරිම. | 4.000 | 1.534 | ව්‍යාපෘති 70, ප්‍රතිලාභීන් 70 | ව්‍යාපෘති 33 (ව්‍යාපෘති 07 ප්‍රතිපාදන-රු.මි. 0.809 යැවීම) | 33 |
| 2. | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගෘහ මූලික කාන්තා පවුල් බලගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ඉලක්ක කර ගනිමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 1.000 | 0.000 | ව්‍යාපෘති 3, ප්‍රතිලාභීන් 8 | ප්‍රතිලාභීන් හඳුනා ගෙන මූලික දැනුවත් කිරීම සිදුකර අවශ්‍යතා හඳුනාගෙන තිබේ. | - |
| 3. | දිරිය මංපෙත වැඩසටහන. | 20.000 | 8.070 | ව්‍යාපෘති 79, ප්‍රතිලාභීන් 634 | ව්‍යාපෘති 38 (ව්‍යාපෘති 16 ප්‍රතිපාදන රු.මි. 4.799 යැවීම) | 259 |
| 4. | ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්තයට කාන්තාවන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0.500 | 0.000 | ව්‍යාපෘති 16, ප්‍රතිලාභීන් 16 | ව්‍යාපෘති 2 ක් සඳහ ප්‍රතිපාදන රු.මි. 0.1 ක් යැවීම | - |
| 5. | ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (කාන්තා කාර්යය සංවිධාන සඳහා) | 0.300 | 0.088 | දැනුවත් කිරීම 37 ක්, ප්‍රතිලාභීන් 1850 | දැනුවත් කිරීම 11 ක් පැවැත්වීම. | 547 |
| 6. | ගෘහසේවය සඳහා විදේශගත වන කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1.500 | 0.400 | ව්‍යාපෘති 38 , ප්‍රතිලාභීන් 38 | ව්‍යාපෘති 8. (ව්‍යාපෘති 03 ප්‍රතිපාදන-රු.මි. 0.120 ක් යැවීම) * | 10 |
| 7. | විශේෂිත හේතූන් මත සමාජ සංවේදීතාව අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබලගැන්වීම. ( " ජීවිතයට අරුතක් ") | 1.500 | 0.454 | ව්‍යාපෘති 30 ප්‍රතිලාභීන් 30 | ව්‍යාපෘති 8 පැවැත්වීම. ( ව්‍යාපෘති 1 ප්‍රතිපාදන-රු.මි. 0.04 ක් යැවීම)* | 8 |
| උප එකතුව | | **28.800** | **10.546** | | | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 8. | බන්ධනාගාරගත වූවන්ගේ පවුල් සඳහා සහන සැලසීමට එම පවුල් දැනුවත් කිරීම. | 0.500 | 0.135 | ස්වයං රැකියා ව්‍යාපෘති 10 , ප්‍රතිලාභීන් 10 | ස්වයං රැකියා ව්‍යාපෘති 3 ( ව්‍යාපෘති 1 ප්‍රතිපාදන-රු.මි. 0.055 ක් යැවීම)* | 3 |
| 9. | වතු අංශයේ කාන්තාවන් සවිබල ගැන්වීම. | 1.000 | 0.240 | ව්‍යාපෘති 25, ප්‍රතිලාභීන් 25 | ව්‍යාපෘති 6 (ව්‍යාපෘති 3 ප්‍රතිපාදන-රු.මි. 0.120 ක් යැවීම)* | 6 |
| 10. | කාන්තා දින ජාතික උත්සවය හා සමගාමී ව්‍යවසායක කාන්තා සංවර්ධන විශේෂ වැඩසටහන | 1.649 | 1.605 | කළුතර, නුවරඑළිය,අනුරාධපුර දිස්ත්‍රික් වැඩසටහන් හා ජාතික උත්සවය | කාන්තා දිනට සමගාමී ව්‍යවසායක කාන්තා සංවර්ධන විශේෂ වැඩසටහන් හා ප්‍රධාන උත්සවය | 600 |
| 11. | නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් හඳුනා ගැනීම සහ දත්ත පද්ධතියක් සකස් කිරීම සහ ඔවුනට සහන සැලසීම. | 2.000 | 0.500 | දිස්ත්‍රික් 8 ක ස්වයං රැකියා ව්‍යාපෘති 40 | දිස්ත්‍රික් 1 ක ස්වයං රැකියා ව්‍යාපෘති 13 ක් | 15 |
| 12. | වෙළඳපොළ ප්‍රවර්ධනය, කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශන හා වෙළඳ පොළ පැවැත්වීම. | 0.200 | 0.040 | වෙළඳ පොළ 10, ප්‍රතිලාභීන් 500 | වෙළඳපොළ 2 | 125 |
| 13. | ආදායම් උත්පාදන පුහුණු | 0.700 | 0.363 | පුහුණු 42, ප්‍රතිලාභීන් 1050 | පුහුණු 22 පැවැත්වීම. (පුහුණු 4 ප්‍රතිපාදන-රු.මි. 0.66 ක් යැවීම)* | 555 |
| 14. | ළමා නිවාසවල සමාජගතවන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජීවනෝපාය හා සුහසාධන පහසුකම් ලබා දීම. | 1.000 | 0.000 | පුහුණු 2 හා උපකරණ ලබාදීම. ප්‍රතිලාභීන් 20 | ජුකී මැෂින් මිළදී ගැනීමට ප්‍රතිපාදන-රු.මි. 0.325 ක් යැවීම. * | - |
| 15. | ආබාධිත කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධනය හා සවිබලගැන්වීම. | 1.000 | 0.197 | ස්වයං රැකියා ව්‍යාපෘති 20, ප්‍රතිලාභීන් 20 | ස්වයං රැකියා ව්‍යාපෘති 5 | 5 |
| 16. | ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා කාන්තා සංවිධාන ජාලය තුළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 0.420 | 0.309 | වැඩසටහන් 21, ප්‍රතිලාභීන් 608 | වැඩසටහන් 9 , ව්‍යාපෘති 2 | 303 |
| උප එකතුව | | **8.469** | **3.389** | | | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 17. | ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම. | 1.000 | 0.400 | ව්‍යාපෘති 6, ප්‍රතිලාභීන් 27 | ව්‍යාපෘති 1 | 5 |
| 18. | කාන්තා දින සමගාමී විශේෂ වැඩසටහන් | 0.166 | 0.130 | වැඩසටහන් 12 | සුවනාරී වැඩසටහන් 5 ක්, උපදේශන වැඩසටහන් 4 ක් පැවැත්වීම. කාන්තා දින සමගාමී වැඩසටහන් - (නුවරළිය හා කළුතර) | 400 |
| 19. | 2021 හා 2022 වර්ෂයේ වැඩසටහන් වියදම් (අක්මුදල් නොමැති 2021 හා 2022 අතැති බිල්පත් සඳහා) | 4.564 | 3.568 | ව්‍යාපෘති, වැඩසටහන් හා පුහුණු | ව්‍යාපෘති 10 ක් පැවත්වීම, ජංගම අලෙවි කුටි 7 ක් ලබාදීම, කාන්තා සංවර්ධන වැඩසටහන් 1 ක් පැවත්වීම හා ලිපි ද්‍රව්‍ය වියදම් | 57 |
| 20. | මාධ්‍ය හා ප්‍රචාරණය | 2.500 | 0.661 | පුස්තකාලය පවත්වාගෙන යාම, මාධ්‍ය කටයුතු | පුවත්පත්, සඟරා,පොත්, කාන්තා දින කාන්තා සවිය සඟරා 1000 | - |
| 21. | අධීක්ෂණය,පසු විපරම සහ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය. | 0.500 | 0.029 | දිස්ත්‍රික් ප්‍රගති රැස්වීම් 51 හා අධීක්ෂණය සහ පසු විපරම් රැස්වීම් 1 | දිස්ත්‍රික් ප්‍රගති රැස්වීම් 11 , කොළඹ,කළුතර, ගම්පහ අධීක්ෂණ සහ පසු විපරම් 3 ක් (දිස්ත්‍රික් 5 සඳහා ප්‍රතිපාදන-රු.මි. 0.041 ක් යැවීම)* | 119 |
| **උප එකතුව** | | **8.730** | **4.788** | | | |
| **එකතුව** | | **46.000** | **18.723** | | | |

**වැය ශීර්ෂය 2 - ළමා අපයෝජනය සහ කාන්තාවන්ට එරෙහි හිංසනය වැළක්වීම (403-02-03-004-2509)**

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1 | පවතින කාන්තා රැකවරණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම (07) ගම්පහ, රත්නපුර, කොළඹ, මාතර, මඩකලපුව, යාපනය, මුලතිව් | 14.660 | 1.195 | මධ්‍යස්ථාන 7 ක සුළු වියදම් හා ආරක්ෂක දීමනා | මධ්‍යස්ථාන නඩත්තු වියදම් | 14 | - |
| 2 | උපදේශන මධ්‍යස්ථාන නඩත්තු කිරීම (12) | 1.302 | 0.725 | මධ්‍යස්ථාන 12 ක නඩත්තු වියදම් (සුළු වියදම් හා බදු කුලී) | මධ්‍යස්ථාන 12 ක නඩත්තු වියදම් | 550 | - |
| 3 | **2021 වර්ෂය සඳහා** අතැති බිල් | 1.981 | 1.981 | | | | |
| එකතුව | | **17.943** | **3.901** | | | 564 | |

*

1. ව්‍යාපෘතිය අදාළ කාර්තුව තුළ කිරීමට නොහැකි වී ඇත. දිස්ත්‍රික්කයෙන් ප්‍රතිපාදන ආපසු පවරා ඇත.

2. දිස්ත්‍රික්කය තුළ අක්මුදල් නොමැතිවීම නිසා ව්‍යාපෘතිය අදාළ කාර්තුව තුළ කිරීමට නොහැකි වී ඇත.

3. 2022 අගෝස්තු මාසය තුළ නිකුත් කළ චක්‍රලේඛයට අනුව අත්‍යාවශ්‍ය නොවන සහ නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

# 7.2.8 ජාතික කාන්තා කමිටුව

1993 වසරේ දී ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද කාන්තා ප්‍රඥප්තියෙහි අන්තර්ගත විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම සඳහා 1993 මාර්තු 08 වැනි දින ජාතික කාන්තා කමිටුව ස්ථාපිත කරන ලදී.

### දැක්ම

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක්

### මෙහෙවර

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහාය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.

## 1. ප්‍රධාන කාර්යභාරය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇති වන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි භාර ගැනීම, සංනිරීක්ෂණය හා ඒවා අදාළ පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කිරීම.
- කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සංනිරීක්ෂණය, අදාළ පාලක බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබාගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථාව සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්තිවලින් ඇතිවන බලපෑම ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා/ ඇමතිනිය විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයැයි කමිටුව සිතන කටයුතු කිරීමට උපදෙස් දීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පැවරී ඇති ව්‍යාපෘතීන් හා ක්‍රියාකාරකම් දියත් කිරීම.

## 1.1 පැමිණිලි මධ්‍යස්ථානය

1999 දී මෙම මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර, ස්ත්‍රී පුරුෂභාවය මත ඇති වන වෙනස්කම්, අසාධාරණකම් සහ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීමත් එම පැමිණිලි විමර්ශනය කොට විසඳුම් ලබා දීමේ කාර්යය සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්හි දී නීති ආධාර, උපදේශන සේවා ඇතුලු සහන සැලසීමත් මෙහි කාර්යභාරය වේ.
පැමිණිලි මධ්‍යස්ථානය වෙත පැමිණ, ලිපි මඟින්, විද්‍යුත් තැපැල හා දුරකථන ඇමතුමක් මඟින් කාර්යාල වේලාවන් තුළ දී පැමිණිලි භාරදීමට හැකියාව ඇත.

## 1.2 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව

1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය ඒකාබද්ධව කාන්තා හිංසන, අසාධාරණකම්, වෙනස්කම්, අයිතිවාසිකම් කඩවීම්, ලිංගික අතවර හා සයිබර් අපරාධ ඇතුලු විවිධ පැමිණිලි සඳහා සහන සේවා සැපයේ.
මුලින් කාර්යාල වේලාව තුළ පමණක් ක්‍රියාත්මක වූ 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව සතියේ දින 07 හිම පැය 24 පුරා ක්‍රියාත්මක කිරීම 2020 මාර්තු මස 23 දින ආරම්භ කරන ලදී.
මෙම දුරකථන සේවාව නීති නිලධාරියෙකු, උපදේශන නිලධාරීන් තිදෙනෙකු සහ පැමිණිලි සෘජුවම භාර ගන්නා නිලධාරීන් 11 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලබයි. එම කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම, මෙහෙයුම් කමිටුවක් මඟින් සිදු කරන අතර පසුවිපරම් සිදු කිරීම ද ඉහත නිලධාරීන් විසින්ම සිදු කරයි.

එමෙන්ම සාර්ක් සංවර්ධන අරමුදලෙහි දායකත්වයෙන් මෙම සේවාව නව තාක්ෂණය යොදා ගනිමින් කාර්යක්ෂම හා නවීන මෘදුකාංග සහිත පරිගණකගත සේවාවක් බවට පත් කර ඇත.

# 2. ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

## 2.1 ප්‍රතිපත්තිමය වැඩසටහන්

### 2.1.1 ප්‍රතිපත්තිමය සාකච්ඡා

- **ජාතික කාන්තා කමිටුව රජයේ නීතිගත ආයතනයක් බවට පත් කිරීම**

ජාතික කාන්තා කමිටුව, කාන්තා කොමිසමක් බවට පත් කිරීම සඳහා කැබිනට් තීරණයක් ලබා ගෙන ඇති අතර, එම කාර්යය දැනට ආරම්භ කර ඇත.

- **ජාතික කාන්තා කමිටු මාසික රැස්වීම**

ජාතික කාන්තා කමිටුවේ විද්වත් කමිටුව මසකට වරක් පවත්වන කමිටු රැස්වීමේ දී සාමාජිකයන්ගේ අදහස් හා යෝජනා අනුව ගනු ලබන තීරණ අනුව ප්‍රතිපත්ති සම්පාදනය කරන අතර, 2022 අගෝස්තු මස දක්වා රැස්වීම් වාර 05 ක් පවත්වා ඇත. ඒ සඳහා රු.මි. 0.253 ක් වැය කර ඇත.

- **තරුණ මව්වරුන් සඳහා නම්‍යශීලී වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය සාකච්ඡාව**

වර්තමාන න්‍යෂ්ටික පවුල්වල රැකියාවට යන මව්වරුන්ගේ දරුවන් රැකබලා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම රජය වශයෙන් අනිවාර්යයෙන්ම කළ යුතුය. මෙම වැඩසටහනින් වැඩකරන මවගේ මානසික ආතතිය අවම කිරීම, රැකියා ඵලදායීතාවය ඉහළ නැංවීම, දරුවාට ආරක්ෂාව, රැකවරණය ලබාදීම අරමුණු කෙරේ.
විද්වත් මණ්ඩලයකගේ සහභාගීත්වයෙන් සාකච්ඡා පවත්වා ඔවුන්ගේ අදහස් හා යෝජනා මඟින් ප්‍රතිපත්තිය සැකසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ අනුව, දැනට සාකච්ඡා වට දෙකක් පවත්වා ඇති අතර අවශ්‍ය දත්ත සහ තොරතුරු අනුව ඊළඟ සාකච්ඡා වටයේ දී ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.2 කාන්තා හිංසනය පිටුදැකීමේ වැඩසටහන්

### 2.2.1 ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන්

- **"පළමු පාසල මව් කුසයි" වැඩසටහන් මාලාව**

2022 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව "පළමු පාසල මව් කුසයි" වැඩසටහන කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉත්තැපාන විහාරස්ථානයේ දී 2022.03.21 දින පැවති අතර, ඒ සඳහා ගර්භණී මව්වරු 120 දෙනෙකු සහභාගී විය.
ගර්භනී මව්වරුන් උදෙසා ආගමික වැඩසටහන් හා ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය ඇති කිරීම උදෙසා සංගීතමය වැඩසටහනක් මෙන්ම ගැබිනි මව්වරුන් සඳහා උපකරණ කට්ටල බෙදා දීමක් ද මෙහිදී සිදුකර ඇත.

මෙහි දෙවන වැඩසටහන පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පීකොක් හෝටලයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන කොටස් දෙකක් වශයෙන් පවත්වන ලද අතර එහි පළමු වැඩසටහන වශයෙන් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) අනුග්‍රහයෙන් ගැබිනි මාතාවන් 100 සහභාගී කර ගනිමින් සංගීත චිකිත්සක වැඩසටහනක් සහ උපකරණ කට්ටල බෙදා දීමක් සිදු කරන ලදී. මෙම වැඩසටහනේ දෙවන කොටස ලෙස විවාහ වීමට අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී.

## 2.3 උද්දේශන/ දැනුවත් කිරීම් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන්

### 2.3.1 පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම

- **කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධව ක්‍රියා කිරීමේ දී පොලිස් නිලධාරීන් සංවේදී කිරීම**

පොලිස් නිලධාරීන් සංවේදී කිරීම තුළින් හිංසනයට පත් කාන්තාවන් කෙරෙහි යහපත් ආකල්පමය වෙනසක් ඇතිකර ඔවුන්ට ඵලදායී සේවයක් ලබාදීම අරමුණ කර ගනිමින් ගෘහස්ථ හිංසන පනත හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්ප කෙරෙහි පොලිස් නිලධාරීන් සංවේදී කිරීම සිදු කෙරේ.

පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක්, 1938 උපකාරක දුරකථන සේවය සඳහා වැඩිපුරම ගෘහස්ථ හිංසන පැමිණිලි වාර්තා වූ දිස්ත්‍රික්කයක් වන කළුතර දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි 2022.03.22 දින පවත්වන ලදී. පොලිස් ස්ථානාධිපතිවරුන් හා පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ ස්ථානාධිපතිවරුන් අමාත්‍යාංශයේ විෂය පථයට සම්බන්ධ වන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත නිලධාරීන් හා 1938 නිලධාරීන් ඇතුළත්ව පුද්ගලයන් 100 දෙනෙකු මේ සඳහා සහභාගී විය.

ගෘහස්ථ හිංසන පනත පිළිබඳව සහ එහි ප්‍රායෝගික පැතිකඩ පිළිබඳව, ''කාන්තාව, නීතිය හා පොලිස් සේවයේ භූමිකාව'', කාන්තා හිංසනය සම්බන්ධව පොලිස් නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳව ආදී වැදගත් කරුණු රාශියක් පිළිබඳව මෙම වැඩසටහනේ දී දැනුවත් කිරීම සිදු විය.

### 2.3.2 පොදු ප්‍රවාහනයේ දී සිදුවන හිංසනයන් අවම කිරීමේ වැඩසටහන්

- **'සැමට සුන්දර ගමනක්'** වැඩසටහන් මාලාව

2022 වර්ෂයේ දී මෙම වැඩසටහන එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) පූර්ණ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් පළමු කාර්තුව තුළ යාපනය දිස්ත්‍රික්කයේ දී සාර්ථකව පැවැත්විණි.

යාපනය දිස්ත්‍රික්කයේ බස්රථ හිමිකරුවන්ට, රියැදුරු මහතුන්ට හා කොන්දොස්තර මහතුන්ට පොදු ප්‍රවාහන සේවාවන්වල දී කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීම මෙහිදී සිදුවිය.

"සැමට සුන්දර ගමනක්" උද්දේශන වැඩසටහන 2022 මාර්තු 24 වන දින යාපනය ප්‍රධාන බස් නැවතුම කේන්ද්‍ර කරගනිමින් දියත් කරන ලදී.

එහිදී යාපනය ප්‍රධාන බස් නැවතුමේ හා ඒ අවට සිටින මගීන්, මහජනයා දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා බෙදා හරිමින් හා බස්රථවල ස්ටිකර් අලවමින් පොදු ප්‍රවාහන සේවාවන්වල දී ගමන් ගන්නා විට කාන්තාවන්ට සිදුවන හිංසනයට එරෙහි වීමට අවශ්‍ය සවිබල ගැන්වීම සිදු කරන ලදී.

- **පළාත් පාලන ආයතන නියෝජිතයින් දැනුවත් කිරීම**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. එහි පළමු වැඩසටහන 2022.01.15 වන දින ගිරිතලේ පොළොන්නරුව Deer Park හොටල් පරිශ්‍රයේ දී පවත්වන ලදී. එහිදී කාන්තා සංවේදීතාවය පිළිබඳව හා 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව සම්බන්ධයෙන් ද පළාත් පාලන සභිකයින් දැනුවත් කරනු ලැබිණි.

## 2.4 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීමේ විශේෂ වැඩසටහන (සාර්ක් සංවර්ධන අරමුදල)

### 2.4.1 කාන්තා උපකාරක දුරකථන සේවාවේ නියුතු නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා හා උපදේශන පාඨමාලා සඳහා පුහුණු අවස්ථා ලබා දීම.

හිංසනයට පත් කාන්තාවන්ට සහන සැලසීම වඩාත් ඵලදායී කිරීම අරමුණු කර ගනිමින් 1938 කාන්තා උපකාරක දුරකථන සේවයේ නිරත නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම හා ධාරිතා සංවර්ධනය මෙහිදී සිදු කරයි. විශේෂයෙන් උපදේශන කාර්ය ධාරිතාව ප්‍රවර්ධනය සඳහා උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට යොමු කරන ලද අතර වර්තමානය වන විට නිලධාරීන් 10 දෙනෙක් මෙම පාඨමාලාව හදාරා නිමකර ඇත.

### 2.4.2 හිංසනයට පත් කාන්තාවන් සඳහා කාන්තා රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම

කාන්තා රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට නියමිත ඉඩමෙහි පස් සම්බන්ධ පරීක්ෂණය, මැනීම් කටයුතු හා ඉඩම් අමාත්‍යාංශයට පවරා ගැනීමේ කටයුතු හා ගොඩනැගිලි සැලැස්ම ද අනුමත කර අවසන්ය.

මෙම යෝජිත කාන්තා රැඳවුම් මධ්‍යස්ථාන ගොඩනැගිලි සැලැස්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය මගින් සකස් කරවා ගෙන ඇත. ගොඩනැගිලි සැලැස්මට අදාළ ඇස්තමේන්තුව කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මගින් සකස් කර ඇති අතර එය අමාත්‍යාංශ ලේකම් හා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට සාර්ක් ව්‍යාපෘතිය මගින් මුදල් ප්‍රතිපාදන ලබාදෙන අතර එම ප්‍රතිපාදන ලැබී නැත.

# 3. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2022.09.30

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය රු.මි. | මූල්‍ය ප්‍රගතිය රු.මි. | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | ජාතික කාන්තා කමිටුව රජයේ නීතිගත ආයතනයක් බවට පත් කිරීම - කාන්තා කොමිෂන් සභාව පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම | 0.050 | – | කැබිනට් පත්‍රිකාව සකස් කිරීම | අවශ්‍ය නෛතික කටයුතු සිදු කරමින් පවතී. | - |
| 2 | **ප්‍රතිපත්ති සම්පාදනය** | | | | | |
| | i. තරුණ මව්වරුන් සඳහා නම්‍යශීලි වැඩ පරිසරයක් ඇති කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාකච්ඡා පැවැත්වීම | 0.015 | 0.005 | සාකච්ඡා | සාකච්ඡා වට දෙකක් පවත්වා නිර්දේශ ලබා ගෙන ඇත. | තරුණ මව්වරුන් |
| | ii. විදේශගතවන කාන්තාවන්ගේ ආර්ථිකය හා පවුල් සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම | | | ප්‍රතිපත්තිය සකස් කිරීම | සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව වාර්තාව සකසමින් පවතී | විදේශගතවන කාන්තාවන් |
| 3 | ජාතික කාන්තා කමිටු රැස්වීම් පැවැත්වීම | 0.530 | 0.253 | සාකච්ඡා 08 | සාකච්ඡා 05ක් පවත්වා ඇත | |
| 4 | i."සතුටු පවුල" ව්‍යාපෘතිය - සමීක්ෂණය සිදු කිරීම | 2.000 | - | සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම | සමීක්ෂණයේ මූලික වැඩ ආරම්භ කර ඇත | |
| | ii. දත්ත පද්ධතිය පදනම් කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුරක්ෂිත නියාමක කණ්ඩායම් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම | | | අනාරක්ෂිත පවුල් අධීක්ෂණය | හඳුනාගත් පවුල් ආශ්‍රිතව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩසටහන් සංවිධානය කරමින් පවතී | |
| | iii. සංගීත, නාට්‍ය, ක්‍රීඩා ඇතුළත් ප්‍රජා වැඩසටහන් නිර්මාණය ග්‍රාමීය වශයෙන් ක්‍රියාත්මක කිරීම මඟින් හිංසන පිටුදැකීමට ප්‍රජාව දිරිමත් කිරීම | | | වැඩසටහන් 01 | | |
| | iv. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීමට ක්‍රියා කිරීම | | | නව ව්‍යාපෘති හඳුන්වා දීම | | |
| | v. වින්දිත කාන්තාවන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා යොමු කිරීම | | | නව ව්‍යවසායන් සඳහා කාන්තාවන් යොමු කිරීම | | |
| | vi. වැඩිහිටි හා ආබාධිත කාන්තාවන්ට සුභසාධන පහසුකම් සැපයීම හා ආර්ථික සුරක්ෂිතතාවය සඳහා ක්‍රියා කිරීම | | | සුභසාධන පහසුකම් සැපයීම | | |
| | උප එකතුව | 2.595 | 0.258 | | | |

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය රු.මි. | මූල්‍ය ප්‍රගතිය රු.මි. | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | **කාන්තාවන්ට එරෙහිව සිදු වන සියලුම ආකාරයේ හිංසනයන් පිටු දැකීම සඳහා වන අන්තර්ජාතික දින 16, ජාත්‍යන්තර කාන්තා දින ඇතුලු ජාත්‍යන්තර දින හා සමගාමී වැඩසටහන් සිදුකිරීම** | | | | | |
| 5 | ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් සිදු කිරීම | 0.500 | 0.470 | ‘පළමු පාසල මව්කුසයි’ වැඩසටහන කළුතර හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම. | වැඩසටහන අවසන් කර ඇත | 220 |
| 6 | අන්තර්ජාතික දින 16 වැඩසටහන | 0.600 | – | කාන්තා හිංසනය අවම කිරීම හා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම. | 11/25 සිට 12/10 දක්වා වූ කාල සීමාව තුළ වැඩසටහන් පැවැත්වීමට නියමිතව ඇත. | |
| 7 | **මාධ්‍ය වැඩසටහන් සිදු කිරීම** | | | | | |
| | i."කාන්තා ප්‍රබෝධය" ගුවන්විදුලි වැඩසටහන් | 0.200 | _ | වැඩසටහන් 05 | ගිවිසුම් පත්‍රය අත්සන් කර ඇති අතර පටිගත කිරීම් සිදු කරමින් පවතී. | සමස්ත කාන්තාවන් |
| 8 | **දැනුවත්කිරීමේ වැඩසටහන් සිදු කිරීම** | | | | | |
| | i.කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධව ක්‍රියා කිරීමේදී පොලිස් නිලධාරීන් සංවේදී කිරීමේ වැඩසටහන් | 0.800 | 0.319 | වැඩසටහන් 02 | කළුතර දිස්ත්‍රික්කයේ වැඩසටහනක් පවත්වන ලද අතර දෙවන වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්යේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. | 100 |
| | ii.ජාතික තරුණ සේවා සභාව හා ඒකාබද්ධව ලිංගික අධ්‍යාපනය (ප්‍රජනන සෞඛ්‍ය) පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීම. | 0.100 | _ | ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීම. | වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කයේ පැවැත්වීමට සූදානම් කර ඇත. | තරුණ ප්‍රජාව |
| | iii. උපකාරක පන්ති ඇතුලු උසස් අධ්‍යාපන ආයතන ළමුන් දැනුවත් කිරීම. | 0.150 | _ | වැඩසටහන් 01 | ඇස්තමේන්තුව ගෙන්වා ගැනීම සඳහා ප්‍රා.ලේ කාර්යාල වෙත ලිපි යොමු කර ඇත. | සියලුම ළමයින් |
| | iv. පූර්ව විවාහ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0.200 | _ | ගෘහ ජීවිතය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. | වියදම් ඇස්තමේන්තුව ගෙන්වා ගැනීම සඳහා නාවිවදුව ප්‍රා.ලේ කාර්යාල වෙත ලිපි යොමු කර ඇත. | විවාහ අපේක්ෂිත ප්‍රජාව |
| | v. වින්දිත කාන්තාවන්ගේ කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0.100 | _ | කාන්තාව ආර්ථික වශයෙන් හා සමාජයීය වශයෙන් ශක්තිමත් කිරීම. | ව්‍යාපෘති වාර්තාව ගෙන්වා ගැනීම සඳහා ත්‍රිකුණාමලය ප්‍රා.ලේ කාර්යාල වෙත ලිපි යොමු කර ඇත. | වින්දිතභාවයට පත් කාන්තාවන් |
| | vi.සේවා ස්ථානයන්හි සිදු වන ප්‍රචණ්ඩත්වයට එරෙහිව නැගී සිටීම පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම | 0.250 | _ | වැඩසටහන් 01 | ඇස්තමේන්තු ගෙන්වා ගැනීම සඳහා ප්‍රා.ලේ කාර්යාලවලට ලිපි යොමු කර ඇත. | |
| | උප එකතුව | 2.900 | 0.789 | | | |

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය රු.මි. | මූල්‍ය ප්‍රගතිය රු.මි. | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | vii. විගාමික කාන්තාවන්ගේ පවුල්වල ළමුන් දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම (කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ) | 0.100 | – | වැඩසටහන් 01 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රා.ලේ කාර්යාලයේ 2022.10.22 හා 24 දෙදින වැඩසටහන පැවැත්වීමට සංවිධානය කර ඇත. | |
| | viii. වතු අංශයේ කාන්තාවන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම | 0.350 | – | වැඩසටහන් 03 | වැඩසටහන ඔක්තෝබර් මාසයේ පැවැත්වීමට සැලසුම් කර ඇත | |
| | ix. 1938 නිලධාරීන්ගේ ධාරිතා පුහුණු හා ආතති කළමනාකරණ වැඩසටහන | 0.150 | – | 1938 නිලධාරීන්ගේ සේවාව ඵලදායි කිරීම හා කාර්යක්ෂම කිරීම | වැඩසටහන් සංවිධානය කරමින් පවතී | |
| 9 | **කාන්තා දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම** | | | | | |
| | i. පාර්ලිමේන්තු හා පළාත්සභා මැතිවරණයන්හි දී කාන්තාවන් සඳහා කෝටාවක් ලබා දීමට කටයුතු කිරීම | – | – | අදාළ පාර්ශවයන් සමහ සාකච්ඡා පැවැත්වීම | මැතිවරණවලදී කාන්තාවන්ට වැඩි නියෝජනයක් ලබා දීම සඳහා දේශපාලන පක්ෂ දැනුවත් කර ඇත | සියලුම කාන්තාවන් |
| | ii. පළාත් පාලන ආයතන නියෝජිතයින් දැනුවත් කිරීම | 0.010 | 0.009 | වැඩසටහන් 01 | පළමු වැඩසටහන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවත්වන ලදී | 150 |
| | වෙනත් වියදම් | 0.395 | – | | | |
| | උප එකතුව | 1.005 | 0.009 | | | |
| | **මුළු එකතුව** | **6.500** | **1.056** | | | |

## UNFPA ප්‍රතිපාදන යටතේ ජාතික කාන්තා කමිටුව ක්‍රියාත්මක කළ වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය රු.මි. | මූල්‍ය ප්‍රගතිය 2022.09.30 දිනට රු.මි. | භෞතික ඉලක්කය | වැඩසටහනේ වර්තමාන තත්ත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | අඩු වයස් ගැබ් ගැනීම් හා අවිවාහක මවුවරුන්ගේ ආරක්ෂිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම | 0.022 | _ | ප්‍රතිපත්තිය සකස් කිරීම | වැඩසටහන සංවිධානය කරමින් පවතී | |
| 2 | පොදු ප්‍රවාහනයේදී සිදුවන ලිංගික හිරිහැර වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ "සැමට සුන්දර ගමනක්" උද්දේශන ව්‍යාපාර පැවැත්වීම. | 0.509 | 0.156 | උද්දේශන ව්‍යාපාර හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පළමු වැඩසටහන යාපනය දිස්ත්‍රික්කයේ පවත්වන ලදී දෙවන වැඩසටහන බදුල්ල දිස්ත්‍රික්කයේ පැවැත්වීමට සැලසුම් කර ඇත | |
| 3 | කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධව ක්‍රියා කිරීමේ දී පොලිස් නිලධාරීන් සංවේදී කිරීමේ වැඩසටහන් | 0.600 | _ | වැඩසටහන් -02 | ඔක්තෝම්බර් 14 රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩසටහන පැවැත්වීමට සූදානම් කර ඇත. | |
| 4 | අන්තර් ජාතික දින 16 වැඩසටහන | 0.384 | _ | | නොවැම්බර් 25 සිට දෙසැම්බර් 10 දක්වා වූ කාල සීමාව තුළ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. | |
| | එකතුව | **1.515** | **0.156** | | | |